

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2024

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
UNIVERSITY GRANTS COMMISSION

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

හතලිස් හයවන වාර්ෂික වාර්තාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු



දැක්ම

වඩාත් යහපත් ශ්‍රී ලංකාවක් / ලෝකයක් සඳහා දැනුමෙන් නායකත්වය සැපයීම



මෙහෙවර

සමාජ, පාරිසරික සහ මූල්‍යමය වශයෙන් ඉලක්ක ජය ගැනීමට උනන්දුවක් දක්වන දැනුමැති නායකයින් බිහිකිරීමට, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ශක්තිමත් සම්බන්ධීකරණ පද්ධතියක් තුළින් ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ, ගුණාත්මක ඉගැන්වීම් සහ කර්මාන්ත කටයුතුවල නියැලීමට සහ උසස් තත්ත්වයේ ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට පහසුකම් සලසාදීමට අවශ්‍ය කළමනාකරණය සහ යහපාලනය ඇති කිරීම.



අරමුණු

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට ප්‍රවේශය සමානව වැඩි කිරීම.
- 21 වන සියවසේ පූරවැසියෙකු සඳහා අවශ්‍ය යැයි සැලකෙන සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙනුම් කටයුතු වල නියැලීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුලින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතින්වල විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක මානව සම්පත්, විශිෂ්ඨ පහසුකම් සහ තිරසාර/හරිත සංකල්ප හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රමිතිය සහතික කිරීම.
- ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශවකරුවන්ගේ සබඳතා හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ මෙම පරිවර්තනීය අවධියේ දී, නව රජය ජාතියේ වර්ධනය සඳහා ඉදිරි දැක්මක් සකස් කිරීමත් සමඟ, උසස් අධ්‍යාපනයේ අනාගතය හැඩගැස්වීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) කැපවී සිටී. තිරසාර සංවර්ධනය, ආර්ථික ප්‍රතිසාධනය සහ නවෝත්පාදනය කෙරෙහි රජය දක්වන අවධානය, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරණය සහ යහපාලනය පෝෂණය කිරීමේ අපගේ මෙහෙවර සමඟ බාධාවකින් තොරව එකිනෙක පෙළගස්වයි.

බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ පර්යේෂණ, ගුණාත්මක ඉගැන්වීම් සහ අර්ථවත් කර්මාන්ත පුහුණුවලින් යුත්, ඉහළම ගුණාත්මකභාවයෙන් සපිරි උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය අධ්‍යාපනයක් සැපයීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කැපවී සිටී. රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන (HEIs) සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම මගින්, අපගේ අරමුණ වන්නේ අධ්‍යාපනික වශයෙන් පමණක් නොව, ආර්ථික, පාරිසරික සහ සමාජීය ප්‍රගතියට දායක වීමට දැඩි උනන්දුවක් දක්වන දැනුමැති නායකයින් පෝෂණය කිරීමයි.

මෙම වසරේ දී, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, සිසුන්ගේ සුභසාධනයට සහාය වීම සහ වේගයෙන් වෙනස් වන ලෝකයක ඉල්ලීම් සපුරාලීම සඳහා විෂයමාලා වැඩිදියුණු කිරීම ආදියෙන් අපි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත්තෙමු. සිසුන් සඳහා ඇති අවස්ථා පුළුල් කිරීමට සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ධනාත්මක දායකත්වයක් ලබා දීමට සන්නද්ධ උපාධිධාරීන් පෝෂණය කිරීමට අප දරන උත්සාහයන් පිළිබඳව අපි ආඩම්බර වන්නෙමු.

අපි ඉදිරියට යන විට, අපගේ විශ්වවිද්‍යාල අධ්‍යයන විශිෂ්ටත්වයේ මධ්‍යස්ථාන කිරීම පමණක් නොව, ජාතික හා ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා ක්‍රියාකාරී දායකයින් ද වන බව සහතික කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමු. ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කල් පවතින බලපෑමක් ඇති කරන නවෝත්පාදන හා තිරසාර පරිසරයක් නිර්මාණය කරමින්, රජයේ ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීමට අපගේ සිසුන්, අධ්‍යාපනඥයින් සහ ආයතන බල ගැන්වීම අපි අඛණ්ඩව සිදු කරන්නෙමු.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න
සභාපති

පටුන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු i
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය ii
පටුන iii
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව [UGC].....
හැඳින්වීම v
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය v
විධායක සාරාංශය v
වගු ලැයිස්තුව xiii
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන xvi
01 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය 01
02 විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය..... 03
03 ආයතන 07
04 මණ්ඩප 08
05 විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම 09
06 අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම 20
07 මූල්‍ය පරිපාලනය 27
08 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව 35
09 මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය 38
10 තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු (QAC) 48
11 තොරතුරු තාක්ෂණ සහාය 52
12 නීති කටයුතු 59
13 විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)..... 61
14 මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු 62
15 ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම් 64
16 ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්වය 67
17 විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලබා දීම 70
18 විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම 74
19 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල 82
20 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල 86
21 2024 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි 89
22 යටිතල පහසුකම් සංවර්ධනය..... 92
23 ශිෂ්‍ය කටයුතු සහ සුබසාධන අංශය 93
24 පර්යේෂණ සහ සංවර්ධන අංශය 93
25 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024..... 94
26 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024..... 119
27 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024..... 135
28 තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව - 2024..... 147

29 **ඇමුණුම්**

I. විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2023/2024 168
සාමාන්‍ය ප්‍රවේශය යටතේ හා විශේෂ ප්‍රවේශයන් යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව..... .....

II. විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2023/2024 175
සාමාන්‍ය ප්‍රවේශය සහ විශේෂ ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලාවන් සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව
[පීඨය අනුව දීප ව්‍යාප්ත කුසලතා සහ දිස්ත්‍රික්ක පදනම මත තෝරාගත් සිසුන් සංඛ්‍යාව].....

III. විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2023/2024 178
සාමාන්‍ය සහ විශේෂ ප්‍රවේශ යටතේ විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව
[දිස්ත්‍රික් සහ පාඨමාලා අනුව වර්ගීකරණය]..... .....

30 කෙටි යෙදුම්..... 188

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ මග පෙන්වීම හා සම්බන්ධීකරණය සඳහා කටයුතු කරන ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) 1978 දෙසැම්බර් 22 වන දින අංක 16 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් අතරට උසස් අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතනවලට මුදල් වෙන් කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම නියාමනය හා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් සියලුම රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා සහාය වීම අයත් වේ.

සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු දෛනිකව පරිපාලනය කිරීම හා කොමිෂන් සභා රැස්වීම්වල සභාපතිත්වය දැරීම සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය හා අනුකූලනය පිණිස වෙන් කරන ලද රාජකාරී හා කාර්යයන් සහිත දෙපාර්තමේන්තු, අංශ හා ඒකක ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 17ක්, පශ්චාත් උපාධි ආයතන 10ක්, ආයතන 7ක් හා 1ක් මධ්‍යස්ථානයක් ඇතුළත් වේ. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ. විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධානයන් ප්‍රකාරව කොමිෂන් සභාව පහත අරමුණු සමඟ ස්ථාපනය කොට ඇත:

1. ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.
3. උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
4. උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලනය නියාමනය කිරීම.
5. එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරී සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාව, 2024 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් සමාලෝචනය කරයි. සමාලෝචිත වර්ෂයේ මූලික වැදගත් අවස්ථා සහ ජයග්‍රහණයන්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුලත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය,

කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතිකකරණය, මූල්‍යමය පරිපාලනය හා කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගිත්වය හා පර්යේෂණ සහයෝගිත්වය යන ක්ෂේත්‍රයන් යටතේ සාරාංශ කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලැස්ම සමඟ 2024 වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි දක්වා ඇති ඉලක්ක, අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI), රට තුළ පැන නගින අපේක්ෂා හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කර ගත් ආර්ථිකයෙහි මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගන්නා ලදි.

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කරන ලද අතර 2024 ජනවාරි මස පවත්වන ලද අ.පොස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා 2024 ජුනි 14 සිට 2024 ජූලි 05 දක්වා අපේක්ෂකයින්ගෙන් මාර්ගගතව අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව, සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කර කඩඉම් ලකුණු 2024 සැප්තැම්බර් 20 දින නිකුත් කරන ලදී. 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර එය 2025 දී අවසන් කිරීමට නියමිතය.

2023/2024 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ ප්‍රධාන තොරතුරු පහත සාරාංශගත කර ඇත;

නිකුත් කරන ලද අ.පොස.(උසස් පෙළ) ප්‍රතිඵල මත පදනම්ව 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන් සංඛ්‍යාව	173,444
2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගැනීමට යෝජිත සංඛ්‍යාව	43,204
තෝරාගත් / ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව:	
(1) සාමාන්‍ය ප්‍රවේශය:	42,282
(2) විශේෂ විධිවිධාන :	20

විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කිරීම සඳහා, 2024 දී විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින පාඨමාලා ලැයිස්තුවට එක (01) නව අධ්‍යයන පාඨමාලාවක් එක් කරන ලද අතර 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා එම පාඨමාලාව පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී;

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
139	බහු අවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	50

ඊට අමතරව, 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට පවතින පාඨමාලා එකතු කර නොමැත;

අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය

උසස් අධ්‍යාපනයට පුළුල් සහභාගීත්වයක් සහ සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින්, දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව හා නව්‍යකරණය කරන ලද පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදී. මෙම ප්‍රයත්නයට සහාය දැක්වීම සඳහා, 2024 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලදී;

- නව ආයතන එකක් (01)
- නව පීඨ දෙකක් (02)
- නව අධ්‍යයන අංශ දෙකක් (02)
- නව උපාධි වැඩසටහන් දෙකක් (02)
- නව විශේෂවේදී උපාධි වැඩසටහන් හතරක් (04)
- නව පශ්චාත් උපාධි වැඩසටහන් දහයක් (10)
- නව බාහිර උපාධි වැඩසටහන් දෙකක් (02)

තවද සිසුන්ට වැඩි රැකියා අවස්ථාවන් ප්‍රමාණයක් ලබා දීම සඳහා, රටේ වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව දැනුම හා කුසලතා හඳුන්වා දෙමින් පවත්නා උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, 2024 දී අධ්‍යයන අංශ එකක (01) නම වෙනස් කිරීමක් සිදු කරන ලදී.

2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ස්ථාවර කමිටු 24 ක් ක්‍රියාත්මක වූ අතර එමඟින් විවිධ විෂය ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනයට අදාළ කරුණු පිළිබඳව කොමිෂන් සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ, මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දෙන ලද මනා කළමනාකරණ භාවිතයන් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලන හා මෙහෙයුම් කටයුතුවල සියලුම වැදගත් අංශ අධීක්ෂණය කිරීමේ අරමුණින් 2024 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, පද්ධතිය තුළ නිසි පාලනයක් සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන් අභ්‍යන්තර විගණන අංශ සමඟ නිතිපතා සම්බන්ධීකරණය වීම කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල කටයුතු කළමනාකරණය

2024 වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 321ක් වූ අතර, එයට විධායක සහ විධායක නොවන කාර්ය මණ්ඩලය අයත් වේ. 2024 දෙසැම්බර් 31 වන විට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වර්තමාන කාර්ය මණ්ඩලය 215 කි. 2024 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට විධායක ශ්‍රේණියේ සේවකයින් දෙදෙනෙකු (02), ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් දෙදෙනෙකු (02), තාක්ෂණික සහකාර (තාවකාලික) තනතුරට තිදෙනෙකු (03), කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ (ස්ථිර) තනතුරට තිදෙනෙකු (03) සහ පරිගණක ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම) තනතුරට එක් අයෙකු (01) පත් කර ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් දෙදෙනෙකු (02) සේවයේ ස්ථිර කර ඇති අතර සේවකයින් තිදෙනෙකු (03) උසස් කර ඇත.

2024 වර්ෂයේ දී, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් දෙදෙනෙකු (02) විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

2024 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වෙනත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරු දෙකක් (02) සිදු කරන ලද අතර අනෙකුත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙතින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු තුනක් (03) සිදු කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීම් හතරක් (04), විශ්‍රාම යෑම් හතරක් (04) ඉල්ලා අස්වීම් නවයක් (09) සහ තනතුර හැර යාම් දෙකක් (02) වාර්තා විය. තවද, 2024 වර්ෂය තුළ වැටුප් රහිත නිවාඩු නවයක් (09), මාතෘ නිවාඩු දොළහක් (12) සහ ඉකුත් නිවාඩු අටක් (08) ද වාර්තා වී ඇත.

කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සමඟ සහයෝගයෙන්, 2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියලුම ස්ථිර සේවකයින්ට ආකර්ශනීය සහ සාධාරණ ගාස්තුවකට පුද්ගලික ගිණුමක් මත පවුල් ආවරණයක් ලබා ගැනීමේ විකල්පය සමඟ වැඩිදියුණු කළ ප්‍රතිලාභ සහිත සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දෙන ලදී.

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය

2024 දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක සංඛ්‍යා තනතුරු දෙසිය අනූ හතරක් (294) අනුමත කරන ලදී.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පත්කිරීම්/උසස් කිරීම් සිදු කිරීමට පැවරී ඇති වගකීම යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, වසර තුළ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් හතරක් (04) සහ උසස්වීම් දාහතක් (17) සිදු කළ අතර, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මුළු ස්ථාන මාරුවීම් හැට නවයක් (69) හසුරුවා පහසුකම් සැලසීය.

2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 848 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබූ අතර එම කටයුතු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාවට නැංවේ.

1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පවරා ඇති බලතල, රාජකාරි හා කාර්යයන් ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයේ දී කොමිෂන් සභා චක්‍රලේඛ දහහතරක් (14) සහ ආයතන චක්‍රලේඛ ලිපි නවයක් (09) නිකුත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යයාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් මෙම චක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී.

විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර

ශිෂ්‍යත්ව යනු පරිත්‍යාගශීලීන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් එකඟ වන නියමයන් සහ කොන්දේසි මත පුද්ගලයන් හෝ සංවිධාන විසින් ස්ථාපිත කර ඇති සහ අනාගතයේදී ස්ථාපිත කළ හැකි ඒවා වේ. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන තෝරාගත් සිසුන්ට අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා මෙම මූල්‍ය ආධාර ලබාදේ. මුදල් අංශය සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ අංශයේ සහාය ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් දැනට ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කරයි.

විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා සහාය සහ මූල්‍යාධාර ලබා දීම

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් තරුණ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය, මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කළේය. මෙම කටයුතු මූලික වශයෙන් පර්යේෂණ හා ජාත්‍යන්තර සහයෝගීතා අංශය (DRIC) හරහා සිදු කරන ලද අතර ඒවා පහත පරිදි වේ;

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථිර සේවයේ නිරත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධාර සපයයි. මෙම ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ සියළුම අංශයන්හි අධ්‍යයන කටයුතුවල නියැලෙන්නන්ට ඔවුන්ගේ වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ ධාරිතාවය ශක්තිමත් කිරීමයි.

ප්‍රදානයේ මුළු වටිනාකම විෂය, අධ්‍යයන වැඩසටහනේ ස්වභාවය සහ වැඩසටහන පවත්වන රට අනුව වෙනස් වේ.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ඔවුන්ට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙ හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සම අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කරන ලදී.

- ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් උසුලන ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒකාබද්ධව විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණඩල සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ඒකාබද්ධ/ භින්න ආචාර්ය උපාධි වැඩසටහනක් දියත් කළේය.

- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු (PhD) සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සම අනුග්‍රාහක ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර තිබේ.

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය (RMIT විශ්වවිද්‍යාලය) අතර පර්යේෂණ පුහුණු සහයෝගීතාව (ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන) – 2024

- විදේශ හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU) / එකඟතා

  විදේශීය හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU)/ එකඟතා අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම - රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අවබෝධතා ගිවිසුම් (MoU)/ එකඟතා අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා තත්‍ය කාලීන ඩිජිටල් පුවරුව (Real- time digital dashboard) යොදා ගැනීම.

තොරතුරු තාක්ෂණ සහාය

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතික් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා /පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2024 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම සහ පවතින පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා සහ පිරිවිතරයන් සැකසීම, මෘදුකාංග ඇතුළු පරිගණක පද්ධතියේ සහ ජාලයේ සමස්ත පරිපාලනය, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා සෞඛ්‍ය සම්පන්න අඛණ්ඩ පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වන ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම්, LK Domain Registry සමඟ සම්බන්ධීකරණය කිරීම.
- වෙබ් අඩවි පරිපාලනය සහ නඩත්තු කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.
- සාර්ථක ප්‍රතිඵල ලබා දීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ආවරණය කිරීමට, යෙදවුම් සංවර්ධන කණ්ඩායම සහ සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම.
    - කෙටි පණිවුඩ සහ රජයේ තොරතුරු මධ්‍යස්ථානය (1919 ඇමතුම් මධ්‍යස්ථානය) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ක්‍රියාකාරකම්.
    - කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික ශ්‍රේණි තනතරුවල උසස්වීම්වලට අදාළ මාර්ගගත අයදුම්පත් සඳහා රජයේ කෙටි පණිවුඩ (GovSMS) සේවාව.
    - විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය - 2023/2024 අධ්‍යයන වර්ෂය
    - මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය - 2023/2024 අධ්‍යයන වර්ෂය
- ICTA සමඟ එක්ව මාර්ගගත ගෙවීම් ද්වාරයේ ක්‍රියාවලිය පරිපාලනය සහ සම්බන්ධීකරණය.
- වෙබ් ද්වාරය, රැස්වීම් ශාලා වෙන් කිරීමේ පද්ධතිය, පිරිස් අංශය සඳහා සේවකයින්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන eHRM පද්ධතිය, සේවක උසස් වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ පද්ධතිය, ඉ-තොග සහ මාර්ගගතව වාහන වෙන්කරවා ගැනීමේ අයදුම්පත වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ නව සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියට අදාළ විද්‍යුත් තැපෑල උපස්ථ (email backups) පවත්වා ගෙන යාම සහ ඔවුන්ගේ ඉල්ලීම අනුව ඒවා ප්‍රවේශ අංශයට භාරදීම.
- 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා වෙබ් අඩවිය හරහා අවම කඩඉම් ලකුණු නිකුත් කිරීමට මාර්ගගත යෙදවුමක් සකස් කිරීම.
- මෘදුකාංග සංවර්ධන
    - කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියේ උසස්වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය
    - කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත්කිරීම සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය.
    - නියෝජ්‍ය ලේකම්/නියෝජ්‍ය ලේඛකාධිකාරී, නියෝජ්‍ය ගණකාධිකාරී/නියෝජ්‍ය මූල්‍යාධිකාරී, සහ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරු සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය
    - ප්‍රේරණ පුහුණු වැඩසටහන සහ වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය
    - ගබඩා කළමනාකරණ පද්ධතිය
    - නීති සහ ප්‍රලේඛන අංශය සඳහා ගොනු බෙදා හැරීමේ පද්ධතිය
    - වාහන වෙන්කරවා ගැනීමේ මාර්ගගත අයදුම්පත
    - විශ්වවිද්‍යාලය සඳහා මාර්ගගතව ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේ අයදුම්පත
- ජාල සහ දෘඪාංග ක්‍රියාකාරකම්
    - තාක්ෂණික සහාය සහ උපකාර
    - ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්
    - නඩත්තු කිරීම් සහ ප්‍රලේඛන

කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කටයුතු සහ සහාය

2024 දී, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2023 හා සම්බන්ධ එක් වැදගත් ප්‍රකාශනයක්/වාර්තාවක් අවසන් කරන ලද නමුත් තවමත් UGC වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර නොමැති අතර (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදි. මෙම කාල සීමාව තුළ සම්පූර්ණ කරන ලද විශේෂ පැවරුම් විස්සක් (20) ක් භාර දෙන ලදී.

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) කටයුතු

2024 වසර, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට අභියෝගාත්මක වර්ෂයක් විය. මෙම වසර අවසාන වීමට පෙර සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක මෙන්ම 2023, 2022 සහ 2021 වර්ෂවල නිම කිරීමට ශේෂව තිබූ කාර්යයන් බොහොමයක් විය.

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය හට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් විසින් සහය දක්වන අතර තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුවේ මඟ පෙන්වීමද හිමිවේ. ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2024 දෙසැම්බර් 31 වන විට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ ප්‍රගතිය පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම
- පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශ සංවර්ධනය කිරීම
- ආයතනික සමාලෝචන පැවැත්වීම (IRs)
- වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (PRs)
- ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 ට අනුකූලව සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/ සාධාරණත්වය (GEE), ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) සහ විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන වල නවකවදය

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධත්වයට සහ වෙනස්කම්වලට සංවේදී වන හිතකර ඉගෙනුම්/සේවා පරිසරයක් ප්‍රවර්ධනය කිරීමට පිහිටුවන ලදී. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාවන් හි අසමානතා අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රියාකාරකම්වල නිරත වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබිඹු කිරීම සඳහා පැමිණිලි ද්වාරය ප්‍රතිව්‍යුහගත කරන ලදී.

- වත්මන් වෙබ් අඩවියට සංශෝධන සිදු කරමින් පවතී
- Rage.lk සමඟ පවත්වන ලද රැස්වීම.
- වැඩිදියුණු කළ විශ්වවිද්‍යාල ආරක්ෂණ ප්‍රොටෝකෝල සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය උපකුලපතිවරුන්, විනය පාලකවරුන් සහ ශිෂ්‍ය විනය පාලකවරුන් හමුවිය.
- සාර්ථකත්වය මැනීම සඳහා වන මිනුම් ඇතුළුව කෙටි කාලීන සහ දිගු කාලීන අරමුණු විස්තර කරන පුළුල් උපායමාර්ගික සැලැස්මක් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථ, නය සඳහා සම්පූර්ණ කරන ලදී.

වගු ලැයිස්තුව



වගු අංකය	නම	පිටුව අංකය
5.1.1	සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්කර ගැනීම්	10-14
5.2	2023/2024 අධ්‍යයන වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා	14
5.4.(අ)	අන්ධ හා කායික අශක්නතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම	15
5.4.(ආ)	විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	15-17
5.4.(ඇ)	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම	17
5.4.(ඉ)	සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම	18



වගු අංකය	නම	පිටුව අංකය
6.1(අ)	2024 දී පැවැත්වූ ස්ථාවර කමිටු රැස්වීම් ගණන	20-21
6.1(ආ)	2024 දී පැවැත්වූ ඒකාබද්ධ ස්ථාවර කමිටු රැස්වීම් ගණන	22
6.2.1	2024 වර්ෂයේ අනුමත පීඨ	22
6.2.2	2024 වර්ෂයේ අනුමත අධ්‍යයන අංශ	22
6.2.3	2024 වර්ෂයේ අනුමත කරන ලද ආයතන	23
6.2.4	2024 වර්ෂයේදී අනුමත කරන ලද නව ප්‍රථම උපාධි වැඩසටහන්	23
6.2.5	2024 වර්ෂයේ දී අනුමත කරන ලද විශේෂවේදී උපාධි වැඩසටහන්	23
6.2.6	2024 වර්ෂයේ දී අනුමත කරන ලද නව පශ්චාත් උපාධි වැඩසටහන්	24
6.2.7	2024 වර්ෂයේදී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්	24
6.2.8	2024 වර්ෂයේ දී අනුමත කරන ලද ප්‍රථම උපාධි වැඩසටහන්වල සුදුසුකම්වලත් අවශ්‍යතා සඳහා ප්‍රතිව්‍යුහගත / සංශෝධනය කරන ලද බාහිර උපාධි වැඩසටහන්	25
6.3.1	2024 වර්ෂයේ දී අනුමත කරන ලද අධ්‍යයන අංශවල නම වෙනස් කිරීම්	25
6.3.2	2024 වර්ෂයේ දී අනුමත කරන ලද අධ්‍යයන අංශ බෙදීම	25

වගු අංකය	නම	පිටුව අංකය
7.2	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම භාවිතය	29
7.2.1	පුනරාවර්තන ප්‍රදානය (RBG)	29
7.2.2	ප්‍රාග්ධන ප්‍රදාන (CBG)	30
7.2.3	අයවැය යෝජනා – 2024	30
7.4	විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය - 2020 සිට 2024 දක්වා	31-32
7.5	මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීම	32
7.6	31.12.2024 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව	33
7.7	මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය	34

වගු අංකය	නම	පිටුව අංකය
8	2024 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා තොරතුරු	35
8.3	වර්ෂය තුළ වාර්තා කර ඇති නිවාඩු ලබා ගැනීම් ගණන	36

වගු අංකය	නම	පිටුව අංකය
9.1(අ)	උසස්වීම්	38-39
9.1(ආ)	උසස් වීම් (*APER පරිපාටිය*)	40
9.2 (අ)	අනෙකුත් කාර්ය මණ්ඩල ශ්‍රේණිවලට සිදු කරන ලද පත්වීම්	41
9.2 (ආ)	අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණි සඳහා සිදු කළ උසස්වීම්	41
9.5.i.(අ)	2024 වසර සඳහා නව සේවක සංඛ්‍යාව - කාණ්ඩ අනුව	42
9.5.i.(ආ)	උසස් අධ්‍යාපන ආයතනයන් හි අනුමත සේවක සංඛ්‍යාව	42-43
9.5.ii (අ)	උසස් අධ්‍යාපන ආයතනයන් හි අනුමත සේවක සංඛ්‍යාව - කාණ්ඩය අනුව	43
9.5.ii(ආ)	උසස් අධ්‍යාපන ආයතන අනුව	44
9.7	සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු කිරීම	45
9.8(අ)	දැන්වීම් මඟින් පූරප්පාඩු කැඳවන ලද මහාචාර්ය තනතුර (විඥාපක මහාචාර්ය)	45
9.8(ආ)	සහාය මහාචාර්ය/මහාචාර්ය තනතුරට උසස් කිරීම (කුසලතා අනුව)	45
9.8(ඇ)	නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට උසස් කිරීම (කුසලතා අනුව)	46
9.8(ඈ)	කථිකාචාර්ය (ආධුනික)/ කථිකාචාර්ය (ස්ථිර නොකළ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I තනතුරට බඳවා ගැනීම/ උසස් කිරීම	46-47
9.9(අ)	කථිකාචාර්ය (ආධුනික) තනතුර	47
9.9(ආ)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණියේ තනතුර	47

වගු අංකය	නම	පිටුව අංකය
10.3.1	අභ්‍යන්තරව පිරිනමන උපාධි වැඩසටහන් පිළිබඳ වැඩසටහන් සමාලෝචන	49
10.3.2	බාහිර උපාධි වැඩසටහන් **(EDP)** සමාලෝචන පැවැත්වීම	50

වගු අංකය	නම	පිටුව අංකය
14.5	අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය – 2024	63

වගු අංකය	නම	පිටුව අංකය
17.2	වෙනත් ක්‍රියාකාරකම්	70-72

වගු අංකය	නම	පිටුව අංකය
19.1	විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රධාන මූල්‍ය තොරතුරු	82
19.2	2024.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල	84

වගු අංකය	නම	පිටුව අංකය
20.1	මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය– විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	86
20.2	2024.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	88

වගු අංකය	නම	පිටුව අංකය
21 (ඇ)	**කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි** - 2024	89-90
21(ආ)	**ආයතන චක්‍රලේඛ ලිපි** 2024	90-91

වගු අංකය	නම	පිටුව අංකය
22	නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති	92

වගු අංකය	නම	පිටුව අංකය
23	විශ්වවිද්‍යාලය අනුව වර්ගීකරණය කරන ලද ඉල්ලීම්වල සාරාංශය	93

නි.ලේ. – නියෝජ්‍ය ලේකම්
ජ්‍යෙ.ස.ලේ. – ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ. – සහකාර ලේකම්
නි.ග. – නියෝජ්‍ය ගණකාධිකාරී
ජ්‍යෙ .ස.ග. – ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී
ම.ස.නි. – මහජන සම්බන්ධතා නිලධාරි
මා.ස. – මානව සම්පත්
ය.ප.ස.අ. – යටිතල පහසුකම් සංවර්ධන අංශය
ත.ආ.ක. – තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය
නී. හා ප්‍ර. – නීති හා ප්‍රලේඛණ
සැ.හා.න. – සැපයුම් හා නඩත්තු
මා.ස.ස.ඒ. - මානව සම්පත් සංවර්ධන ඒකකය
වි.අ.අ. – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
වි.සේ.අ.ම – විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය
ස්. පු. සා. කේ. - ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය
අ.වි. - අභ්‍යන්තර විගණක
ජ්‍යෙ.ස.අ.වි. - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
ස.අ.ස. – සහකාර අභ්‍යන්තර විගණක

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංවිධාන රූ සටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ස්ථාවර කමිටු

සභාපති

උප සභාපති

ලේකම්

ප්‍රධාන අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණක

අතිරේක ලේකම් / මානව සම්පත්

අතිරේක ලේකම්/ අධ්‍යයන

අතිරේක ලේකම්/නීති හා ප්‍රලේඛණ

අධ්‍යක්ෂ/ යටිතල පහසුකම් සංවර්ධන අංශය

ගණකාධිකාරී

සංඛ්‍යාලේඛනඥ

අධ්‍යක්ෂ/ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය

අධ්‍යක්ෂ / ස්. පු. සා. කේ

නියෝජ්‍ය ලේකම්

අධ්‍යක්ෂ මා.ස.ස.ඒ

නියෝජ්‍ය ලේකම්

අධ්‍යක්ෂ සැලසුම්

නියෝජ්‍ය ලේකම්

වැඩ ඉංජිනේරු

නියෝජ්‍ය ගණකාධිකාරී වි.වි.පු.කොා.ස.

නියෝජ්‍ය ලේකම්

නියෝජ්‍ය ලේකම්

නියෝජ්‍ය ලේකම්

ජ්‍යෙ.ස. ලේ.

ජ්‍යෙ.ස .ලේ.

ජ්‍යෙ.ස .ලේ.

ජ්‍යෙ.ස .ලේ.

ජ්‍යෙ.ස .ලේ.

ජ්‍යෙ. ස.ලේ.

ජ්‍යෙ.ස.ලේ. ප්‍රවේශ

ජ්‍යෙ.ස.ලේ. ප්‍රවේශ

ව්‍යාපෘති කළමණාකරු

ජ්‍යෙ .ස.ග. වි.ඇ.අ

ජ්‍යෙ .ස.ග.

ජ්‍යෙ .ස.ග.

ජ්‍යෙ.ස.ලේ පිරිස්

ජ්‍යෙ.ස.ලේ S&M

ජ්‍යෙ.ස.ලේ

ජ්‍යෙ.ස.ලේ

ජ්‍යෙ.ස.ලේ

ජ්‍යෙ.ස.අ.වි.

ස.ලේ

ස.ලේ

ස.ලේ

ස.ලේ

ස.ලේ

ම.ස. නි

ම.ස. නි

වැඩසටහන් කරු සහ පද්ධති විශ්ලේෂක

ස.ලේ

සහකාර සංඛ්‍යාලේඛනඥ

සහකාර සංඛ්‍යාලේඛනඥ

වැඩසටහන්කරු සහ පද්ධති විශ්ලේෂක

වි.සේ.අ.ම/ලේකම්

වැඩසටහන්කරු සහ පද්ධති විශ්ලේෂක

ස.අ.වි.

XVI.

ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි

පූර්ණ, අර්ධ පූර්ණ සහ නූපූර්ණ සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු කොමිෂන් සභාව 2024 වර්ෂයේ දී පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය;

10 වන කොමිෂන් සභාව (2024.10.17 දක්වා)

සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග** *බී.ඒ.ආර්ථික විද්‍යාව (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය); එම්.ඒ. ආර්ථික විද්‍යාව(කොළඹ); එම්.එස්.සී. ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ආර්ථික විද්‍යාව (සාගා, ජපානය); පී.එච්.ඩී.(කගෝෂිමා, ජපානය)*
උප සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්දන පී උඩවත්ත** *බී.එස්.සී., දර්ශනශූරී, පී.එච්.ඩී., වරලත් රසායනඥ, රසායනික ඉංජිනේරු ඩිප්ලෝමාව (Dip.Chem.Eng), ජෛව තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (Dip.Bio.Tech)*
කොමිෂන් සභාවේ සාමාජිකයන්	**පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි** *බී.ඒ (ගෞරව) එම්.ඒ., පී.එච්.ඩී.(පේරාදෙණිය), අග්ගමහාපණ්ඩිත*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ .කේ. ඩබ්ලිව් .ජයවර්ධන *බී.එස්.සී. ඉංජිනේරු (ගෞරව) (මොරටුව), එම්.එස්.සී. ඉදිකිරීම් (ලොන්බරෝ,එ.රා.), පී.එච්.ඩී. ඉදිකිරීම් කළමනාකරණය (ලොන්බරෝ,එ.රා.), වරලත් ඉංජිනේරු, එෆ්.අයි.එෆ්. (ශ්‍රී.ල) එම්.එස්.එස්.ඊ.(ශ්‍රී.ල), Int.PEng (ශ්‍රී.ල), එම්.එස්.එස්.ඊ.(ශ්‍රී.ල), එෆ්.අයි.පී.එම්.(ශ්‍රී.ල), එෆ්.එන්.ඒ.එස්.(ශ්‍රී.ල), ජී.එස්.එල්.අයි.ඩී.*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ති අරසරත්නම් *බී.එස්.සී, එම්.එස්.සී, පී.එච්.ඩී.(ජෛව රසායන විද්‍යාව)*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා *බී.ඒ., එම්.ඒ.(කොළඹ), එම්.එස්.සී. සහ පී.එච්.ඩී.(එඩින්බරෝ, එ.රා.)*
	පාලිත කුමාරසිංහ මහතා (ජනාධිපති නීතිඥ)
භාණ්ඩාගාර නියෝජිත	**ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා** *බී.ඒ. (ගෞරව)(කොළඹ),1991, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කයිරෝ), 1997, එම්.ඒ.(සංවර්ධන අධ්‍යයන), නෙදර්ලන්තය, 2002*
ලේකම්	**ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර** *බී.එස්.සී.(ගෞරව), එම්.බී.ඒ.(කොළඹ), පී.එච්.ඩී.(වුහාන්)*

11 වන කොමිෂන් සභාව (2024.10.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි)

සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න** *බී.එස්.සී (ගෞරව) කැලණිය, පී.එච්.ඩී. (වේන් ප්‍රාන්තය, ඇමරිකා එක්සත් ජනපදය)*
උප සභාපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්.වසන්ත කුමාර** *බී.එස්.සී.(ගෞරව) කෘෂිකර්ම විද්‍යාව උපාධිය, ශාක ආරක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය, ශාක ව්‍යාධිවේද විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය*
කොමිෂන් සභාවේ සාමාජිකයන්	**මහාචාර්ය හේමමාලි ගුණතිලක** *රාජ්‍ය පරිපාලන (විශේෂ) විද්‍යාවේදී උපාධිය, SJP, කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, ජයවර්ධනපුර, පී.එච්.ඩී. (වෝර්වික්, එක්සත් රාජධානිය)*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩා *බී.ඒ.(ආර්ථික විද්‍යාව), එම්ෆිල්, පී.එච්.ඩී.*
	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්. ඒ. අතලගේ *බී.එස්.සී. ඉංජිනේරු (ගෞරව) (ශ්‍රී ලංකාව), ඉංජිනේරුපති උපාධිය (ඒඅයිටී), ඩී.ඊ.ඒ. (ප්‍රංශය), පී.එච්.ඩී. (ප්‍රංශය), වරලත් ඉංජිනේරු, එෆ්එන්ඒඑස්එස්එල්*
	ආචාර්ය සුබ්‍රමනියම් රවිරාජ් *එම්.බී.බී.එස්. (ශ්‍රී ලංකා), එම්.එස්. (ශ්‍රී ලංකා), එෆ්සීඑස්එස්එල්*
	සී. කේ. වීරකෝන් උණම්බුවේ මිය (ජනාධිපති නීතිඥ) *එල්.එල්.බී.(කොළඹ)*
භාණ්ඩාගාර නියෝජිත	**ඩී. එච්. එස්. පුල්ලේපෙරුම මිය** *බී.එස්.සී.(ශ්‍රී ලංකා), පී.ජී.බී.එම්.(ශ්‍රී ලංකා)*
ලේකම්	**ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර** *බී.එස්.සී.(ගෞරව), එම්.බී.ඒ.(කොළඹ), පී.එච්.ඩී.(වුහාන්)*

2. විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය

2.1 කොළඹ විශ්වවිද්‍යාලය

කුලපති
ශාසන කීර්ති ශ්‍රී බුද්ධ ශාසන ශෝභන පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක හිමි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න

නියෝජ්‍ය උප කුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
වී. එච්. ජයරත්න මිය (වැඩ බලන)
කේ. සී. එස්. පෙරේරා මිය

2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ජී. එච්. පිරිස්

උප කුලපති
මහාචාර්ය එම්. ඩී. ළමාවංශ (2024.07.31 දක්වා)
මහාචාර්ය ඩබ්ලිව්. එම්. ටී. මධුජිත් (2024.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

නියෝජ්‍ය උප කුලපති
මහාචාර්ය. රංජිත් ඩබ්ලිව්. පල්ලේගම (2024.08.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

ලේඛකාධිකාරී
ඊ.එම්.ජී.එම්.බී. ඒකනායක මයා (වැඩ බලන)

2.3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කුලපති
ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ශ්‍රී මහා විහාර වංශාලංකාර විමලකීර්ති ශ්‍රී ධම්මාලෝක සාහිත්‍යසූරී ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාරාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පත්මලාල් එම්.මානගේ

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්.ඒ.බී.වැලිවිට මහතා

2.4 කැලණිය විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන් වහන්සේ

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා

ලේඛකාධිකාරී
කේ. කේ. කේ. ධර්මතිලක මහතා

2.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එම්. කාසීම්

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්. ඩී. ගුණවර්ධන

නියෝජ්‍ය උපකුලපති
ආචාර්ය ඩී. පී. චන්ද්‍රසේකර

ලේඛකාධිකාරී
ඩී. එල්. ඩී. ජයන්ත මහතා

2.6 යාපනය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එස්. පද්මනාදන්

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ශ්‍රීසත්කුනරාජා

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
වී. කන්දීපන් මහතා

2.7 රුහුණ විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය ආචාර්ය අකුරෙටියේ නන්ද නායක හිමි

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී. එස්. ඩී. අමරසේන (2024.08.24 දක්වා)

නිසි බලධාරියා
මහාචාර්ය ආර්.එම්. යූ. එස්. කේ. රත්නායක (2024.08. 25 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි))

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය ඊ. පී. එස්. චන්දන

ලේඛකාධිකාරී
පී.එස්. කළුගම මිය

2.8 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එම්. සෙල්වරාජා

උප කුලපති
මහාචාර්ය වී. කනගසිංහම්

නියෝජ්‍ය උපකුලපති
ආචාර්ය ටී. ප්‍රභාහරන් (වැඩ බලන)

ලේඛකාධිකාරී
ඒ. පහිරදන් මහතා

2.9 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

කුලපති
එෆ්. මුස්තාපා මහතා (ජනාධිපති නීතිඥ)

උප කුලපති
මහාචාර්ය ඒ. රමීස් (2024.08.08 දක්වා)
ආචාර්ය යූ. එල්. අබ්දුල් මජීද් (වැඩ බලන) (2024.08.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

ලේඛකාධිකාරී
එම්. අයි. නව්ෆර් මහතා (වැඩ බලන)

2.10 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

කුලපති
රාජකීය පණ්ඩිත පූජ්‍ය ඊතලවැටුනවැවේ ඤානතිලක නායක හිමි

උප කුලපති
මහාචාර්ය ජී. ඒ. එස්. ගිනිගද්දර (2024.12.12 දක්වා)
ආචාර්ය ජනක පුෂ්පකුමාර (වැඩ බලන) (2024.12.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

ලේඛකාධිකාරී
ඒ.එම්.ජී.බී. අබේසිංහ මහතා (පැවරුම් පදනම මත) (2024.03.07 දක්වා)
එස්. එච්. උවයිසුල්කරණි මහතා (වැඩ බලන) (2024.03.08 දින සිට 2024.06.02 දක්වා)
එස්. සී. හේරත් මිය (2024.06.03 සිට)

2.11 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර නායක හිමි

උප කුලපති
මහාචාර්ය එම්. සුනිල් ශාන්ත

ලේඛකාධිකාරී
එස්. උයන්ගොඩ මහතා

2.12 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය

උප කුලපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ. එම්. යූ. කේ. ජයසිංහ

ලේඛකාධිකාරී
ඩබ්ලිව්. ඒ. ඩී. චිත්‍රානන්ද මහතා

2.13 ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කුලපති
ත්‍රිපිටකාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී සුමංගල රත්නපාල ධම්මරක්ඛිත අති පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමි

උප කුලපති
මහාචාර්ය කේ. බී. විජේසේකර

ලේඛකාධිකාරී
එම් .එෆ්.එච්. කරීම් මහතා
ඒ.ජේ.එම්.ඩී.එන්.බී. නාවල මයා (වැඩ බලන)

2.14 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කුලපති
සම්මානිත මහාචාර්ය ඩී. ඒ. තන්ත්‍රිගොඩ

උප කුලපති
මහාචාර්ය පී. එම්. සී. නිලකරත්න

නියෝජ්‍ය උප කුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එල්.වී.ජයසේන මිය

2.15 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

කුලපති
සම්මානිත මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි

උප කුලපති
මහාචාර්ය ආර්. නෙත්සිංහ

ලේඛකාධිකාරී
ඩී. එන්. ගුරුසිංහ මහත්මිය (වැඩබලන) (2024.03.31 දක්වා)
පී. ජී. එස්. පී. නානායක්කාර මිය (වැඩ බලන) (2024.04.01 දින සිට 2024.09.01 දක්වා)
ආචාර්ය සී. වී. ඉඹුල්ගොඩ (2024.09.02 දින සිට)

2.16 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

කුලපති
සාහිත්‍ය චක්‍රවර්ති, මල්වතු පාර්ශ්වයේ අනුනායක, පූජ්‍ය ආචාර්ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි ස්වාමීන් වහන්සේ

උප කුලපති
මහාචාර්ය ආර්. ඩබ්ලිව්. සෙනෙවිරත්න

ලේඛකාධිකාරී
බී. ඒ. එන්. ක්‍රිෂාන්ත මහතා

2.17 වව්නියාව විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය එස්. මෝහනදාස්

උප කුලපති
ආචාර්ය ටී. මංගලේශ්වරන්

ලේඛකාධිකාරී
එන්.රාජවිසහන් මහතා

3. ආයතන

3.1 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව (2024.01.28 දක්වා)
මහාචාර්ය ඩී. කේ. එන්. ජී. පුෂ්පකුමාර (2024.01.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

3.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.එම්.ජී. අධිකාරී

3.3 කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය. ඩබ්ලිව්. ජී. එස්. කැලුම් (2024.05.07 දක්වා)
ආචාර්ය අසංග රණසිංහ (2024.05.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

3.4 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්. රාජපක්ෂ

3.5 පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි

3.6 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල

3.7 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ඒ. ආර්. රසූල්

3.8 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්. ජේ. එස්. ද මෙල් (2024.05.09 දක්වා)
මහාචාර්ය පී. පී. ඒ. ඩබ්ලිව්. අතුකෝරළ (2024.05.10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි)

3.9 මානව සම්පත් අභිවර්ධන ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ඩබ්ලිව්. එස්. චන්ද්‍රසේකර

3.10 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ඩී. ඒ. එස්. අතුකෝරළ

3.11 ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය කේ. ජී. පී. ජී. විජේතුංග මිය (2024.07.04 දක්වා)
ආර්. පී. පී. රණවීර මහතා (වැඩ බලන) (2024.07.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

3.12 තොරතුරු තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
මේජර් ජෙනරාල් [විශ්‍රාමික] එස්.කේ. තිරුනාවුකරසු

3.13 ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය බී. පී. ගල්හේන

3.14 මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ
මහාචාර්ය පී. නාරංගොඩ

3.15 සෞන්දර්යය අධ්‍යයන පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය එෆ්.බී. කෙනඩි

3.16 කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
මහාචාර්ය ඩී.එම්.සී.සී.ගුණතිලක

3.17 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය සී. අබේසේන (2024.02.02 දක්වා)
මහාචාර්ය එස්. එම්. එස්. සමරකෝන් (2024.02.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

3.18 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්. ඩී. ධර්මරත්න

4. මණ්ඩප

4.1 ත්‍රිකුණාමලය මණ්ඩපය

මණ්ඩපාධිපති
මහාචාර්ය සී. ජී.දේවදාසන්

4.2 ශ්‍රීපාලී මණ්ඩපය

මණ්ඩපාධිපති

ආචාර්ය එස්. ඩබ්ලිව්. පී. මහානාමහේවා

5. විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කරන ලද අතර 2024 ජනවාරි මස පවත්වන ලද අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා 2024 ජුනි 14 සිට 2024 ජූලි 05 දක්වා අපේක්ෂකයින්ගෙන් මාර්ගගතව අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කර කඩඉම් ලකුණු 2024 සැප්තැම්බර් 20 දින නිකුත් කරන ලදී. 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර එය 2025 දී අවසන් කිරීමට නියමිතය.

5.1 සාමාන්‍ය විධිවිධාන යටතේ 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම [2024 ජනවාරි මාසයේ පැවති අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව] 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමට පහත සඳහන් ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී.

1. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2024 වර්ෂයේ පවත්වන ලද අ.පොෙ.ස. උසස් පෙළ විභාගයේ දී අයදුම්කරුවන් ලබා ගත් ඉසෙඩ් ලකුණුවල සාමාන්‍ය අනුව පෙළගැස්වූ කුසලතා අනුපිළිවෙල මත පදනම්ව සිදු කිරීම.

2. [*කලා, කලා (SP), කලා (SAB), සන්නිවේදන අධ්‍යයන, සාමය හා ගැටුම් නිරාකරණය, ඉස්ලාම් අධ්‍යයන, අරාබි භාෂාව සහ ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL), සමාජ වෘතවේදය සහ කලා-නොරතුරු තාක්ෂණය*] වැනි කලා පාඨමාලා සඳහා දී ඇති දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාව, 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයේ දී යම් දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාවට වඩා අඩු නොවිය යුතුය යන කොන්දේසියට යටත්ව දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිසුන් ඇතුළත් කිරීම් සිදු කරන ලදි.

3. ඉහත 2 යටතේ සඳහන් පාඨමාලා හැරුණු විට අනෙකුත් සියලුම පාඨමාලා සඳහා ද්විත්ව නිර්ණායක මත ඇතුළත් කිරීම් සිදු කරන ලදි. එනම්;
   - දීප ව්‍යාප්ත කුසලතා පදනම
   - දිස්ත්‍රික් කුසලතා පදනම

4. යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇති මුළු ස්ථානවලින් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙල ගැසූ ඉසෙඩ් ලකුණු අනුව සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

5. ඉතිරි 60% න් 55%ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. යම් දිස්ත්‍රික්කයකින් දීප ව්‍යාප්ත කුසලතා පදනම් මත කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගන්න සිසුන්ට (40%) අමතරව, දිස්ත්‍රික් කුසලතා පදනම යටතේ තවත් 55% ක් දක්වාද අමතර සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ. ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55%ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරේ.

6. එක් එක් පාඨමාලාවේ පවතින 5%ක් දක්වා වූ ඉතිරි ස්ථාන සිසුන් අතර බෙදා හැරීමේදී, අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇති පහත දැක්වෙන දිස්ත්‍රික්ක 16 සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්ක 16

හි මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදා වෙන් කරනු ලැබේ;

1. නුවරඑළිය
2. හම්බන්තොට
3. යාපනය
4. කිලිනොච්චිය
5. මන්නාරම
6. මුලතිව්
7. වව්නියාව
8. ත්‍රිකුණාමලය
9. මඩකලපුව
10. අම්පාර
11. පුත්තලම
12. අනුරාධපුරය
13. පොළොන්නරුව
14. බදුල්ල
15. මොණරාගල
16. රත්නපුර

7. තවද, කලා හැර වෙනත් පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී, කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඕනෑම දිස්ත්‍රික්කයකට වෙන් කර ඇති දිස්ත්‍රික් පංගු ප්‍රමාණය, 1993/1994 හෝ 2002/2003, අධ්‍යයන වර්ෂයන්වල දී එම එක් එක් පාඨමාලාව සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයට වෙන් කර තිබූ දිස්ත්‍රික් පංගු ප්‍රමාණයේ උපරිමයට වඩා අඩු නොවන අයුරින් සිදු කෙරිණි.

8. ඒ අනුව, 2023 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා ප්‍රතිඵල පදනම් කරගෙන 2023/2024 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම, 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කළ "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" යන අත්පොතෙහි ඇතුළත් නීතිරීතිවලට යටත්ව සිදු කරන ලදී.

2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා යෝජිත බඳවා ගැනීම් ප්‍රමාණය 43,204 ක් වූ අතර 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අපේක්ෂකයින් 173,444 ක් සුදුසුකම් ලබා තිබුණි.

5.1.1 සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම

2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සාමාන්‍ය විධිවිධාන යටතේ සිසුන් 42,282 ක් පහත පරිදි ඇතුළත් කර ගන්නා ලදී;

පාඨමාලා ක්ෂේත්‍රය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
1	වෛද්‍ය විද්‍යාව	2060
2	දන්ත ශල්‍ය විද්‍යාව	128
3	පශු වෛද්‍ය විද්‍යාව	128
4	කෘෂිකර්මය	882
5	ආහාර විද්‍යාව හා පෝෂණය	163
6	ජෛවීය විද්‍යාව	1677
7	ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යාව)	406
8	ඉංජිනේරු විද්‍යාව	2206
9	ඉංජිනේරු විද්‍යාව (EM)	78
10	ඉංජිනේරු විද්‍යාව (TM)	96
11	ප්‍රමාණ සමීක්ෂණය	150

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
12	පරිගණක විද්‍යාව	691
13	භෞතීය විද්‍යාව	2306
14	මැනුම් විද්‍යාව	163
15	ව්‍යවහාරික විද්‍යාව (භෞතීය විද්‍යාව)	764
16	කළමනාකරණය	5388
17	දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	69
18	වාණිජ්‍යය	884
19	කලා	6589
20	කලා (SP) - ජනමාධ්‍ය	108
21	කලා (Sab) - [කලා විෂය ධාරාව]	191
21	කලා (Sab) - [වාණිජ්‍යය විෂය ධාරාව]	158
22	කළමනාකරණ අධ්‍යයන (TV) - [වාණිජ්‍යය විෂය ධාරාව]	229
22	කළමනාකරණ අධ්‍යයන (TV) - [ඕනෑම විෂය සංයෝජනයක්]	229
23	වාස්තු විද්‍යාව	98
24	නිර්මාණවේදය	85
25	නීතිය	491
26	තොරතුරු තාක්ෂණය (IT)	249
27	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය [වෙනත් විෂය ධාරාවන්]	69
27	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය [ජෛවීය විද්‍යා විෂය ධාරාව]	46
28	කළමනාකරණය (රාජ්‍ය) විශේෂ	98
29	සන්නිවේදන අධ්‍යයනය	198
30	නගර හා ග්‍රාම නිර්මාණය	87
31	සාමය හා ගැටුම් නිරාකරණය	34
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	379
33	යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	87
34	විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	78
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	218
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	245
37	භෙද	570
38	තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT)	284
39	කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	220
41	කලා (විශේෂ) / ප්‍රසාංගික කලා	108
50	සෞඛ්‍ය ප්‍රවර්ධනය	101
51	ඖෂධ විද්‍යාව	238
52	වෛද්‍ය රසායනාගාර විද්‍යා	226
53	විකිරණ ශිල්පය	67
54	භෞත චිකිත්ස	109
55	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	107

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
56	පහසුකම් කළමනාකරණය	79
57	ප්‍රවාහන කළමනාකරණය සහ කාර්යෝපාය ඉංජිනේරු (TMLE)	89
58	අණුක ජීව විද්‍යාව හා ජීව රසායන විද්‍යාව	79
59	කර්මාන්ත සංඛ්‍යානය හා ගණිතමය මූල්‍ය	119
60	සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	77
62	ධීවර සහ සාගර විද්‍යාව	148
63	ඉස්ලාම් අධ්‍යයනය	276
64	විද්‍යාව සහ තාක්ෂණය	107
65	පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	100
66	ව්‍යවසායකත්වය හා කළමනාකරණය	101
67	සත්ත්ව නිෂ්පාදන සහ ආහාර තාක්ෂණය	106
68	සංගීතය (ශ්‍රී ජයවර්ධනපුර)	48
68	සංගීතය (යාපනය)	115
68	සංගීතය (ස්වාමී විපුලානන්ද)	101
68	සංගීතය (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	290
69	නර්තනය (යාපනය)	99
69	නර්තනය (ස්වාමී විපුලානන්ද)	91
69	නර්තනය (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	286
70	චිත්‍ර සහ නිර්මාණ	60
71	නාට්‍ය හා රංග කලා (ස්වාමී විපුලානන්ද)	102
48	නාට්‍ය හා රංග කලා (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)	70
72	දෘශ්‍ය සහ තාක්ෂණික කලා	92
73	අපනයන කෘෂිකර්මය	103
75	කාර්මික තොරතුරු තාක්ෂණය	98
76	ඛනිජ සම්පත් සහ තාක්ෂණය	105
77	ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) (BIS)	79
79	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	168
81	ශාරීරික අධ්‍යාපනය	147
82	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	226
83	කථන හා ශ්‍රවන විද්‍යා	73
84	අරාබි භාෂාව	223
85	දෘශ්‍ය කලා	114
86	සත්ත්ව පාලනය සහ මත්ස්‍ය විද්‍යාව	72
87	ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	138
88	ජලජ සම්පත් තාක්ෂණය	113
90	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	105
91	තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	125
92	සංචාරක හා සත්කාරක කළමනාකරණය	179
93	කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය	179

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
94	කෘෂි ව්‍යාපාර කළමනාකරණය	76
95	හරිත තාක්ෂණය	71
96	තොරතුරු පද්ධති	349
97	භූමි නිර්මාණවේදය	79
98	පරිවර්තන අධ්‍යයනය (කැලණිය සහ සබරගමුව)	69
98	පරිවර්තන අධ්‍යයනය (යාපනය සහ නැගෙනහිර)	68
99	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	184
100	සිනමා හා රූපවාහිනී අධ්‍යයන	58
101	ව්‍යාපෘති කළමනාකරණය	99
102	ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	1329
103	ජෛව පද්ධති තාක්ෂණවේදය (BST)	1234
104	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	912
105	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)	99
106	සාගර හා මිරිදිය විද්‍යාව	98
107	ආහාර ව්‍යාපාර කළමනාකරණය - [ජෛවීය විද්‍යා / භෞතීය විද්‍යා විෂය ධාරාව]	67
107	ආහාර ව්‍යාපාර කළමනාකරණය - [වාණිජ්‍යය විෂය ධාරාව]	68
108	භෞතීය විද්‍යාව - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	154
109	ව්‍යාපාර විද්‍යාව	148
110	මූල්‍ය ඉංජිනේරුකරණය	79
111	භූගෝලීය තොරතුරු විද්‍යාව	73
112	සමාජ වෘතවේදය	99
113	මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය	71
114	මානව සම්පත් සංවර්ධනය	83
115	වෘත්තීය චිකිත්සාව	48
116	දෘෂ්ටිමිතිය	58
117	බුද්ධිමය යන්ත්‍ර විද්‍යාව	48
118	ව්‍යවහාරික රසායන විද්‍යාව	58
119	ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව	78
120	දේශීය ඖෂධ සම්පත්	69
121	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	68
122	සෞඛ්‍ය සංචාරක හා ආගන්තුක සත්කාරක කළමනාකරණය	68
123	ජීව වෛද්‍ය තාක්ෂණය	68
124	දේශීය ඖෂධ තාක්ෂණය	68
125	යෝග සහ පාරමනෝවිද්‍යාව	68
126	සමාජ අධ්‍යයන (දේශීය දැනුම)	68
127	ගිණුම්කරණ තොරතුරු පද්ධති	48
128	කලා-තොරතුරු තාක්ෂණය	48
129	ජලජ ජෛවසම්පත්	48

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
130	නාගරික ජෛවසම්පත්	48
131	මූල්‍ය ආර්ථික විද්‍යාව	48
132	ඉංග්‍රීසි භාෂාව හා ව්‍යවහාරික වාග් විද්‍යාව	48
133	බැංකුකරණය හා රක්ෂණ	48
134	නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය	48
135	වැවිලි කළමනාකරණය සහ තාක්ෂණය	215
136	දන්ත විද්‍යාව	63
137	ප්‍රාථමික අධ්‍යාපනය	73
138	වෛද්‍ය ප්‍රතිබිම්භ තාක්ෂණය	48
139	බහු අවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය	48

වගුව 5.1.1 සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්කර ගැනීම්

5.2 හඳුන්වාදෙන ලද නව අධ්‍යයන පාඨමාලා

2023/2024 අධ්‍යයන වර්ෂයේ දී පහත සඳහන් නව අධ්‍යයන පාඨමාලා විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දෙන ලදී.

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	විශ්වවිද්‍යාලය	ප්‍රවේශ ගණන
139	බහු අවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	50

වගුව 5.2 2023/2024 අධ්‍යයන වර්ෂයේදී හඳුන්වා දුන් නව අධ්‍යයන පාඨමාලා

5.3 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා අනෙකුත් විශ්වවිද්‍යාලවලට හඳුන්වා දුන් විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලා

2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට පවතින පාඨමාලා එකතු කර නොමැත.

5.4 විශේෂ විධිවිධාන යටතේ 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම (2023 ජනවාරි මාසයේ පැවති අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

සාමාන්‍ය විධිවිධාන යටතේ 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමට අමතරව, පහත සඳහන් විශේෂ විධිවිධාන යටතේ 2022/2023 අධ්‍යයන වර්ෂය සහ 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම ද 2024 වර්ෂය තුළ දී අවසන් කරන ලදී.

(අ) අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්ධ සිසුන් සීමිත සංඛ්‍යාවක් [බ්‍රේල් ක්‍රමය භාවිතා කරමින් 2022 අ.පොෂ.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්] කලා අධ්‍යයන පාඨමාලාවටත්, කායික අශක්නුතාවන් ඇති සිසුන් (වෛද්‍යමය වශයෙන් විවිධ කායික අශක්නුතාවන් ඇති බවට සහතික කර ඇති) 2022/2023 අධ්‍යයන

වර්ෂය සඳහා කලා, වාණිජ්‍යය, ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව යන අධ්‍යයන පාඨමාලාවලට ඇතුළත් කර ගන්නා ලදී.

කාණ්ඩය	තෝරාගත් සිසුන් සංඛ්‍යාව				එකතුව
	කලා	වාණිජ්‍යය	ජීව විද්‍යාව	භෞතික විද්‍යාව	
අන්ධ සිසුන්	20	-	-	-	20
කායික අශක්නුතාවන් ඇති සිසුන්	60	15	11	1	87

වගුව 5.4. (අ) අන්ධ හා කායික අශක්නුතාවන් ඇති සිසුන් ඇතුළත් කිරීම

(ආ) විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන පාඨමාලා හැර අනෙක් සෑම අධ්‍යයන පාඨමාලාවකම ඇති ස්ථානවලින් 0.5%ක ප්‍රමාණයක්, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා සුළු ඉසෙඩ් ලකුණු සංඛ්‍යාවක අඩුවක් නිසා සාමාන්‍ය ප්‍රවේශය යටතේ යම්කිසි පාඨමාලාවකට නොතේරුණු එහෙත්, ක්‍රීඩා, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු (උදා: නැටුම්, චිත්‍ර, සංගීතය හා සාහිත්‍යය) බාල දක්ෂ සහ ශිෂ්‍ය භට, සමාජ කටයුතු හා වෙනත් බාහිර ක්‍රියාකාරකම්වලින් 2020 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන ඇති ශිෂ්‍යයන්ට මෙම අවස්ථාව පිරිනැමේ. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා එකඟ වී ඇති ස්ථානවලින් 4% ක් දක්වා මෙම කාණ්ඩය යටතේ 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට වෙන් කර ඇත.

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
1	වෛද්‍ය විද්‍යාව	10
2	දන්ත ශල්‍ය විද්‍යාව	1
3	පශු වෛද්‍ය විද්‍යාව	1
4	කෘෂිකර්මය	3
6	ජෛවීය විද්‍යාව	8
7	ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යා)	1
8	ඉංජිනේරු විද්‍යාව	10
9	ඉංජිනේරු විද්‍යාව (EM)	1
11	ප්‍රමාණ සමීක්ෂණය	1
12	පරිගණක විද්‍යාව	3
13	භෞතීය විද්‍යාව	8
14	මැනුම් විද්‍යාව	1
15	ව්‍යවහාරික විද්‍යා (භෞතීය විද්‍යාව)	4
16	කළමනාකරණය	18
18	වාණිජ්‍යය	4

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
19	කලා	27
21	කලා (SAB) –A [කලා විෂය ධාරාව]	1
22	කළමනාකරණ අධ්‍යයනය (රූපවාහිනී)-A[වාණිජ්‍ය විෂය ධාරාව]	1
23	වාස්තු විද්‍යාව	1
25	නීතිය	2
26	තොරතුරු තාක්ෂණය (IT)	1
28	කළමනාකරණය (රාජ්‍ය) ගෞරව	1
31	සාමය හා ගැටුම් නිරාකරණය	1
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	2
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	1
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	1
37	භෙද	2
46	සංගීතය	9
47	නර්තනය	8
49	ආහාර ව්‍යාපාර කළමනාකරණය [වාණිජ්‍ය විෂය ධාරාව]	2
57	ප්‍රවාහන කළමනාකරණ සහ කාර්යෝපාය ඉංජිනේරු (TMLE)	1
58	ජීව රසායන විද්‍යාව සහ අණුක ජීවවිද්‍යාව	1
60	සංඛ්‍යානය සහ සංකාර්ය පර්යේෂණ	1
63	ඉස්ලාම් අධ්‍යයන	1
66	ව්‍යවසායකත්වය සහ කළමනාකරණය	1
67	සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය	1
75	කාර්මික තොරතුරු තාක්ෂණය	1
76	ඛනිජ සම්පත් සහ තාක්ෂණය	1
77	ව්‍යාපාර තොරතුරු පද්ධති (ගෞරව) (BIS)	1
79	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි)	1
80	පරිගනණය සහ තොරතුරු පද්ධති	1
81	ශාරීරික අධ්‍යාපනය	1
82	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	1
85	දෘශ්‍ය කලා	2
87	ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	1
91	තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය	1
96	තොරතුරු පද්ධති	2
99	මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව	1
102	ඉංජිනේරු තාක්ෂණවේදය (ET)	5
103	ජෛවපද්ධති තාක්ෂණවේදය (BST)	2
104	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	2
106	සාගර සහ මිරිදිය විද්‍යාව	1
108	භෞතීය විද්‍යාව- (ICT)	1

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
109	ව්‍යාපාර විද්‍යාව	1
111	භූගෝලීය තොරතුරු විද්‍යාව	1
112	සමාජ වෘතවේදය	1
118	ව්‍යවහාරික රසායන විද්‍යාව	1
119	ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා පරිගණක විද්‍යාව	1
127	ගිණුම්කරණ තොරතුරු පද්ධති	1
128	කලා - තොරතුරු තාක්ෂණය	1
131	මූල්‍ය ආර්ථික විද්‍යාව	1
134	නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය	1

5.4. (ආ) විෂය පරිහාහිර කටයුතු සඳහා විශිෂ්ඨත්වයක් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම

(ඇ) ගුරුවරුන් ඇතුළත් කර ගැනීම

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා කලා, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික විද්‍යාව යන පාඨමාලා සඳහා පහත සඳහන් කාණ්ඩවලට අයත් ගුරුවරුන් සීමිත සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව පහත අවශ්‍යතා සපුරාලන ගුරුවරුන් මෙම විශේෂ විධිවිධාන යටතේ 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබන ලදී.

i. 2018 වර්ෂයේ දී හෝ ඊට පසු වර්ෂයක දී (කලා විෂය පිළිබඳ අධ්‍යයන පාඨමාලාවක් සඳහා) ඉංග්‍රීසි විෂය සහිතව සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය / ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන්.

ii. 2018 වර්දීෂයේ දී හෝ ඊට පසු වර්ෂයක දී විද්‍යාවේ දී (බාහිර) උපාධි පාඨමාලාවේ පළමු විභාගය සමත් වූ ගුරුවරුන්. (ජෛවීය විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික විද්‍යාව යන පාඨමාලාවක් සඳහා)

ඒ අනුව, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා මෙම විධිවිධානය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා අධ්‍යයන පාඨමාලාව (ඉංග්‍රීසි විෂයයක් ලෙස) සඳහා එක් ගුරුවරයෙකු තෝරා ගන්නා ලදී.

(ඈ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා මෙම විශේෂ විධිවිධානය යටතේ තෝරාගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ;

පාඨමාලා කේතය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
1	වෛද්‍ය	21

වගුව 5.4. (ඈ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම

(ඉ) සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා පවතින විශේෂ විධිවිධාන යටතේ, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා වෛද්‍ය, දන්ත ශල්‍ය වෛද්‍ය සහ ඉංජිනේරු විද්‍යා අධ්‍යයන පාඨමාලාවල නිශ්චිත බඳවා ගැනීම් සංඛ්‍යාවක් පහත සඳහන් පරිදි මෙහෙයුම් ප්‍රදේශවල සේවය කරන සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් සඳහා වෙන් කර ඇත.

1. වෛද්‍ය සහ ඉංජිනේරු විද්‍යා සඳහා බඳවා ගැනීමට යෝජිත ස්ථානවලින් 0.5%ක ප්‍රමාණයක්, ස්ථිර සේවයේ නියුක්ත සන්නද්ධ සේවා නිලධාරීන් සහ මෙහෙයුම් ප්‍රදේශවල සේවය කරන පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් වෙත වෙන් කර ඇත.

2. දන්ත ශල්‍ය විද්‍යාව සඳහා බඳවා ගැනීමට යෝජිත ස්ථානවලින් 0.5%ක ප්‍රමාණයක් මෙම ප්‍රතිපාදන යටතේ, මෙහෙයුම් ප්‍රදේශවල සේවය කරන පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් වෙත වෙන් කර ඇති අතර, 2021.12.14 දිනැති අංක 21/2026/303/156 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව දන්ත ශල්‍ය විද්‍යාව අධ්‍යයන පාඨමාලාව සඳහා යෝජිත ස්ථාන සංඛ්‍යාවට අතිරේකව සිසුන් 5 දෙනෙකු දක්වා සන්නද්ධ සේවා පිරිස් සඳහා වෙන් කර ඇත.

ඒ අනුව, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා මෙම විශේෂ විධිවිධාන යටතේ තෝරාගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ;

පාඨමාලා ක්ෂේත්‍රය	අධ්‍යයන පාඨමාලාව	තෝරාගත් සිසුන් සංඛ්‍යාව
1	වෛද්‍ය	10
2	දන්ත ශල්‍ය විද්‍යාව	5
8	ඉංජිනේරු විද්‍යාව	5

වගුව 5.4. (ඉ) සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම

(ඊ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨ දක්ෂතාවක් දක්වා ඇති අයදුම්කරුවන්

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන පාඨමාලා සඳහා ක්‍රීඩාවේ විශිෂ්ටතා දැක්වූ අපේක්ෂකයින් 05 දෙනෙකු ඇතුළත් කර ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත.

ඒ අනුව, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා මෙම විශේෂ විධිවිධානය යටතේ සිසුන් 05 දෙනෙකු තෝරා ගන්නා ලදී.

(උ) අභියාචනා යටතේ සිසුන් ඇතුළත් කර ගැනීම

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අපේක්ෂකයින් විසින් කරන ලද අභියාචනා සහ පැමිණිලි විමර්ශනය කර වාර්තා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව

විසින් 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ 4.4 වගන්තියට අනුව ඉදිරිපත් කරන ලද අභියාචනා 1720 ක් සලකා බලන ලදී.

ඒ අනුව, කමිටුවේ නිර්දේශ අනුව අභියාචනා පියවර 1 යටතේ 2022/2023 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා සඳහා ඉල්ලා සිටි සිසුන් 632 දෙනෙකු තෝරා ගන්නා ලදී.

(ඌ) අතිරේක ප්‍රවේශය යටතේ සිසුන් ඇතුළත් කිරීම

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා වලංගු වන විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ 1.1 වගන්තියේ දක්වා ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තියේ පදනම මත කලා අධ්‍යයන පාඨමාලාවේ සමහර විෂයයන් සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් තේරී පත් නොවිය හැක. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍ය ප්‍රවේශ නිර්ණායක යටතේ තෝරාගත් සංඛ්‍යාවට වඩා විශාල සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට ඇතැම් පීඨ සහ අධ්‍යයනාංශවලට හැකියාව පවතී. එවැනි තත්ත්වයන් තුළ, අදාළ විශ්වවිද්‍යාලවල ඉල්ලීම පරිදි තෝරාගත් විෂය ක්ෂේත්‍ර සඳහා සීමිත අමතර සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තීරණය කළ හැකිය. මෙය විශ්වවිද්‍යාලවල ඇති මානව හා භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම මෙන්ම සමාජයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගත් ‘අතිරේක බඳවා ගැනීමකි’.

ඒ අනුව, 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා මෙම විශේෂ විධිවිධාන යටතේ විවිධ විෂයයන් හැදෑරීම සඳහා කලා විෂය පාඨමාලාව සඳහා සිසුන් 1076 දෙනෙකු තෝරා ගන්නා ලදී.

5.5 විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියේ සංවර්ධනයන් / වෙනස්කම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අතර, මාර්ගගත පද්ධති දෙකක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කරන ලදී. පාසල් සහ පෞද්ගලික අයදුම්කරුවන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ දිස්ත්‍රික්ක තීරණය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අවශ්‍ය දත්ත මෙම පද්ධති මගින් ග්‍රහණය කර ගනු ඇත. මීට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රවේශ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, අයදුම්කරුවන්ගේ පාසල් ඇතුළත් වීමේ දිනයන් සම්බන්ධ දත්ත රැස් කිරීමට කටයුතු යොදා ඇත. 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා මාර්ගගත අයදුම් කිරීමේ ක්‍රියාවලියේ දී මෙම දත්ත කල්තියා ලබා ගනු ලැබේ.

6. අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම

6.1 ස්ථාවර කමිටු

සංශෝධිත 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 4 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ ලබා දී ඇති විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු පිහිටුවා ඇත. එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම නම් අදාළ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය හා සම්බන්ධ කරුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීමය. ඒ අනුව සමාලෝචිත වර්ෂය වන 2024 තුළ ස්ථාවර කමිටු 24ක් විවිධ විෂයයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ක්‍රියාත්මක වේ. එක් එක් ස්ථාවර කාරක සභාව යටතේ පැවති රැස්වීම් සංඛ්‍යාව පහත දැක්වේ;

(අ)

අංකය	ස්ථාවර කමිටුවේ නම	2024 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන
01.	වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී වෘත්තීය මාර්ගෝපදේශ පිළිබඳ ස්ථාවර කමිටුව සහ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	01
02.	වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	04
03.	දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	04
04.	විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	02
05.	කෘෂිකර්ම, පශු වෛද්‍ය විද්‍යා හා සත්ත්ව පාලන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	03
06.	පශ්චාත් උපාධි අධ්‍යයනය හා පර්යේෂණය පිළිබඳ ස්ථාවර කමිටුව	03
07.	ඉංජිනේරු හා වාස්තු විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී ඉංජිනේරු හා වාස්තු විද්‍යා සහ තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටු ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	04
08.	තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී ඉංජිනේරු හා වාස්තු විද්‍යා සහ තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටු ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	04
09.	මානව ශාස්ත්‍ර සමාජ විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී ස්ථාවර කමිටුව ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	03

අංකය	ස්ථාවර කමිටුවේ නම	2024 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන
10.	අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී ස්ථාවර කමිටුව ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	04
11.	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී ස්ථාවර කමිටුව ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	03
12.	කළමනාකරණ අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව	03
13.	බාහිර උපාධි පිළිබඳ ස්ථාවර කමිටුව	03
14.	පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුව	04
15.	නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව	04
16.	පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	04
17.	ලලිත කලා පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී ස්ථාවර කමිටුව ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	03
18.	සම සෞඛ්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව	04
19.	විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා පිළිබඳ ස්ථාවර කමිටුව	03
20.	තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මාර්ගගත අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී තීරණය කරන ලද්දේ පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුවේ වත්මන් සාමාජිකයින්ට මෙම ස්ථාවර කමිටුව නියෝජනය කළ හැකි බැවින් මෙවැනි ස්ථාවර කමිටුවක් අවශ්‍ය නොවන බවයි)*	02
21.	ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව *(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.12.04 දින පැවති සිය 1136 වන සභා වාරයේ දී වෘත්තීය මාර්ගෝපදේශ පිළිබඳ ස්ථාවර කමිටුව සහ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව ඒකාබද්ධ කිරීමට තීරණය කළේය.)*	02
22.	සමාජ සංහිඳියාව පිළිබඳ ස්ථාවර කමිටුව	02
23.	තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව *	04
24.	ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුව *	06

වගුව 6.1 (අ) 2024 දී පැවැත්වූ ස්ථාවර කාරක සභා රැස්වීම් ගණන

සටහන: *පහත සඳහන් ස්ථාවර කමිටු 2024.11.07 දින ඒකාබද්ධ කරන ලදී:*

(ආ)

අංකය	ස්ථාවර කමිටුවේ නම	2024 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන
1.	ඉංජිනේරු හා වාස්තු විද්‍යාව සහ තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටුව	01
2.	මානව ශාස්ත්‍ර, අධ්‍යාපනය සහ සමාජ විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව	01
3.	ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටුව	-

වගුව 6.1 (ආ) 2024 දී පැවැත්වූ ඒකාබද්ධ කරන ලද ස්ථාවර කමිටු රැස්වීම් ගණන

*****සටහන : නන්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුව පිළිවෙලින් නන්ත්ව ආරක්ෂණ කවුන්සිලය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය විසින් පවත්වනු ලැබේ.*

6.2 2024 වර්ෂය තුළ අනුමත කරන ලද විශ්වවිද්‍යාල/පීඨ /අධ්‍යයනාංශ/ ප්‍රථම උපාධි පාඨමාලා, බාහිර හා පශ්චාත් උපාධි වැඩසටහන්

උසස් අධ්‍යාපනයට ඇති අවස්ථා ප්‍රමාණය වැඩි කිරීම සහ ප්‍රවේශ ගණන වැඩි කිරීමේ අභිප්‍රාය ඇතිව, 2024 වර්ෂය තුළ නව පීඨ 02ක්, නව අධ්‍යයන අංශ 02ක්, නව උපාධි වැඩසටහන් 02ක්, විශේෂවේදී උපාධි පාඨමාලා 04ක් ඇතුළුව, නව පශ්චාත් උපාධි පාඨමාලා 10ක් සහ නව බාහිර උපාධි වැඩසටහන් 02ක් හඳුන්වා දී අනුමත කරන ලදී. මේවා පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

6.2.1 2024 වර්ෂයේ අනුමත පීඨ

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පීඨයේ නම
1.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	උපාධි අධ්‍යයන පීඨය
2.	යාපනය විශ්වවිද්‍යාලය	සිද්ධ වෛද්‍ය විද්‍යා පීඨය

වගුව 6.2.1 2024 වර්ෂයේ අනුමත පීඨ

6.2.2 2024 වර්ෂයේ අනුමත අධ්‍යයන අංශ

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	අධ්‍යයන අංශයේ නම
1.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය
2.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	ගිණුම්කරණ සහ මූල්‍ය අධ්‍යයන අංශ

වගුව 6.2.2 2024 වර්ෂයේ අනුමත අධ්‍යයන අංශ

6.2.3 2024 වර්ෂයේ අනුමත කරන ලද ආයතන

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	අධ්‍යයන අංශයේ නම
1.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	අසාත්මිකතා සහ ප්‍රතිශක්ති විද්‍යා ආයතනය

වගුව 6.2.3 2024 වර්ෂයේ අනුමත කරන ලද ආයතන

6.2.4 2024 වර්ෂයේදී අනුමත කරන ලද නව ප්‍රථම උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	උපාධි වැඩසටහනේ නම (නව)
1.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය
2.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

වගුව 6.2.4 2024 වර්ෂයේදී අනුමත කරන ලද නව ප්‍රථම උපාධි වැඩසටහන්

6.2.5 2024 වර්ෂයේදී අනුමත කරන ලද විශේෂවේදී උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	උපාධි වැඩසටහනේ නම (විශේෂවේදී)
1.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	මෘදුකාංග සංවර්ධන ශිල්පීය ක්‍රම පිළිබඳ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය
2.		බහුමාධ්‍ය නිර්මාණ ශිල්පීය ක්‍රම පිළිබඳ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය
3.	යාපනය විශ්වවිද්‍යාලය	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
4.	කැලණිය විශ්වවිද්‍යාලය	ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

වගුව 6.2.5 2024 වර්ෂයේ දී අනුමත කරන ලද විශේෂවේදී උපාධි වැඩසටහන්

6.2.6 2024 වර්ෂයේ දී අනුමත කරන ලද නව පශ්චාත් උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පශ්චාත් උපාධි වැඩසටහනේ නම
1.	කොළඹ විශ්වවිද්‍යාලය	සෛලීය හා අණුක ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
2.		සෛලීය හා අණුක ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
3.		සෛලීය හා අණුක ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
4.		ජෛව තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
5.		ජෛව තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
6.		ජෛව තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
7.		අණුක ජීව විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
8.		අණුක ජීව විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
9.		අණුක ජීව විද්‍යා පිළිබඳ විද්‍යාපති උපාධිය
10.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	කෘෂිකර්මය පිළිබඳ දර්ශනශූරී උපාධිය

වගුව 6.2.6 2024 වර්ෂයේ දී අනුමත කරන ලද නව පශ්චාත් උපාධි වැඩසටහන්

6.2.7 2024 වර්ෂයේ දී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	බාහිර උපාධි වැඩසටහනේ නම
1.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	ආහාර ව්‍යාපාර සහ අලෙවිකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බාහිර)
2.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ව්‍යවහාරික පොලිස් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර)

වගුව 6.2.7 2024 වර්ෂයේදී අනුමත කරන ලද බාහිර උපාධි වැඩසටහන්

6.2.8 2024 වර්ෂයේ දී අනුමත කරන ලද ප්‍රථම උපාධි වැඩසටහන්වල සුදුසුකම් ලත් අවශ්‍යතා සඳහා ප්‍රතිව්‍යුහගත / සංශෝධනය කරන ලද බාහිර උපාධි වැඩසටහන්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	බාහිර උපාධි වැඩසටහනේ නම
1.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර)
2.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	බහුඅවයවික විද්‍යාව සහ කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
3.	කොළඹ විශ්වවිද්‍යාලය	අධ්‍යයන පාඨමාලාව - කාර්මික සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය

වගුව 6.2.8 2024 වර්ෂයේ දී අනුමත කරන ලද ප්‍රථම උපාධි වැඩසටහන්වල සුදුසුකම් ලත් අවශ්‍යතා සඳහා ප්‍රතිව්‍යුහගත / සංශෝධනය කරන ලද බාහිර උපාධි වැඩසටහන්

6.3 වර්ෂය තුළ අනුමත කරන ලද පීඨ, අධ්‍යයනාංශ හා ප්‍රථම උපාධි පාඨමාලාවල නම වෙනස් කිරීම්/බෙදීම්

පිළිවෙලින් පහත වගුවල දක්වා ඇති නොරතුරු අනුව 2024 වර්ෂය තුළ, අධ්‍යයන අංශ නම් වෙනස් කිරීමක් 01ක් යෝජනා කර අනුමත කරන ලදී;

6.3.1 2024 වර්ෂයේ දී අනුමත කරන ලද අධ්‍යයන අංශවල නම වෙනස් කිරීම්

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පැවැති නම	අනුමත නම
01	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සම සෞඛ්‍ය විද්‍යා පීඨය	සෞඛ්‍ය විද්‍යා පීඨය

වගුව: 6.3.1 2024 වර්ෂයේ දී අනුමත කරන ලද අධ්‍යයන අංශවල නම වෙනස් කිරීම්

6.3.2 2024 වර්ෂයේ දී අනුමත කරන ලද අධ්‍යයන අංශ බෙදීම

අංකය	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය	පැවැති නම	අනුමත නම
01.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	සමාජ විද්‍යා අධ්‍යයන අංශය	සමාජ විද්‍යා අධ්‍යයන අංශය සහ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශය

වගුව 6.3.2 2024 වර්ෂයේ දී අනුමත කරන ලද අධ්‍යයන අංශ බෙදීම

6.4 දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකික සිසුන් තම උසස් අධ්‍යාපන හදාරන ලද දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල පිළිගැනීමේ සහතිකය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් බොහෝ ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සපුරා දෙන ලදී. ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමයේ මහලේකම්වරයා විසින් 2023 ජුනි 22 දිනැතිව එවන ලද ලිපියෙන් කරන ලද ඉල්ලීම තුළින් දක්වා තිබුනේ, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමය විසින් 2019 සිට විශ්වවිද්‍යාල පිළිබඳ ජාත්‍යන්තර අත්පොත ප්‍රකාශයට පත් කිරීම නවතා දැමූ බවත් ඔවුන් “දත්ත ප්‍රතිපාදන මාර්ගගතව සම්පූර්ණ කිරීමට" යොමු වූ බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දුන් බවත් ය. ඒ අනුව “විශ්වවිද්‍යාල පිළිබඳ ජාත්‍යන්තර අත්පොත” පිළිබඳ සඳහන වෙබ් අඩවියෙන් ඉවත් කරන ලෙසත්, ඒ වෙනුවට වත්මන් "ලෝක උසස් අධ්‍යාපන දත්ත සමුදාය " වෙත යොමු කරන ලෙසත් ඔවුන් දැනුම් දී තිබේ.

ඒ අනුව, 2023 ජූලි 27 වැනි දින පැවති 1106 වැනි කොමිෂන් සභා වාරයේදී ගනු ලැබූ තීරණයට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව ලෝකයේ විවිධ රටවල විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ සත්‍ය තොරතුරු ඇතුළත් මූලාශ්‍ර වන පහත සඳහන් ජාත්‍යන්තර ප්‍රකාශන/දත්ත ගබඩාවේ ලැයිස්තුගත කර ඇති විශ්වවිද්‍යාල සඳහා පිළිගැනීමේ ලිපිය නිකුත් කිරීමට අඛණ්ඩව පහසුකම් සලසා දෙන ලදී.


- පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල විශ්වවිද්‍යාල පිළිබඳ වාර්ෂික සංග්‍රහය
- ලෝක උසස් අධ්‍යාපන දත්ත සමුදාය

7. මූල්‍ය පරිපාලනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 වැනි වගන්තියට අනුව, උසස් අධ්‍යාපන ආයතනවල එකඟතාව ඇතිව උසස් අධ්‍යාපන ආයතනවල ත්‍රිවාර්ෂික අයවැය සකස් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට බලය ඇත. උසස් අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ත්‍රිවාර්ෂික අයවැය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ සහිතව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 100 වැනි වගන්තියට අනුව, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් ශීර්ෂ අංක 214 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද පරිදි උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කරයි.

7.1 විශ්වවිද්‍යාල පද්ධතියේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ සාරාංශ ක්‍රියා පටිපාටිය



i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 (ii) වගන්තියට අනුව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ඔවුන්ගේ අයවැය ඇස්තමේන්තු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශීර්ෂ අංක 214 යටතේ සියලුම විශ්වවිද්‍යාල සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද "අයවැය කැඳවීම" අනුව ඔවුන්ගේ අනුමැතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරයි.

ii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන සඳහා වන වාර්ෂික ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදාන නිර්දේශ කරන අතර විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත් කරනු ඇත. වියදම් දැරීමට බලය පැවරීම සහ වර්ෂය සඳහා රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සහ වාර්ෂික අයවැය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් චක්‍රලේඛ උපදෙස්

සහිතව අනුමත ප්‍රතිපාදන නිකුත් කරනු ලබයි. ඒ අනුව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන ඔවුන්ගේ වාර්ෂික අයවැය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරයි.

iii. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 100 (2) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සඳහා වෙන් කර ඇති ප්‍රදාන මත පදනම්ව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන පාලන අධිකාරිය විසින් ඔවුන්ගේ අවශ්‍යතා සඳහා මුදල් යෙදවීම සඳහා වන වියදම් අයවැය තීරණය කරයි.

- අංක 02/2019 මූල්‍ය චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැයට (TEC) යටත්ව අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සමඟ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

- 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වැනි වගන්තියට අනුව, ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 500,000/- කට වැඩි මුදලක් ලබා ගැනීමට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නිර්දේශ කරන ලද පරිදි මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව අවශ්‍ය වේ. විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලසුම් අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව අරමුදල් නිර්දේශ කරයි.

- මූල්‍ය රෙගුලාසිවලට අනුව, මූල්‍ය සීමාවන් තීරණය කරනු ලබන්නේ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල පාලන අධිකාරීන් විසිනි.

- FR 135. අවසරය –FR 136; අනුමැතිය -FR 137; සහතික කිරීම -FR 138; අත්සන් කිරීමේ බලතල -FR 139-141 ප්‍රකාරව විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පවරනු ලබන මූල්‍ය සීමාවන්ට යටත්ව වියදම් දරනු ලැබේ.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් වියදම් කළමනාකරණය සහ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශ පිළිබඳ නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛය අනුගමනය කළ යුතුය.

iv. විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන ඔවුන්ගේ මාසික මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණය (වියදම් තොරතුරු) සකස් කර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කලින් කලට ලබා දෙන මාර්ගෝපදේශයන්ට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත ජාතික අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

v. විශ්වවිද්‍යාල විසින් ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණය මත පදනම්ව ජාතික අයවැය දෙපාර්තමේන්තුව ඔවුන්ගේ නිර්දේශ සමඟ නිදහස් කිරීමේ නියෝග (release orders) නිකුත් කරයි.

vi. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විශ්වවිද්‍යාලයට/උසස් අධ්‍යාපන ආයතන වෙත අරමුදල්/මුදල් සෘජුවම නිකුත් කරයි.

- විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අරමුදල් රජයේ ප්‍රදානයක් ලෙස

වාර්තා කරයි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අරමුදල් භාණ්ඩාගාරයට සිදු කරන වියදම් ලෙස වාර්තා කරයි.

vii. විශ්වවිද්‍යාල උපචිත පදනම මත මූල්‍ය වාර්තා තබා ගන්නා අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව මූල්‍ය තොරතුරු සකස් කරයි.

- මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික මූල්‍ය තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කෙරේ.

- මූල්‍ය වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත විගණනය කරන ලද මූල්‍ය තොරතුරු සහිත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශීර්ෂ අංක 214 සඳහා වන විසර්ජන ගිණුම්, මූල්‍ය වර්ෂය අවසන් වූ පසු විගණකාධිපති වෙත ඉදිරිපත් කෙරේ.

7.2 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම/භාවිත කිරීම

ප්‍රදාන	2023 වර්ෂය			2024 වර්ෂය		
	මුළු වෙන් කිරීම	නිකුත් කළ සම්පූර්ණ අරමුදල්	නිකුත් කළ /භාවිත කළ අනුපාතය, මුළු ප්‍රතිපාදනයෙන් %ක් ලෙස	මුළු වෙන් කිරීම	නිකුත් කළ සම්පූර්ණ අරමුදල්	නිකුත් කළ /භාවිත කළ අනුපාතය, මුළු ප්‍රතිපාදනයෙන් %ක් ලෙස
	රු.මිලියන	රු.මිලියන		රු.මිලියන	රු.මිලියන	
පුනරාවර්තන	59,871	58,289	97%	65,211	64,483	99%
ප්‍රාග්ධන	6,700	6,515	97%	7,500	6,744	90%
මුළු	**66,571**	**64,804**	**97%**	**72,711**	**71,227**	**98%**

වගුව 7.2 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම/භාවිතය

7.2.1 පුනරාවර්තන ප්‍රදානය (RBG)

රු.මිලියන

පුනරාවර්තන වියදම් කාණ්ඩය	වෙන් කිරීම් 2024	2024 දී නිකුත් කරන ලද අරමුදල්
පුද්ගල පඩිනඩි	54,131	53,504
වෙනත් පුනරාවර්තන	8,480	8,379
මහපොළ සහ ශිෂ්‍යාධාර	2,600	2,600
එකතුව	**65,211**	**64,483**


වගුව 7.2.1 පුනරාවර්තන ප්‍රදානය (RBG)

7.2.2 ප්‍රාග්ධන ප්‍රදාන (CBG)

රු.මිලියන

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	වෙන් කිරීම් 2024	2024 දී නිකුත් කරන ලද අරමුදල්
ඉදිකිරීම් ව්‍යාපෘති	3,326	
ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම	1,566	
ස්ථාවර වත්කම් අත් කර ගැනීම	1,520	6,179
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති	214	
පර්යේෂණ හා සංවර්ධන	309	
අයවැය යෝජනා	565	565
එකතුව	**7,500**	**6,744**

වගුව 7.2.2 ප්‍රාග්ධන ප්‍රදාන (CBG)




7.2.3 අයවැය යෝජනා – 2024

රු.මිලියන

ප්‍රාග්ධන වියදම් කාණ්ඩය	වෙන් කිරීම් 2024	2024 දී නිකුත් කරන ලද අරමුදල්
විශ්වවිද්‍යාල තුළ තාක්ෂණ පීඨ පිහිටුවීම.	565	565
එකතුව	**565**	**565**

වගුව 7.2.3 අයවැය යෝජනා – 2024

7.3 යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති – 2024




0 – 30 % -
අත්තිවාරම, කොන්ක්‍රීට් ව්‍යුහයෙන් 50% ක් සහ බිත්ති නිම කිරීම

31 – 50% -
100%ක් කොන්ක්‍රීට් ව්‍යුහය සහ බිත්ති නිම කිරීම.

51 – 70% -
සියලුම කපරාරු වැඩ, ජලනල හා විදුලි රැහැන් නිම කිරීම.

71 – 99% -
දොරවල්, ජනෙල්, බිම් නිම කිරීම, පින්තාරු කිරීම, ජලනල, සනීපාරක්ෂක, විදුලි උපාංග සහ බාහිර වැඩ නිම කිරීම.



7.4 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය – 2020 සිට 2024 දක්වා

රු.මිලියන

	2020	2021	2022	2023	2024
1. රජයේ ප්‍රතිපාදන					
පුනරාවර්තන	49,497	53,995	56,864	59,871	65,211
ප්‍රාග්ධන	9,545	8,400	4,700	6,700	7,500
2. වියදම					
පුනරාවර්තන	49,457	52,490	54,975	58,289	64,483
ප්‍රාග්ධන	9,545	6,549	3,042	6,515	6,744

රු.මිලියන

	2020	2021	2022	2023	2024
3. ශිෂ්‍ය මූල්‍ය ආධාර					
මහපොළ	1,420	1,138	930	1192	1141
ශිෂ්‍යාධාර	705	862	895	1023	1459

සටහන *: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අරමුදල් පුනරාවර්තන, ප්‍රාග්ධන සහ ශිෂ්‍ය මූල්‍ය ආධාරවල වියදම් ලෙස සටහන් කර ඇත.*

වගුව 7.4 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතය - 2020 සිට 2024 දක්වා

7.5 මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීම - 2024

රු.මිලියන

අංකය	විද්‍යාලය / ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	163	32	195
2	කොළඹ විශ්වවිද්‍යාලය	149	45	194
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	186	93	279
4	කැලණිය විශ්වවිද්‍යාලය	104	163	267
5	මොරටුව විශ්වවිද්‍යාලය	73	31	104
6	රුහුණු විශ්වවිද්‍යාලය	98	166	264
7	යාපනය විශ්වවිද්‍යාලය	88	150	238
8	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	19	123	142
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	37	124	161
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	56	112	168
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	50	88	138
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	43	54	97
13	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	14	49	63
14	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	29	50	79
15	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	3	7	10
16	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	4	13	17
17	වව්නියාව විශ්වවිද්‍යාලය	7	32	39
18	ත්‍රිකුණාමල මණ්ඩපය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	9	42	51
19	ශ්‍රීපාලී මණ්ඩපය	4	20	24
20	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	2	34	36
22	තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	3	31	34
	එකතුව	**1141**	**1459**	**2600**

වගුව 7.5 මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීම

7.6 2024.12.31 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව

අංකය	විද්‍යාලය / ආයතනය	මහපොළ	ශිෂ්‍යාධාර	එකතුව
1	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	7670	779	8449
2	කොළඹ විශ්වවිද්‍යාලය	7965	1633	9598
3	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	9619	1315	10934
4	කැලණිය විශ්වවිද්‍යාලය	7181	3469	10650
5	මොරටුව විශ්වවිද්‍යාලය	4351	838	5189
6	රුහුණ විශ්වවිද්‍යාලය	6180	3888	10068
7	යාපනය විශ්වවිද්‍යාලය	5004	3249	8253
8	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	1570	2988	4558
9	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල	2437	2858	5295
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	2837	2916	5753
11	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	3075	3094	6169
12	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	2946	1039	3985
13	සෞන්දර්ය විශ්වවිද්‍යාලය	661	1092	1753
14	ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	1658	1327	2985
15	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	359	62	421
16	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	622	444	1066
17	වව්නියාව විශ්වවිද්‍යාලය	757	1317	2074
18	ත්‍රිකුණාමලය මණ්ඩපය	474	1232	1706
19	ශ්‍රීපාලි මණ්ඩපය	182	412	594
20	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	159	904	1063
21	තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	311	1184	1495
	එකතුව	**66018**	**36040**	**102058**

වගුව 7.6 31.12.2024 දිනට මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන්නන් සංඛ්‍යාව

7.7 මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය

මහපොළ ශිෂ්‍යත්වය, විශ්වවිද්‍යාලවලින් ඉල්ලා සිටින පරිදි මහපොළ භාරකාර අරමුදල මඟින් සිසුන්ට සෘජුවම ගෙවනු ලැබේ. දැනට ගෙවනු ලබන රු.2550/- ක මහපොළ ශිෂ්‍යත්ව වාරිකය, මහපොළ භාරකාර අරමුදල මඟින් ලබා දෙන අතර ශේෂය වන රු. 2450/- ක මුදල මහා භාණ්ඩාගාරයේ දායකත්වයෙන් ලබා දෙනු ලැබේ.

විස්තරය	මහපොළ	ශිෂ්‍යාධාර
ශිෂ්‍යත්ව වාරිකය (රු.)	5,000/-	4,000/-
මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.)	2,550/-	-
භාණ්ඩාගාරය - දායකත්වය (රු.)	2,450/-	4,000/-
වසරකට වාරික ගණන	10	10
මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන සිසුන් සංඛ්‍යාව	66018	36040

වගුව 7.7 මහපොළ සහ ශිෂ්‍යාධාර සාරාංශය

8. විශ්වවිද්‍යාල කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව

2024 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විවිධ සේවක කාණ්ඩ 5ක් යටතේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 321ක් වූ අතර, 2024 දෙසැම්බර් 31 වන විට සේවයේ නියුක්ත සංඛ්‍යාව 215 ක් විය. පුරවා නොමැති පුරප්පාඩු ගණන 106 කි.

	කාර්ය මණ්ඩල කාණ්ඩය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින කාර්ය මණ්ඩලය		පුරප්පාඩු
				ස්ථිර	තාවකාලික	
ප්‍රාථමික මට්ටම	නුපුහුණු	U-PL 1	45	34	0	11
	අර්ධ පුහුණු	U-PL 2	1	1	0	0
	පුහුණු	U-PL 3	17	12	0	5
ද්විතියික මට්ටම	කළමනාකරණ සහකාර	U-MN 1	144	94	0	50
	කළමනාකරණ සහකාර (IT)	U-MT 1	4	2	0	2
	සහකාර නිලධාරී කාණ්ඩය 2	U-MN 2	8	4	0	4
	සහකාර නිලධාරී කාණ්ඩය 1	U-MN 3	2	1	0	1
	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කළමනාකරණ සහකාර	U-MN 4	25	21	0	4
තෘතීයික මට්ටම	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය 2	U-AS 1	6	1	0	5
	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය කාණ්ඩය 1	U-AS 2	6	5	0	1
	කනිෂ්ඨ විධායක	U-EX 1	18	12	0	6
ජ්‍යෙෂ්ඨ මට්ටම	විධායක (මධ්‍යම මට්ටම)	U-EX 2	29	21	0	8
	විධායක (ජ්‍යෙෂ්ඨ මට්ටම)	U-EX 3	8	3	0	5
	ජ්‍යෙෂ්ඨ මට්ටමේ අධ්‍යයන	U-AC 3 සිට U-AC 5 දක්වා	8	4	0	4
			321	**215**	**0**	**106**

වගුව 8 2024 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා තොරතුරු

8.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ නව පත්වීම්, උසස්වීම්, සේවය ස්ථිර කිරීම්

2024 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත විධායක ශ්‍රේණියේ සේවකයින්ගේ නව පත්වීම් දෙකක් (02) සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින්ගේ නව පත්වීම් දෙකක් (02) සහ තාක්ෂණික සහකාරවරුන් (තාවකාලික) තිදෙනෙක් (03), කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ස්ථිර) තිදෙනෙක් (03) සහ පරිගණක ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම) එක් අයෙකු (01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පත් කරන ලදී. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් දෙදෙනෙකු (02) සේවයේ ස්ථිර කර ඇති අතර සේවකයින් තිදෙනෙකු (03) උසස් කරන ලදී.

8.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ගේ අභ්‍යන්තර මාරුවීම්, සේවා සම්මාන සහ විශේෂ අරමුණු නිවාඩු

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ සේවකයින් දෙදෙනෙකු (02) විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් සේවා සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඔවුන්ට ඒ වෙනුවෙන් මුදල් ත්‍යාගයන් ලබා දෙන ලදී.

8.3 සේවකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය හැරයාම්

2024 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සිට අනෙකුත් විශ්වවිද්‍යාල/උසස් විශ්වවිද්‍යාල වෙත ස්ථාන මාරුවීම් දෙකක් (02) සිදු කරන ලද අතර, අනෙකුත් විශ්වවිද්‍යාල/උසස් විශ්වවිද්‍යාලවලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ස්ථාන මාරුවීම් තුනක් (03) සිදු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම පූර්ව නිවාඩු ගැනීම් හතරක් (04), විශ්‍රාම යෑම් හතරක් (04), ඉල්ලා අස්වීම් නවයක් (09) සහ තනතුර හැර යාම් දෙකක් (02) වාර්තා විය.

වර්ෂය තුළ නිවාඩු ලබා දීම් පහත සඳහන් පරිදි සිදු විය.

නිවාඩු වර්ගය	නිවාඩු ගණන
වැටුප් රහිත නිවාඩු	09
මාතෘ නිවාඩු	12
පීතෘ නිවාඩු	0
ඉකුත් නිවාඩු	08
වෛද්‍ය මණ්ඩලයේ නිවාඩු	0
අධ්‍යයන නිවාඩු	0
සප්ත වාර්ෂික නිවාඩු	04
සප්ත වාර්ෂික නිවාඩු මත UGC හි සේවය කිරීමට ලබා දුන් පත්වීම්	03
විදේශ ගමන් සඳහා නිවාඩු	01
1989.09.29 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 406 ප්‍රකාරව විදේශයක රැකියාවක් කිරීම සඳහා වැටුප් රහිත නිවාඩු	0
PED 05/2022, PED 05/2022 (i), PED 05/2022 (ii) අනුව දිවයිනෙන් බැහැරව ගත කිරීමට වැටුප් රහිත නිවාඩු	03
විභාගවලට පෙනී සිටීම සඳහා වැටුප් සහිත නිවාඩු	0

වගුව 8.3 වර්ෂය තුළ වාර්තා කර ඇති නිවාඩු ලබා ගැනීම් ගණන

8.4 සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2024 වර්ෂයේ දී ශ්‍රී කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථිර සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

8.5 පැවරුම් පදනම මත සිදු කළ පත්වීම්

2024 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැවරුම් පදනම මත පත්වීම් දෙකක් (02) ලබා දී ඇත.

8.6 සේවය දීර්ඝ කිරීම්

2024 වර්ෂය තුළ තාක්ෂණික සහායකයින් දෙදෙනෙකුගේ (02) සේවය දීර්ඝ කර තිබුණි.

8.7 සුහද මාරුවීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සිට ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය දක්වා – 01

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දක්වා – 01

8.8 විශේෂ රැස්වීම

ආචාර්ය හරිනි අමරසූරිය (ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය), ආචාර්ය මධුර සෙනෙවිරත්න (ගරු නියෝජ්‍ය අමාත්‍ය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය), නාලක කළුවැව මහතා (අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්) 2024.11.22 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැමිණියහ.



9. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය ලබා දීමේ වගකීමට අනුකූලව මානව සම්පත් අංශය 2024 දී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. මානව සම්පත් අංශයට පවරා ඇති කාර්යයන් යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත සාරාංශගත කර ඇත.

1) 2024 වර්ෂය තුළ පරිපාලන කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා කරන ලද පත්වීම්/උසස්වීම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) (ii) වගන්තියට අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024 වර්ෂයේදී පහත සඳහන් පරිපාලන කාර්ය මණ්ඩල උසස්වීම් සඳහා අනුමැතිය ලබා දී ඇත.

අ. උසස්වීම්

අංකය	තනතුර	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතන	උසස්වීම් සංඛ්‍යාව
2024.04.04 දින සිට ක්‍රියාත්මක වන උසස්වීම්			
01	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	03
		• කොළඹ විශ්වවිද්‍යාලය	06
		• ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	04
		• යාපනය විශ්වවිද්‍යාලය	02
		• සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	02
		• වව්නියාව විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා උඹව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	02
		• පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
		• වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය	01
		• කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය	01
		• කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	01
		• ශ්‍රී පාලි මණ්ඩපය	01
		• ත්‍රිකුණාමලය මණ්ඩපය	02

අංකය	තනතුර	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතන	උසස්වීම් සංඛ්‍යාව
02	ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	01
		• කොළඹ විශ්වවිද්‍යාලය	03
		• පේරාදෙණිය විශ්වවිද්‍යාලය	03
		• රුහුණු විශ්වවිද්‍යාලය	02
		• ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
		• දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය	01
03	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන)	• ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	01
04	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා)	• ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	01
		• කැලණිය විශ්වවිද්‍යාලය	01
		• පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	01
		• කොළඹ විශ්වවිද්‍යාලය	01
05	නියෝජ්‍ය ලේඛකාධිකාරී (පුස්තකාල සේවා)	• රුහුණ විශ්වවිද්‍යාලය	01
		• කොළඹ විශ්වවිද්‍යාලය	01
06	නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති සහ ප්‍රලේඛන)	• පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01

වගුව 9.1.(අ) උසස්වීම්

අංකය	තනතුර	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතන	උසස්වීම් සංඛ්‍යාව
APER පරිපාටිය - 2024.04.04 දින සිට ක්‍රියාත්මක වන උසස්වීම්			
07	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	• කැලණිය විශ්වවිද්‍යාලය	04
		• කොළඹ විශ්වවිද්‍යාලය	04
		• යාපනය විශ්වවිද්‍යාලය	05
		• ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	03
		• ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	01
		• පේරාදෙණිය විශ්වවිද්‍යාලය	08
		• රුහුණු විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	04
		• ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	01
		• සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	04
		• වව්නියාව විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	02
		• ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	02
		• ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල	01
		• තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය	01
08	ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	• ලංකා රජරට විශ්වවිද්‍යාලය	02
		• ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල	01
		• ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	02
		• කැලණිය විශ්වවිද්‍යාලය	02
		• පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
		• රුහුණ විශ්වවිද්‍යාලය	01
		• ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	02
		• ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	01
		• තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	01
		• මානව සම්පත් අභිවර්ධන ආයතනය	01
		• පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
		• කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	01

වගුව 9.1(ආ) උසස් වීම් (*APER පරිපාටිය*)

2) 2024 වර්ෂය තුළ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම්/උසස්වීම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) (ii) වගන්තියට අනුව, 2024 වර්ෂයේදී පහත සඳහන් පත්වීම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත.

අ . පත්වීම්

අංකය	තනතුර	විශ්වවිද්‍යාලය	පත්වීම් ගණන
01	**සහකාර අධ්‍යක්ෂ/ ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය (පුද්ගලයාට පෞද්ගලික වන සේ)** (Personal to holder Basis)	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01
02	**ප්‍රධාන වෛද්‍ය නිලධාරී**	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
03	**වෛද්‍ය නිලධාරී**	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	01
04	**ව්‍යාපෘති කළමනාකරු ඉදිකිරීම් කටයුතු**	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	01
	එකතුව		**04**

වගුව 9.2 (අ) අනෙකුත් කාර්ය මණ්ඩල ශ්‍රේණිවලට සිදු කරන ලද පත්වීම්

ආ. උසස්වීම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) (ii) වගන්තියට අනුව, 2024 වර්ෂයේ දී පහත සඳහන් අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණි සඳහා උසස්වීම් සිදු කරන ලදී.

අංකය	තනතුර	විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතන	පත්වීම් ගණන
01	**ප්‍රධාන තාක්ෂණික නිලධාරී**	• පේරාදෙණිය විශ්වවිද්‍යාලය • කොළඹ විශ්වවිද්‍යාලය • ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය • කැලණිය විශ්වවිද්‍යාලය	01 05 01 01
02	**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්ෂණික නිලධාරී**	• කොළඹ විශ්වවිද්‍යාලය • ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය • පේරාදෙණිය විශ්වවිද්‍යාලය	03 02 01
03	**වැඩ ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණිය**	• ත්‍රිකුණාමලය මණ්ඩපය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	01
04	**ගොවිපල කළමනාකරු II ශ්‍රේණිය**	• ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	01
05	**පාලක (උද්‍යාන) II ශ්‍රේණිය**	• ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
	එකතුව		**17**

වගුව 9.2 (ආ) අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණි සඳහා සිදු කළ උසස්වීම්

(3) වෘත්තීය සමිති රැස්වීම්

2024 වර්ෂය තුළ පරිපාලන මාණ්ඩලික සංගම් රැස්වීම් දෙකක් (02) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සංගම් රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

(4) අන්තර් විශ්වවිද්‍යාල ස්ථාන මාරු - 2024

විශ්වවිද්‍යාල පනතේ 78 වගන්තිය අනුව, 2024 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද මුළු ස්ථාන මාරු සංඛ්‍යාව පහත පරිදි වේ;

- පරිපාලන කාර්ය මණ්ඩලය - **11**
- අනධ්‍යයන පරිපාලන නොවන කාර්ය මණ්ඩලය - **58**

(5) සේවක සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනය

i. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ආයතන/ආයතන සඳහා පහත සඳහන් නව සේවක සංඛ්‍යා තනතුරු අනුමත කර/සීමා කර ඇත.

(අ) 2024 වසර සඳහා නව සේවක සංඛ්‍යාව - කාණ්ඩ අනුව

සේවක කාණ්ඩය	අනුමත තනතුරු ගණන	සීමා කරන ලද තනතුරු ගණන
අධ්‍යයන කාර්ය මණ්ඩලය	119	4
පීඨාධිපති	01	0
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය	43	0
පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය	14	5
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	7	0
කළමනාකරණ සහකාර	21	5
තාක්ෂණික කාර්ය මණ්ඩලය	48	30
ප්‍රාථමික (පුහුණු / අර්ධ පුහුණු / නුපුහුණු)	41	22
එකතුව	**294**	**66**

වගුව 9.5.i.(අ) 2024 වසර සඳහා නව සේවක සංඛ්‍යාව - කාණ්ඩ අනුව

(ආ) උසස් අධ්‍යාපන ආයතනයන් හි අනුමත සේවක සංඛ්‍යාව

උසස් අධ්‍යාපන ආයතනය	අනුමත තනතුරු ගණන	සීමා කරන ලද තනතුරු ගණන
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	03	03
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01	01
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	36	03
කැලණිය විශ්වවිද්‍යාලය	02	0
මොරටුව විශ්වවිද්‍යාලය	09	03

උසස් අධ්‍යාපන ආයතනය	අනුමත තනතුරු ගණන	සීමා කරන ලද තනතුරු ගණන
යාපනය විශ්වවිද්‍යාලය	01	0
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	5	5
රුහුණ විශ්වවිද්‍යාලය	20	0
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	136	42
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	01	0
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	17	08
වව්නියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	08	0
ත්‍රිකුණාමලය මණ්ඩපය	37	0
පශ්චාත් උපාධි විද්‍යා ආයතනය	01	01
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	02	0
වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය	01	0
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය	14	0
එකතුව	**294**	**66**

වගුව 9. 5.i (අ) උසස් අධ්‍යාපන ආයතනයන් හි අනුමත සේවක සංඛ්‍යාව

ii. 2024 වසර සඳහා උසස් අධ්‍යාපන ආයතන/ආයතනවල පහත පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

(අ) කාණ්ඩය අනුව

සේවක කාණ්ඩය	පුරප්පාඩු පිරවීම සඳහා අනුමත තනතුරු ගණන
අධ්‍යයන කාර්ය මණ්ඩලය	404
තාවකාලික කාර්ය මණ්ඩලය	12
පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය	21
වෛද්‍ය කාර්ය මණ්ඩලය	03
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	04
කළමනාකරණ සහකාර	30
තාක්ෂණික කාර්ය මණ්ඩලය	62
ප්‍රාථමික (පුහුණු/අර්ධ පුහුණු/නුපුහුණු)	44
එකතුව	**580**

වගුව 9.5.ii. (අ) උසස් අධ්‍යාපන ආයතනයන් හි අනුමත සේවක සංඛ්‍යාව - කාණ්ඩය අනුව

(ආ) උසස් අධ්‍යාපන ආයතන අනුව

උසස් අධ්‍යාපන ආයතනය	පූරප්පාඩු පිරවීම සඳහා අනුමත තනතුරු ගණන
කොළඹ විශ්වවිද්‍යාලය	95
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	57
කැලණිය විශ්වවිද්‍යාලය	29
මොරටුව විශ්වවිද්‍යාලය	11
රුහුණ විශ්වවිද්‍යාලය	72
යාපනය විශ්වවිද්‍යාලය	40
නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	17
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	39
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	37
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	55
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	03
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	22
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	16
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	02
වව්නියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	02
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	03
ත්‍රිකුණාමලය මණ්ඩපය	11
තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	21
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	08
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය	01
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	03
වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය	35
ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය	01
එකතුව	**580**

වගුව 9.5.ii. (ආ) උසස් අධ්‍යාපන ආයතන අනුව

(6) කළමනාකරණ කමිටුව

2024 වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් දහසය (16) ක් පවත්වන ලදී.

(7) සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු කිරීම

2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අයදුම්පත් යොමු කරන ලදී.

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය	ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණන
1	කොළඹ විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	101
2	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	78
3	කැලණිය විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	100
4	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	100
5	මොරටුව විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	47
6	යාපනය විශ්වවිද්‍යාලය සහ අනුබද්ධ ආයතන	37
7	රුහුණු විශ්වවිද්‍යාලය	99
8	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	48
9	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව සහ අනුබද්ධ ආයතන	36
10	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	41
11	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	33
12	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	49
13	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	31
14	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	19
15	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	14
16	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	03
17	වව්නියාව විශ්වවිද්‍යාලය	08
18	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	04
	එකතුව	**848**

වගුව 9.7 සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු කිරීම

(8) අධ්‍යයන කාර්යමණ්ඩල තනතුරුවලට අදාළ තේරීම් කමිටු සඳහා UGC නාමිකයන් පත් කිරීම

2024 වර්ෂය තුළ පහත අධ්‍යයන කාර්ය මණ්ඩල තේරීම් කමිටු සඳහා UGC නාමිකයන් පත් කරන ලදී.

අ. දැන්වීම් මඟින් පුරප්පාඩු කැඳවන ලද මහාචාර්ය තනතුර (විඥාපක මහාචාර්ය)

අංකය	විශ්වවිද්‍යාලය	තේරීම් කමිටු ගණන
1.	කොළඹ විශ්වවිද්‍යාලය	2
2.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	2
3.	කැලණිය විශ්වවිද්‍යාලය	3
4.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	3
5.	යාපනය විශ්වවිද්‍යාලය	1
	එකතුව	**11**

වගුව 9.8(අ) දැන්වීම් මඟින් පුරප්පාඩු කැඳවන ලද මහාචාර්ය තනතුර (විඥාපක මහාචාර්ය)

ආ. සහාය මහාචාර්ය/මහාචාර්ය තනතුරට උසස් කිරීම (කුසලතා අනුව)

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය / මණ්ඩපය	තේරීම් කමිටු ගණන
1.	කොළඹ විශ්වවිද්‍යාලය	18
2.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	12
3.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	14
4.	කැලණිය විශ්වවිද්‍යාලය	11
5.	මොරටුව විශ්වවිද්‍යාලය	11
6.	යාපනය විශ්වවිද්‍යාලය	8
7.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	16
8.	රුහුණු විශ්වවිද්‍යාලය	17
9.	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	7
10.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	8
11.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	9
12.	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	9
13.	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	6
14.	වව්නියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	2
15.	ශ්‍රී පාලි මණ්ඩපය	2
16.	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	2
17.	පෙවරසායන, අණුක පෙවවේද හා පෙවතාක්ෂණ ආයතනය	1
	එකතුව	**153**

වගුව 9.8(ආ) සහාය මහාචාර්ය /මහාචාර්ය තනතුරට් උසස් කිරීම (කුසලතා අනුව)

ඇ. නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට උසස් කිරීම (කුසලතා අනුව)

අංකය	විශ්වවිද්‍යාලය /මණ්ඩපය	තේරීම් කමිටු ගණන
1.	කොළඹ විශ්වවිද්‍යාලය	1
2.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	1
	එකතුව	**2**

වගුව 9.8(ඇ) නියෝජ්‍ය පුස්තකාලයාධිපති තනතුරට උසස් කිරීම (කුසලතා අනුව)

ඈ. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I තනතුරට බඳවා ගැනීම/ උසස් කිරීම

අංකය	ආයතනය	තේරීම් කමිටු ගණන
1.	ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය	7
2.	තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	3

අංකය	ආයතනය	තේරීම් කමිටු ගණන
3.	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	2
4.	ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය	1
5.	කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය	2
6.	වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය	3
7.	ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය	1
8.	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	1
	එකතුව	**20**

වගුව 9.8(ඇ) කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I තනතුරට බඳවා ගැනීම/ උසස් කිරීම

(9) 2024 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු පත්වීම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂා කිරීම

(අ) කථිකාචාර්ය (ආධුනික) තනතුර

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය	අනුමත පත්වීම් ගණන	අනුමත නොකළ පත්වීම් ගණන
1.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	-	02
2.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01	-
3.	ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	-	02
	එකතුව	**01**	**04**

වගුව 9.9.(අ) කථිකාචාර්ය (ආධුනික) තනතුර

(ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණියේ තනතුර

අංකය	විශ්වවිද්‍යාලය / ආයතනය	අනුමත පත්වීම් ගණන	අනුමත නොකළ පත්වීම් ගණන
1.	ජෛව රසායන විද්‍යාව අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය	-	01
2.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01	-
3.	කැලණිය විශ්වවිද්‍යාලය	01	-
	එකතුව	**02**	**01**

වගුව 9.9(ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණියේ තනතුර

10. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු (QAC)

2024 වසර, තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට අභියෝගාත්මක වර්ෂයක් විය. මෙම වසර අවසාන වීමට පෙර සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක මෙන්ම 2023, 2022 සහ 2021 වර්ෂවල නිම කිරීමට ශේෂව තිබූ කාර්යයන් බොහොමයක් විය.

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ කාර්ය මණ්ඩලයට, එහි අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා වන උපදේශකයෙකු, නියෝජ්‍ය ලේකම්වරයෙකු, කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු (MA), තාක්ෂණික සහකාරවරුන් හතර දෙනෙකු (කොන්ත්‍රාත් පදනම මත) සහ එක් වැඩ සහායකයෙකු ඇතුළත් වේ.එක් තාක්ෂණික සහකාරවරයෙකු 2024 මාර්තු මාසයේදී සේවයෙන් ඉවත් විය. නව තාක්ෂණික සහායකයින් තිදෙනෙකු (කොන්ත්‍රාත් පදනම මත) වැඩ ආරම්භ කර යෝජනා ඇගයීම සඳහා පුහුණුව ලබමින් සිටිති.

2024 වසරට අදාළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම අනෙකුත් අදාළ කරුණු සම්බන්ධයෙන් තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපතිවරයා සහ සාමාජිකයින් ද තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයට මහ පෙන්වූහ.

<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේ ඉලක්ක අංක 3</u>: ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නවෝත්පාදන හරහා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.

<u>අරමුණු අංක 08 -</u> විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන බව තහවුරු කිරීම පිණිස අඛණ්ඩ පරීක්ෂණය, අධීක්ෂණය සහ සංවර්ධනය කිරීම.

10.1. විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය වීම

රාජ්‍ය විශ්වවිද්‍යාල 17 හි සියලුම අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකවලින් කාර්තුමය ප්‍රගති වාර්තා ලැබිණි. 2024 තුන්වන කාර්තුව වන විට, තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථාන (CQAs) කාර්ය සාධන ලකුණු කාඩ්පතේ ලකුණු වලින් අවම වශයෙන් 85%ක් ලබා ගෙන ඇත.

10.2. පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශ සංවර්ධනය කිරීම

එක් මඩුල්ලක් විසින් විෂය ඉම්ලකුණු කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී.

10.3 වැඩසටහන් සමාලෝචන පැවැත්වීම (PRs)

1. අභ්‍යන්තරව පිරිනමන උපාධි වැඩසටහන් පිළිබඳ වැඩසටහන් සමාලෝචන

2020 වැඩසටහන් සමාලෝචනවල කොටසක් ලෙස, විද්‍යා, ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ භූ විඥාපන පීඨවල සමාලෝචන 59ක් සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. කොවිඩ් 19 හේතුවෙන්, 2020 වසරේ කිරීමට නියමිතව තිබූ සමාලෝචන, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව 2021 දක්වා කල් දමන ලදී. නැවතත්, ඉදිරිපත් කරන ලද ස්වයං ඇගයීම් වාර්තාවල තිබූ ගැටළු කිහිපයක් හේතුවෙන්,

සමාලෝචනවල සංයුතිය වෙනස් කරන ලද අතර, සමාලෝචන ගණන 74 දක්වා වැඩි කරන ලදී.

සමාලෝචන අදියර දෙකකින් එනම්, අදියර 1 සඳහා 37 සහ 2 අදියර සඳහා 37 මාර්ගගත සමාලෝචන ක්‍රමවේදය සහ ක්ෂේත්‍ර සංචාරයක් මඟින් සිදු කිරීමට නියමිතව තිබුණි. 2024 අවසානය වන විට අදියර 1 සහ 2 සමාලෝචනවල තත්ත්වය සඳහා 10.3.1 වගුව බලන්න.

අංකය	අදියර 1	
1	සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා	37
2	සිදු කිරීමට ඇති ක්ෂේත්‍ර චාරිකා (2024 දෙසැම්බර් 31 දිනට)	0
3	ලැබී ඇති අවසන් සමාලෝචන වාර්තා (2024 දෙසැම්බර් 31 දක්වා)	36
4	සංස්කරණය සඳහා යවා ඇති අවසන් වාර්තා ගණන	24
5	ලැබී ඇති සංස්කරණය කළ වාර්තා	14
6	ප්‍රකාශයට පත් කර ඇති වැඩසටහන් සමාලෝචන වාර්තා	0
අංකය	**අදියර 2**	
1	සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා	28
2	සිදු කිරීමට ඇති ක්ෂේත්‍ර චාරිකා (2024 දෙසැම්බර් 31 දිනට)	09
3	ලැබී ඇති අවසන් සමාලෝචන වාර්තා (2024 දෙසැම්බර් 31 දක්වා)	20
4	සංස්කරණය සඳහා යවා ඇති අවසන් වාර්තා ගණන	16
5	ලැබී ඇති සංස්කරණය කළ වාර්තා	13
6	ප්‍රකාශයට පත් කර ඇති වැඩසටහන් සමාලෝචන වාර්තා	0

වගුව 10.3.1 අභ්‍යන්තරව පිරිනමන උපාධි වැඩසටහන් පිළිබඳ වැඩසටහන් සමාලෝචන

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ ඉගෙනුම් මාදිලියේ වැඩසටහන් සඳහා වෙනම අත්පොතක් භාවිතා කරන බැවින්, වෙනම මාර්ගගත සමාලෝචන පද්ධතියක් භාවිතා කරන ලදී.

සම්පූර්ණ කරන ලද සමාලෝචන සඳහා ක්‍රියාකාරී සැලසුම් නිරීක්ෂණය කිරීමේදී, ආයතනික සමාලෝචන සඳහා සංවර්ධනය කරන ලද එම අධීක්ෂණ ක්‍රියාවලියම භාවිතා වේ.

2. බාහිර උපාධි වැඩසටහන් (EDP) සමාලෝචන පැවැත්වීම

අදියර 2 සමාලෝචන වටයට බාහිර උපාධි වැඩසටහන් (EDP) සමාලෝචන 20 ක් ඇතුළත් වූ අතර ඉන් 18ක් සම්පූර්ණ කරන ලද අතර සමාලෝචන 2ක් කිරීමට ඉතිරිව පැවතුණි.

බාහිර උපාධි වැඩසටහන් සමාලෝචනවල මීළඟ අදියර 2024 සඳහා සැලසුම් කර ඇත. බාහිර උපාධි වැඩසටහන්වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම මෙන්ම විද්‍යා හා තාක්ෂණ විෂය ක්ෂේත්‍රවල නව බාහිර උපාධි වැඩසටහන් සඳහා වන නිර්ණායක කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය බව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය සඳහන් කරන ලදී.

	බාහිර උපාධි වැඩසටහන්	
1	සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා	18
2	සිදු කිරීමට ඇති ක්ෂේත්‍ර චාරිකා (2024 දෙසැම්බර් 31 දිනට)	2
3	ලැබී ඇති අවසන් සමාලෝචන වාර්තා (2024 දෙසැම්බර් 31 දක්වා)	16
4	සංස්කරණය සඳහා යවා ඇති අවසන් වාර්තා ගණන	8
5	ලැබී ඇති සංස්කරණය කළ වාර්තා	6
6	ප්‍රකාශයට පත් කර ඇති වැඩසටහන් සමාලෝචන වාර්තා	0

වගුව 10.3.2 බාහිර උපාධි වැඩසටහන් (EDP) සමාලෝචන පැවැත්වීම

3. පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ මානව සම්පත් නොමැතිකම හේතුවෙන් මෙම කටයුතු 2025 අග භාගය දක්වා කල් දමන ලදී.

10.4 ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය 2015 ට අනුකූලව සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම

විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන සුදුසුකම් සිතියම්ගත කිරීම සඳහා, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින්, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතික කිරීමේ මණ්ඩලයක් පිහිටුවන ලදී. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ සහතික කිරීමේ අත්පොත 2025 මුල් භාගයේ දී ප්‍රකාශයට පත් කර බෙදා හරිනු ලැබේ.

ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ 2015 ලේඛනය 2023 මැයි 30 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර එය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා වූ කැබිනට් අනුකමිටුව වෙත යොමු කර ඇත.

10.5 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ සුදුසුකම් සඳහා වූ ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරියේදී සිදුකිරීමට නියමිත ප්‍රතිසංස්කරණ හමුවේ මෙම ක්‍රියාකාරකම ක්‍රියාත්මක නොවීය.

10.6 වෙනත්

- ඇගයීමට නියමිත යෝජනා විශාල ප්‍රමාණයක් තිබූ අතර 2024 දෙසැම්බර් අවසානය වන විට සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කර අවසන් කරන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකම්, විදේශීය ආයතනවලින් ලැබෙන අනෙකුත් විමසීම්, ශ්‍රී ලාංකික මහජනතාව සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ පුද්ගලයින් විසින් ඉල්ලා සිටින තොරතුරු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබා දීම මෙන්ම නව යෝජනා, නව යෝජනා සම්පූර්ණ කිරීමේදී අයදුම්කරුවන් විසින් සිදු කරන පොදු වැරදි පිළිබඳ මග පෙන්වීමක් ලබා දීම. බොහෝ අයදුම්කරුවන් ක්‍රියාවලිය මෙන්ම අයදුම්පත්වල සවිස්තරාත්මක අවශ්‍යතා පිළිබඳව නොදන්නා බව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ නිරීක්ෂණය කරන ලදී.

සම්පූර්ණ කිරීමේදී අයදුම්කරුවන් විසින් සිදු කරන පොදු වැරදි පිළිබඳ මග පෙන්වීමක් ලබා දීම. බොහෝ අයදුම්කරුවන් ක්‍රියාවලිය මෙන්ම අයදුම්පත්වල සවිස්තරාත්මක අවශ්‍යතා පිළිබඳව නොදන්නා බව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ නිරීක්ෂණය කරන ලදී.

- නොවැම්බර් මාසයේ දී බ්‍රිටිෂ් කවුන්සිලය විසින් සංවිධානය කරන ලද "අන්තර්ජාතික අධ්‍යාපනය තුළින් ගුණාත්මක තෘතීයික අධ්‍යාපනයට ප්‍රවේශය පුළුල් කිරීම පිළිබඳ දකුණු ආසියානු ගැඹුරු සංවාදය" යන සමුළුවට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ උපදේශක සහ නියෝජ්‍ය ලේකම් සහභාගී විය.

11. තොරතුරු තාක්ෂණ සහාය

පැවරී ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතීන් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා /පිරිවිතරයන් සකස් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය, පරිගණක, සන්නිවේදන පද්ධති හා ජාලයේ සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2024 වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම සහ පවතින පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා සහ පිරිවිතරයන් සැකසීම, මෘදුකාංග ඇතුළු පරිගණක පද්ධතියේ සහ ජාලයේ සමස්ත පරිපාලනය, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සැපයීම සඳහා සෞඛ්‍ය සම්පන්න අඛණ්ඩ පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ LEARN, SLT වැනි වෙනත් අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය වීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නවතම තොරතුරු තාක්ෂණයන් හඳුන්වා දීම.
    - අනාරක්ෂිත මෘදුකාංග/මෙවලම් වෙත ප්‍රවේශ වීම සහ භාවිතා කිරීම වැළැක්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිශීලක පරිගණක/ලැප්ටොප් සඳහා පරිපාලක ප්‍රවේශ සීමාවන් (Admin privilege access restrictions) ක්‍රියාත්මක කරන ලදී.
    - ජාලයේ උපාංග පහසුවෙන් හඳුනා ගැනීම සඳහා පරිගණක / ලැප්ටොප් පරිගණක නැවත නම් කිරීමේ ප්‍රතිපත්තිය (renaming policy) ක්‍රියාත්මක කරන ලදී.
- වෙබ් අඩවි පරිපාලනය සහ නඩත්තු කිරීම;
    - නිල වෙබ් අඩවිය: https://www.ugc.ac.lk/
    - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් ද්වාරය: https://www.eugc.ac.lk/

ඉ.වෙන්කරවා ගැනීම්	-	රැස්වීම් ශාලා වෙන් කිරීම් කළමනාකරණය කිරීම
ඉ.ලේඛන	-	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රයෝජනවත් අභ්‍යන්තර ලේඛන එකතු කිරීම
eHRMS	-	සේවක පැමිණීම / රක්ෂණ, සේවක පරිපාලනය සම්බන්ධ තොරතුරු
ඉ.ගබඩාව	-	ගබඩාවලින් අයිතම ඉල්ලීමට අදාළ ද්‍රව්‍ය ඉල්ලීම් යෙදවූම

- සාර්ථක ප්‍රතිඵල ලබා දීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ආවරණය කිරීමට, යෙදවුම් සංවර්ධන කණ්ඩායම සහ සේවා සපයන්නන් සම්බන්ධීකරණය කිරීම.
    - කෙටි පණිවුඩ සහ රජයේ තොරතුරු මධ්‍යස්ථානය (1919 ඇමතුම් මධ්‍යස්ථානය) විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ක්‍රියාකාරකම්.
    - කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික ශ්‍රේණි තනතරුවල උසස්වීම්වලට අදාළ මාර්ගගත අයදුම්පත් සඳහා රජයේ කෙටි පණිවුඩ (GovSMS) සේවාව
    - විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය - 2023/2024 අධ්‍යයන වර්ෂය
    - මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය - 2023/2024 අධ්‍යයන වර්ෂය
- ICTA සමඟ එක්ව මාර්ගගත ගෙවීම් ද්වාරයේ ක්‍රියාවලිය පරිපාලනය සහ සම්බන්ධීකරණය:
    - විදේශීය විශ්වවිද්‍යාල සහ දේශීය රාජ්‍ය නොවන ආයතන සඳහා පිළිගැනීමේ සහතික නිකුත් කිරීම
- වෙබ් ද්වාරය, රැස්වීම් ශාලා වෙන් කිරීමේ පද්ධතිය, පිරිස් අංශය සඳහා සේවකයින්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන eHRM පද්ධතිය, සේවක උසස් වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ පද්ධතිය, ඉ-තොග සහ මාර්ගගතව වාහන වෙන්කරවා ගැනීමේ අයදුම්පත වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ නව සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියට අදාළ විද්‍යුත් තැපෑල උපස්ථ (email backups) පවත්වා ගෙන යාම සහ ඔවුන්ගේ ඉල්ලීම අනුව ඒවා ප්‍රවේශ අංශයට භාරදීම.
- 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා වෙබ් අඩවිය හරහා අවම කඩඉම් ලකුණු නිකුත් කිරීමට මාර්ගගත යෙදවුමක් සකස් කිරීම.

ඉහත විෂය පථයට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ යහපත් තොරතුරු තාක්ෂණ පරිසරයක් කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විවිධ දෛනික මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කරන අතර මෙම වාර්තාවේ දැක්වෙන්නේ 2024 වර්ෂයේ දී සිදු කරන ලද නිශ්චිත ක්‍රියාකාරකම්වල සාරාංශයක් පමණි.

11.1 මෘදුකාංග සංවර්ධන/ නඩත්තු

i. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියේ උසස්වීම් සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුත්ත හැසිරවීමේ පද්ධතිය

මෙම ක්‍රමය මඟින් සේවකයින් සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසයි. ඉදිරිපත් කරන ලද අයදුම්පත් උසස්වීම් අවසන් වන තෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය විසින් අන්තර්ජාලය හරහා හසුරුවනු ලැබේ.

ii. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත්කිරීම සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීමේ සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය

කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් පත්කිරීම සඳහා වන අයදුම්පත් අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමට මෙම ක්‍රමය පහසුකම් සපයයි. විභාග පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර ලකුණු කිරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ පත්වීම් ලබා දීමේ ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය විසින් හසුරුවනු ලැබේ.

iii. නියෝජ්‍ය ලේකම් /නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ නියෝජ්‍ය ගණකාධිකාරී /නියෝජ්‍ය මූල්‍යාධිකාරී /නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරු සඳහා මාර්ගගත අයදුම්පත් කැඳවීම සහ එම කටයුතු හැසිරවීමේ පද්ධතිය

මෙම ක්‍රමය මඟින් අයදුම්පත් මාර්ගගතව ඉදිරිපත් කිරීමට පහසුකම් සපයන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය විසින් සම්මුඛ පරීක්ෂණ කාලසටහන්ගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත හසුරුවනු ලබයි.

iv. ප්‍රේරණ පුහුණු වැඩසටහන සහ වැඩසටහන් හැසිරවීමේ පද්ධතිය

විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය නිලධාරීන්ගේ තොරතුරු රැස් කිරීම සහ ප්‍රේරණ පුහුණු වැඩසටහන හැසිරවීම සඳහා මාර්ගගත පෝරමය සංවර්ධනය කිරීම.

v. ගබඩා කළමනාකරණ පද්ධතිය

ගබඩා කළමනාකරණ පද්ධතිය මඟින් ගබඩාවල ඇති සියලුම අයිතම පිළිබඳ තොරතුරු දත්ත ගබඩාවකට එක්රැස් කරන අතර සියලුම අංශවලට ඔවුන්ගේ ද්‍රව්‍ය ඉල්ලීම් පෝරමය පහසුවෙන් ඉදිරිපත් කිරීමට සබැඳි යෙදවුමක් හරහා මෙම දත්ත ගබඩාවට ප්‍රවේශ විය හැකිය.

vi. නීති සහ ප්‍රලේඛන අංශය සඳහා ගොනු බෙදා හැරීමේ පද්ධතිය

මෙම අංශයට ලැබෙන ලිපි හැසිරවීමට සහ අංශයේ වඩාත් ආරක්ෂිත සහ සුමට ක්‍රියාකාරිත්වය සඳහා ලිපිවල ස්කෑන් පිටපත් තබා ගැනීමට මෙම යෙදවුම භාවිතා වේ.

vii. වාහන වෙන්කරවා ගැනීමේ මාර්ගගත අයදුම්පත

මෙම යෙදවුම දෙපාර්තමේන්තු/අංශවලින් වාහන වෙන්කරවා ගැනීම සඳහා සිදු කරන මාර්ගගත ඉල්ලීම් හැසිරවීම සඳහා සංවර්ධනය කර ඇති අතර අදාළ පාර්ශ්වයෙන් විසින් ඒ සඳහා අන්තර්ජාලය හරහා අනුමැතිය ලබා දේ. මෙම යෙදවුම දැනට පරීක්ෂණ මට්ටම යටතේ පවතී.

viii. විශ්වවිද්‍යාලය සඳහා මාර්ගගතව ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේ අයදුම්පත

මෙම යෙදවුම සංවර්ධනය කිරීමේ අරමුණ වන්නේ අනෙකුත් විශ්වවිද්‍යාලවල සේවක මාරුවීම් ක්‍රියාවලිය පරිගණක ගත වැඩසටහනක් බවට පරිවර්තනය කිරීමයි. මෙම යෙදවුම දැනට සංවර්ධන මට්ටම යටතේ පවතී.

11.2 සිදු කරන ලද ජාල සහ දෘඩාංග ක්‍රියාකාරකම්

තොරතුරු තාක්ෂණ අංශය විසින් සුමට තොරතුරු තාක්ෂණ පරිසරයක් සහතික කිරීම සඳහා දෘඩාංග හා ජාල ආශ්‍රිත මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කරයි. සිදු කරන ලද ක්‍රියාකාරකම් වන්නේ;

<u>තාක්ෂණික සහාය සහ උපකාර</u>

- මෙහෙයුම් සඳහා සිදුවන බාධාවන් අවම කිරීම සහතික කරමින්, දෛනික තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ගැටළු සඳහා තාක්ෂණික සහාය සහ උපකාර ලබා දීම තුළින් කඩිනම් විසඳුම් ලබා දීම.
- අවශ්‍යතා සහ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික වෙමින් ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් සවිස්තරාත්මක තාක්ෂණික පිරිවිතර සකස් කර භාර දීම.
- මාර්ගගත රැස්වීම්වල දී (Zoom/Teams) අවශ්‍ය සහාය ලබා දීම සහ උත්සව, වැඩමුළු සහ රැස්වීම් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය සහාය ලබා දෙන ලදී.

<u>ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්</u>

- කාර්ය සාධනය, පරිමාණය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රාදේශීය ප්‍රදේශ ජාල (LAN) යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- විවිධ දෙපාර්තමේන්තු සහ අංශ තුළ ප්‍රාදේශීය ප්‍රදේශ ජාලය (LAN) උත්ශ්‍රේණි කර ප්‍රශස්තකරණය කරන ලද අතර, උත්ශ්‍රේණි කිරීමෙන් පසු පැන නඟින ගැටලු නිරාකරණය කිරීම.

<u>නඩත්තු කිරීම් සහ ප්‍රලේඛන</u>

- ප්‍රශස්ත ක්‍රියාකාරිත්වය සහ කල්පැවැත්ම සහතික කරමින් උපාංග සහ උපකරණ නිතිපතා නඩත්තු කිරීම සිදු කරන ලදී.
- තොරතුරු තාක්ෂණ සම්පත් සහ ක්‍රියාකාරකම්වල නිවැරදි වාර්තා සහ කාර්යක්ෂම කළමනාකරණය සහතික කිරීම සඳහා පුළුල් හා යාවත්කාලීන තොරතුරු තාක්ෂණ ලියකියවිලි පවත්වාගෙන යාම.

<u>ජාල යටිතල පහසුකම් දළ විශ්ලේෂණය</u>

ජාල යටිතල පහසුකම් යනු ජාලයක් හරහා දත්ත සන්නිවේදනය, සම්බන්ධතාවය සහ කළමනාකරණය සක්‍රීය කරන දෘඩාංග, මෘදුකාංග, සේවා සහ සැකිලි (frameworks) වේ. බාධාවකින් තොරව දත්ත සම්ප්‍රේෂණය සහ සම්පත් වෙත ආරක්ෂිත ප්‍රවේශය සහතික කරමින් එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ පරිසරයේ පදනම සාදයි.

<u>ජාල යටිතල පහසුකම්වල ප්‍රධාන සංරචක;</u>

දෘඩාංග

- රවුටර සහ ස්විච: ජාලය තුළ සහ ඉන් පිටත සෘජු දත්ත ගමනාගමනය
- ඩෙස්ක්ටොප්/ලැප්ටොප්: පරිශීලකයින් සඳහා අත්‍යවශ්‍ය පරිගණක උපාංග

- ෆයර්වෝල්: සයිබර් තර්ජන වලින් ජාලය ආරක්ෂා කිරීම
- සර්වර (Servers) : යෙදවුම්, ලිපිගොනු සහ සේවා සඳහා සත්කාරකත්වය ලබා දීම
- ප්‍රවේශ ස්ථාන සහ රැහැන් රහිත උපාංග: රැහැන් රහිත සම්බන්ධතාව (Wifi) සැපයීම
- කේබල් කිරීම (ෆයිබර් ඔප්ටික්, Cat5/6, ආදිය): දත්ත සම්ප්‍රේෂණය සඳහා භෞතික මාධ්‍යය
- CCTV කැමරා: තත්‍ය කාලීන අධීක්ෂණය සක්‍රීය කිරීම, විමර්ශන සඳහා සාක්ෂි සැපයීම, සේවා ස්ථාන ආරක්ෂාව වැඩි දියුණු කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ දුරස්ථ නිරීක්ෂණ සඳහා ඉඩ සැලසීමෙන් ආරක්ෂාව වැඩි දියුණු කිරීම.

මෘදුකාංග සහ සේවා

- ජාල මෙහෙයුම් පද්ධති: ජාල කාර්යයන් කළමනාකරණය කිරීම (උදා: Cisco IOS, Windows client OS, Windows Server, Apple OS).
- ආරක්ෂක විසඳුම්: Kaspersky ප්‍රති-වයිරස ආරක්ෂණය ක්‍රියාත්මක කරන ලදී.
- ක්ලවුඩ් ජාලකරණ සේවා: අතථ්‍ය පුද්ගලික ජාල (VPN), ක්ලවුඩ් ආචයනය (cloud storage) සහ දුරස්ථ ප්‍රවේශය.

සම්මත නීති මාලාවන් (Protocols) සහ ප්‍රමිති

- IP නාමකරණය (IPv4/IPv6) ජාලයක උපාංග හඳුනා ගනී.
- මාර්ගගත කිරීම සහ මාරු කිරීමේ සම්මත නීති මාලාවන්: කාර්යක්ෂම දත්ත මාර්ගගත කිරීම සහතික කරයි.
- රැහැන් රහිත ප්‍රමිතීන්: Wi-Fi (802.11ac, 802.11ax), බ්ලූටූත් ඇතුළත් වේ.

i. IP PABX (දුරකථන පද්ධතිය) කළමනාකරණය සහ නඩත්තුව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම සහ ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා, ඔවුන්ගේ අභ්‍යන්තර දුරකථන මාර්ග සඳහා අභිරුචිකරණය කළ හැකි විශේෂාංග සහිත මිල අඩු විකල්ප ලබා දෙන PABX පද්ධතියක් සකස් කරන ලදී.

අදාළ දෙපාර්තමේන්තු/අංශවල නිශ්චිත අවශ්‍යතාවලට අනුකූල වන පරිදි දුරකථන පද්ධතිය හැඩගැස්සවීම (Configuring) වැදගත් වේ. අයදුම්පත් කැඳවීමේ / කඩඉම් ලකුණු නිකුත් කිරීමේ කාල සීමාවන් තුළ සාමාන්‍ය ජනතාව සමඟ කාර්යක්ෂම සන්නිවේදනයක් සහතික කිරීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

අඛණ්ඩ සහයෝගය සහ සහාය සඳහා PABX ගිවිසුම අලුත් කරනු ලැබේ.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයේ සහ පුංචි බොරැල්ල පරිශ්‍රයේ ෆයර්වෝල් කළමනාකරණය සහ නඩත්තු කිරීම

ෆයර්වෝල් පූර්ව නිශ්චිත ආරක්ෂක නීති මත පදනම්ව පැමිණෙන සහ පිටතට යන ජාල ගමනාගමනය නිරීක්ෂණය සහ පාලනය කිරීම මඟින් ජාල ආරක්ෂාව සඳහා ෆයර්වෝල්

තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එය අනවසර ප්‍රවේශයට බාධකයක් ලෙස ක්‍රියා කරයි, වියහැකි තර්ජන, සයිබර් ප්‍රහාර සහ දත්ත කඩකිරීම් වලින් ජාලය ආරක්ෂා කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිශ්‍රයේ සහ පුංචි බොරැල්ල පරිශ්‍රයේ ඇති ෆයර්වෝල් දෙක, ස්ථානයෙන් ස්ථානයට VPN උමගක් හරහා ආරක්ෂිතව අන්තර් සම්බන්ධිත වන අතර, ජාල දෙකම හරහා ඉහළ මට්ටමේ ආරක්ෂාවක් පවත්වා ගනිමින් ස්ථාන දෙක අතර බාධාවකින් තොරව සහ ආරක්ෂිත සන්නිවේදනයක් සහතික කරයි.

අඛණ්ඩ අනුග්‍රහය සහ සහාය සඳහා ෆයර්වෝල් බලපත්‍ර සහ නඩත්තු ගිවිසුම අලුත් කරනු ලැබේ.

iii. විද්‍යුත් තැපැල් සන්නිවේදනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ නිල සන්නිවේදනය සඳහා ප්‍රාථමික විද්‍යුත් තැපැල් වේදිකාව ලෙස 'Gmail' පහසුකම අඛණ්ඩව යොදා ගනු ලබයි. මෙය කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත, කාර්යක්ෂම සහ විශ්වාසදායක විද්‍යුත් තැපැල් සේවාවක් සහතික කරයි. ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට:

- ගිණුම් කළමනාකරණය - ආයතනික විද්‍යුත් තැපැල් ගිණුම් සැපයීම සහ අක්‍රිය කිරීම.
- ආරක්ෂාව සහ අනුකූලතාව - ද්වි-සාධක සත්‍යාපනය (2FA) සහ විද්‍යුත් තැපැල් ආරක්ෂක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ගබඩා කිරීම සහ සහයෝගීතාවය - ලේඛන බෙදාගැනීම සහ කණ්ඩායම් වැඩ සඳහා ගූගල් ඩ්‍රයිව් සහ ඒකාබද්ධ මෙවලම් භාවිතා කිරීම.
- පරිශීලක සහාය සහ පුහුණුව – විද්‍යුත් තැපෑල ආශ්‍රිත ගැටළු සහ සයිබර් ආරක්ෂාව සඳහා හොඳම පිළිවෙත් සමඟ පරිශීලකයින්ට සහාය වීම.
- ‘Gmail’ භාවිතය අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය විධිමත් කර ඇති අතර, ආයතනය පුරා ඵලදායිතාව සහ තොරතුරු කළමනාකරණය වැඩි දියුණු කර ඇත.

iv. ජාල පහසුකම් සැපයීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානයේ නව ස්ථානය සඳහා අවශ්‍ය ජාල පහසුකම් සාර්ථකව ස්ථාපිත කර ඇති අතර ඉල්ලීම මත අනෙකුත් සියලුම දෙපාර්තමේන්තු සහ අංශ සඳහා සහාය වීමටද හැකියාව ඇත.

v. ජාල ප්‍රතිව්‍යුහගත කිරීම

දෙපාර්තමේන්තු/අංශ කිහිපයක ජාලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා විවිධ අන්තර්ජාල ප්‍රොටොකෝල් ලිපින (IP Addresses) මගින් වෙන් කර ඇත.

vi. රැහැන් රහිත විසඳුම්

පැරණි අන්තර්ජාල ප්‍රවේශ ලක්ෂ්‍යයන් යල් පැන ගිය සහ නවතම තාක්ෂණයන් සමඟ නොගැලපෙන බැවින් නව රැහැන් රහිත විසඳුමක් ආරම්භ කරන ලදී. එසේම, මෙම පැරණි උපාංග සමඟ අපේක්ෂිත අන්තර්ජාල වේගය ලබා ගත නොහැක.

vii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජාලය සඳහා ආරක්ෂක වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම

- පරිශීලක පරිගණක/ලැප්ටොප් සඳහා පරිපාලන අයිතිවාසිකම් සීමා කිරීම: පද්ධති වින්‍යාසයන් (system configurations) සඳහා සිදු කළ හැකි අනවසර වෙනස්කම් සීමා කිරීමෙන් ජාල ආරක්ෂාව වැඩි දියුණු කරයි.

- පහසුවෙන් හඳුනා ගැනීම සඳහා පරිගණක නැවත නම් කිරීමේ පද්ධතිය: උපාංග පැහැදිලිව හඳුනා ගැනීම සක්‍රීය කිරීමෙන් ජාල කළමනාකරණය සහ සම්පත් වෙන් කිරීම වැඩි දියුණු කරයි.

අවසාන වශයෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියලුම තාක්ෂණික සම්පත් කාර්යක්ෂමව සහ ආරක්ෂිතව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය කැපවී සිටී. අඛණ්ඩ වැඩිදියුණු කිරීම්, ක්‍රියාශීලී සහාය ලබා දීම් සහ ප්‍රධාන ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම තුළින්, අපි සමස්ත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ සේවා සැපයීම වැඩිදියුණු කර ඇත්තෙමු. ඉදිරිය දෙස බලන විට, අංශය නැගී එන තාක්ෂණයන් සහ අභියෝගවලට අනුවර්තනය වීම, අපගේ ජාල ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කිරීම, මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සහ ආයතනයේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීමට සහාය වීම අඛණ්ඩව සිදු කරගෙන යනු ඇත.

12. නීති කටයුතු

12.1 නව ව්‍යවස්ථා

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් නියමයන් හතරක් (04) ක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී.

- **2024 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නියමයන්**

i. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2024.07.26 දිනැති අංක 2394/65 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ නව සිද්ධ වෛද්‍ය පීඨයක් පිහිටුවීමේ නියමය.

ii. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2024.11.29 දිනැති අංක 2412/36 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ "ප්‍රජා වෛද්‍ය විද්‍යා සහ පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය" "මහජන සෞඛ්‍ය හා පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය" ලෙස නැවත නම් කිරීමේ නියමය.

iii. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2024.11.29 දිනැති අංක 2412/35 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ රංගන කලා පීඨය අවලංගු කරමින් සහ එම පීඨය යටතේ පවතින රංගන කලා අංශය, ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය පීඨයට මාරු කිරීමේ නියමය.

iv. විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ කෙටුම්පත් කරන ලදුව 2024.11.29 දිනැති අංක 2412/34 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යා හා කළමනාකරණ පීඨයේ නව ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයන අංශය පිහිටුවීමේ නියමය.

12.2 අධිකරණ නඩු

2024 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව නීති අධිකරණ සහ විනිශ්චය සභා ඉදිරියේ ගොනු කර තිබූ පහත සඳහන් නඩු නීති අංශය විසින් මෙහෙයවන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය	-	නඩු 43
අභියාචනාධිකරණය	-	නඩු 39
විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය	-	නඩු 43
කම්කරු විනිශ්චය සභාව	-	නඩු 02
බෙරුම්කරණය	-	නඩු 01
මහාධිකරණය	-	නඩු 02

12.3 වෙනත් ක්‍රියාකාරකම්වලට ලබා දෙන ලද දායකත්වය

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සිදු කළ ක්‍රියාකාරකම්**

  i. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපකුලපතිට එරෙහිව ඇති පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ රැස්වීම් කැඳවීම සහ එකී කමිටුවේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිටත සිදු කළ ක්‍රියාකාරකම්**

  i. ජාතික අධ්‍යාපන ආයතන පනතට සංශෝධන යෝජනා කිරීමට පත් කළ කමිටුව නියෝජනය කිරීම.

  ii. හෙද සහ ගුරු විශ්වවිද්‍යාල පිහිටුවීමේ නෛතික ලේඛන සැදීමේ කටයුතු සඳහා සහාය ලබාදීම.

13. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය 2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ වාර විසිපහක් (25) රැස්වී ඇත. 2024 වර්ෂයේ දී අභියාචනා මණ්ඩලය තුළ අභියාචනා විසි එකක් (21) ලියාපදිංචි කොට ඇත. මූලික නියෝග කිසිවක් ලබා දී ඇත. අභියාචනා දහහතරක් (14) සම්බන්ධයෙන් නියෝග නිකුත් කරන ලද අතර ඉන් හතරක් (04) නිෂ්ප්‍රභා කර හතරක් (04) පිළිගෙන ඇත. අභියාචනා හයක් (06) නිෂ්ප්‍රභා කර හෝ පිළිගෙන නොමැත. බේරුම්කරණය සහ අභියාචකයාගේ කැමැත්ත හේතුවෙන් අභියාචනා තුනක (03) නඩු කටයුතු අවසන් විය. කිසිදු අතුරු නියෝගයක් ද නිකුත් කර නොමැත. නියෝග හතරක් (04) 2024 වර්ෂය අවසාන වන විට ලේඛණ ගත කර ඇත. කිසිදු අභියාචනයක් කල් තබා නොමැත. 2024 අවසානය වන විට අභියාචනා පනස් පහක් (55) විභාග වෙමින් පැවතුනි.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් දෙන ලද නියෝගයන්ට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ නඩු දෙකකට (02) අභියාචනා ඉදිරිපත් කර තිබූ අතර ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ එක් (01) නඩුවකට එරෙහිව අභියාචනා ඉදිරිපත් කර තිබුණි.

14. මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සංශෝධිත ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 6 වන වගන්තිය මගින් පැවරී ඇති බලය යටතේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන පැවරුම් සහ විමර්ශන කටයුතු අභ්‍යන්තර විගණන අංශයට පැවරී ඇත.

14.1 විගණන වැඩසටහන

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ, කළමනාකරණ සහ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද F.R.133 සහ විගණන සහ කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/2009(1) හි ඇමුණුම 2 ට අනුකූලව වසර සඳහා අදාළ වන විගණන වැඩසටහන සකස් කර ඇත.

14.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

කොමිෂන් සභාවේ භාණ්ඩාගාර නියෝජිත විසින් විගණන කමිටුවේ සභාපතිත්වය දැරූ අතර එය කොමිෂන් සභාවේ අනුකමිටුව ලෙස විධිමත් ලෙස පිහිටුවන ලද තවත් කොමිෂන් සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. ජාතික විගණන කොමිෂන් සභාවේ විගණන අධිකාරීවරයා නිරීක්ෂකයකු ලෙස රැස්වීමට සහභාගි වූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් හා ගණකාධිකාරී සහ අනෙකුත් නිලධාරීන් ආරාධිතයන් ලෙස සහභාගී විය.

2024 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.

වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සංසරණය විය යුතු ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් විගණන කමිටුව කළමනාකරණ කමිටුවට හෝ කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි. විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ද සාකච්ඡාවට බඳුන් කෙරේ.

14.3 පවත්වන ලද පූර්ව විගණනයන්

සේවකයින්ට නිකුත් කරනු ලබන ගෙවීම්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් හි පූර්ව විගණනයක් සිදු කරන ලදී.

- අර්ථසාධක අරමුදල නිදහස් කිරීම - මුදල් ආපසු ගෙවීම් 2,622ක්
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම - මුදල් ආපසු ගෙවීම් 328
- පාරිතෝෂික ගෙවීම - වවුචර් 14ක්

14.4 ප්‍රගති වාර්තාව - අභ්‍යන්තර විගණන අංශය 2024

2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණනය කර ඇති අතර උසස් අධ්‍යාපන ආයතන වෙත ද ගොස් විශේෂ විගණන පරීක්ෂණ කිහිපයක් පවත්වා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණන කමිටුවලට ඔවුන්ගේ ප්‍රතිචාර ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හරහා අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්

සභාවේ නිලධාරීන් සහ උසස් අධ්‍යාපන ආයතනවල නිලධාරීන් වෙත වාර්තා යවන ලදී.

14.5 අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය – 2024

අංකය	විෂය	යොමු අංකය	වාර්තාව ඉදිරිපත් කළ දිනය
01	යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එස්. ශ්‍රී සත්කුනරාජා විසින් කරන ලද දූෂණ හා මූල්‍ය අවභාවිතය පිළිබඳ විගණන වාර්තාව	UGC/CIA/F/IAR/24-01	2024/02/09
02	විගණන වාර්තාව - යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සහ මූල්‍යාධිකාරීවරයා මූල්‍ය අපයෝජන හා දූෂණවලට සෘජුවම සම්බන්ධ වීම සහ ඒවා වසන් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයට වංචා කිරීම.	UGC/CIA/IAR/24-02	2024/03/12
03	විගණන වාර්තාව – NCAS හි ගෙවීම් වවුචර්	UGC/CIA/IAR/24-03	2024/02/26
04	විගණන වාර්තාව – පාරිතෝෂික ගෙවීම – පී.වී. දමයන්ති මහත්මිය	UGC/CIA/F/IAR/24-04	2024/10/22
05	විගණන වාර්තාව - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC), විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ බැංකු සැසඳුම්	UGC/CIA/IAR/24-5	2024/11/28
06	විගණන වාර්තාව - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඥාතිසංග්‍රහය, වෙනස්කම් කිරීම සහ මූල්‍ය අවකළමනාකරණය පිළිබඳ විධිමත් පැමිණිල්ල.	UGC/CIA/IAR/24-6	2025/01/05

වගුව: 14.5 අභ්‍යන්තර විගණන වාර්තා වල සාරාංශය – 2024

15. ප්‍රකාශන සහ වාර්තා / සංවර්ධන ක්‍රියාකාරකම් / විශේෂ පැවරුම්

15.1 ප්‍රකාශන සහ වාර්තා

2024 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් පහත සඳහන් වැදගත් ප්‍රකාශන සහ වාර්තා සමඟ පද්ධතියට පරිපාලනමය සහාය ලබා දෙන ලදී;

- "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2023" ප්‍රකාශන මාලාවේ 22 වන වෙළුම අවසන් කර ඇති නමුත් තවමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර නොමැත.

15.2 සංවර්ධන කටයුතු

- විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වෙබ් අඩවියේ (webometrics) හා QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යාවත්කාලීන කරන ලද ශ්‍රේණිගත කිරීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.

15.3 විශේෂ පැවරුම්

2024 වර්ෂය තුළ පහත සඳහන් විශේෂ පැවරුම් සිදු කරන ලදී.

1. ජාතික පර්යේෂණ සහ සංවර්ධන (R&D) සමීක්ෂණය 2022 සඳහා විශ්වවිද්‍යාල වලින් එකතු කරන ලද දත්ත පරීක්ෂා කර අවසන් කරන ලදී.

2. 2024 ජුනි 30 වන දින වන විට උසස් අධ්‍යාපන ආයතනවල බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයෙන් අයකර ගැනීමට ගෙන ඇති අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සොයා බලා එම ලේඛණ අභ්‍යන්තර විගණනට හා රජයේ විගණනයට ඉදිරිපත් කරන ලදී. එසේම 2024 දෙසැම්බර් 31 වන දින අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

3. පහත දක්වා ඇති පරිදි අවසාන එම්.බී.බී.එස් විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ පොදු කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම;
   - 2015/16 පුනර් පරීක්ෂණ විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව
   - 2016/17 ප්‍රධාන විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව
   - 2016/17 පුනර් පරීක්ෂණ විභාගය සඳහා කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව

4. ආයුර්වේද වෛද්‍ය විද්‍යා සහ ශල්‍ය වෛද්‍ය උපාධිය උපාධිධාරීන්ගේ පොදු කුසලතා ලැයිස්තු සම්පාදනය කර ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පහත දක්වා ඇති පරිදි පත්කිරීමේ කාර්යය සඳහා ඉදිරිපත් කරන ලදී.
   - 2013/14 ප්‍රධාන සහ පරිපූරක විභාග සඳහා වන කුසලතා ලැයිස්තුව
   - 2014/15 ප්‍රධාන සහ පරිපූරක විභාග සඳහා වන කුසලතා ලැයිස්තුව

5. සිද්ධ වෛද්‍ය විද්‍යා හා ශල්‍ය වෛද්‍ය උපාධිධාරීන්ගේ (BSMS graduates) පොදු කුසලතා ලැයිස්තු සම්පාදනය කර ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පහත දක්වා ඇති පරිදි පත්කිරීමේ කාර්යය සඳහා ඉදිරිපත් කරන ලදී.

- 2013/14 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2014/15 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව

6. 2015/16 කණ්ඩායමට අදාළ ප්‍රධාන සහ අතිරේක විභාග සඳහා ආයුර්වේද වෛද්‍ය විද්‍යා සහ ශල්‍ය වෛද්‍ය, යුනානි වෛද්‍ය විද්‍යා හා ශල්‍ය වෛද්‍ය සහ සිද්ධ වෛද්‍ය විද්‍යා හා ශල්‍ය වෛද්‍ය උපාධිධාරීන්ගේ පොදු කුසලතා ලැයිස්තු සම්පාදනය කර පත්වීම් සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

7. කොළඹ විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ BSc භෞතචිකිත්සක උපාධිධාරීන්ගේ පොදු කුසලතා ලැයිස්තු සම්පාදනය කර පත්වීම් පිරිනැමීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

- 2015/16 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2016/17 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2017/18 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව

8. පහත සඳහන් පරිදි පත්වීම් ලබා දීම සඳහා BSc ඖෂධවේදී උපාධිධාරීන්ගේ පොදු කුසලතා ලැයිස්තුව සම්පාදනය කර සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී:

- 2013/14 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2014/15 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2015/16 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2016/17 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2017/18 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව

9. පහත සඳහන් පරිදි පත්වීම් ලබා දීම සඳහා BSc හෙද උපාධිධාරීන්ගේ පොදු කුසලතා ලැයිස්තුව සකස් කර සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී:

- 2015/16 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2016/17 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2017/18 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව

10. පහත සඳහන් පරිදි පත්වීම් ලබා දීම සඳහා වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරීන්ගේ පොදු කුසලතා ලැයිස්තුව සම්පාදනය කර සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී:

- 2015/16 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2016/17 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව
- 2017/18 අවසාන විභාගය සඳහා කුසලතා ලැයිස්තුව

11. කැලණිය විශ්වවිද්‍යාලයේ කථන හා ශ්‍රවණ විද්‍යා උපාධිධාරීන්ගේ 2012/13, 2013/14, 2014/15, 2015/16, 2016/17 සහ 2017/18 යන කාණ්ඩායම් 06 ක ශ්‍රේණිගත අනුපිළිවෙල ලැයිස්තු පත්වීම් ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

12. කැලණිය විශ්වවිද්‍යාලයේ කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිධාරීන්ගේ 2016/17 කණ්ඩායමේ ශ්‍රේණිගත අනුපිළිවෙල, පත්වීම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

13. කැලණිය විශ්වවිද්‍යාලයේ කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිධාරීන්ගේ 2007/08, 2008/09, 2009/10, 2010/11, 2011/12, 2012/13, 2013/14, 2014/15, 2015/16, 2016/17 සහ 2017/18 කාණ්ඩවලට අදාළ ශ්‍රේණිගත කිරීමේ අනුපිළිවෙල ලැයිස්තු එකොළහක් (11) පත්වීම් ලබා දීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

14. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වික්‍රිරණවේද උපාධිධාරීන්ගේ 2015/16, 2016/17 සහ 2017/18 කාණ්ඩ 03 සඳහා ශ්‍රේණිගත කිරීමේ අනුපිළිවෙල ලැයිස්තු පත්වීම් ලබා දීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

15. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වික්‍රිරණ චිකිත්සක උපාධිධාරීන්ගේ 2016/17 සහ 2017/18 කාණ්ඩ 02 සඳහා ශ්‍රේණිගත කිරීමේ අනුපිළිවෙල ලැයිස්තු පත්වීම් ලබා දීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

16. 2024.08.31 දිනට යාවත්කාලීන විස්තර ඇතුළත් කිරීම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සියලුම ඉඩම් / ඉඩම් අත්කර ගැනීම් සහ හිමිකම් ඔප්පු පිළිබඳ වාර්තාව අදාළ විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත යවන ලදී.

17. මහ බැංකුවේ වාර්ෂික වාර්තාව සහ 2024 මැතකාලීන ආර්ථික සංවර්ධන විශේෂ අවස්ථා සහ 2025 සඳහා සපුරා ගැනීමට නියමිත අපේක්ෂාවන්, සම්පූර්ණ කර මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

18. පහත පාර්ශ්වකරුවන්ගේ දත්ත ඉල්ලීම් සපුරාලමින් සම්පූර්ණ දත්ත ලබා දෙන ලදී;
    - යුනෙස්කෝ
    - මහ බැංකුව
    - ජනලේඛන දෙපාර්තමේන්තුව
    - පාර්ලිමේන්තුව
    - ජනාධිපති ලේකම් කාර්යාලය/අග්‍රාමාත්‍ය කාර්යාලය/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
    - වෙනත් රජයේ ආයතන

19. සෑම මසකම 25 වන දිනට ප්‍රථම උපාධි වැඩසටහන්වල ප්‍රගතිය සම්පාදනය කර සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

20. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2024 වන විට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ සමීක්ෂණයක් පවත්වයි. ඒ අනුව ඊට අදාළ තොරතුරු රැස්කර, අවසන් කර, ඒවා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂාවෙන් සිටිමු.

16. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය

නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයේ ව්‍යාප්තිය පිළිබඳ සිදු කළ අධ්‍යයනයේ සොයාගැනීම් මත පදනම් වූ මැදිහත්වීමක් ලෙස, විශ්වවිද්‍යාල පද්ධතියේ සියලුම උපාධි අපේක්ෂකයින්ට, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පිරිනැමීම සඳහා 'විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම' යන මාතෘකාවෙන් යුත් පාඨමාලාවක් සංවර්ධනය කරන ලදී. විශ්වවිද්‍යාල 17ටම භෞතිකව ගොස් පුහුණු සැසි සාර්ථකව පවත්වන ලදී. තවද, ත්‍රිකුණාමලය මණ්ඩපයේ කාර්ය මණ්ඩලය සඳහා "විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම" යන පාඨමාලාව ලබා දීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර, මෙම පාඨමාලාව සම්පත්දායකයින්ගේ අධීක්ෂණය යටතේ එම පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය ඇතිව, මණ්ඩපයේ නවක සිසුන් සඳහා පිරිනමන ලදී.

i. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ දිශානති වැඩසටහනට (Orientation programme) “විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම” ඇතුළත් කිරීම.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහ පුළුල් විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා සමාජ සම්බන්ධතා ක්‍රියාකාරකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ 2024 ජාත්‍යන්තර කාන්තා දින සැමරුම පවත්වන ලදී. ඒ අනුව, මෙම උත්සවය 2024 මාර්තු 15 වන දින පෙ.ව. 9.30 සිට ප.ව. 1.00 දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. එම අවස්ථාව සඳහා, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්, උපකුලපතිවරුන්, මණ්ඩපාධිපතිවරුන්, අධ්‍යක්ෂවරුන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්, සිසුන් සහ අනෙකුත් සංවිධානවල ආරාධිත අමුත්තන් ඇතුළු 225 දෙනෙකු සහභාගී වූ අතර, එය සැලකිය යුතු ජන සහභාගීත්වයක් සනිටුහන් කළේය. ප්‍රධාන උත්සවයට පෙර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානය විසින් තරඟ දෙකක්,එනම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දරුවන් සඳහා චිත්‍ර තරඟයක් (ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හැර) සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා ඡායාරූප තරඟයක් සංවිධානය කරන ලදී. තරඟ දෙකෙහිම ජයග්‍රාහකයින්ට සහ චිත්‍ර තරඟයේ තරඟකරුවන්ට සහභාගීත්ව සහ ජයග්‍රහණ සහතික ප්‍රදානය කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ජාත්‍යන්තර සහ පොදු නීති අධ්‍යයන අංශයේ මහාචාර්ය දිනේෂා සමරරත්න මහත්මිය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ හා සාධාරණත්වයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ ප්‍රධාන දේශනයක් පැවැත්වූ අතර, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ දෘෂ්ටිකෝණයෙන් එක්සත් ජාතීන්ගේ තේමාව නැවත සකස් කිරීමේ වැදගත්කම සාකච්ඡා කළාය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ භාෂා අධ්‍යයන අංශයේ ආචාර්ය විවිමරි වැන්දර් පූටන් සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ ලලිත කලා අධ්‍යයන අංශයේ මහාචාර්ය එස්. ජෙයසංකර් විසින් සිදු කරන ලද කවි කියවීම් ආකර්ශනීය වූ අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය යන තේමාව යටතේ රචිත ශාස්ත්‍රාලිකයින්ගේ විවිධාකාර ප්‍රකාශනයන් ඉදිරිපත් කළේය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යය පීඨයේ ව්‍යාපාර පරිපාලන අධ්‍යයන අංශයේ මහාචාර්ය හේමමාලි ගුණතිලක සහ ශ්‍රී ජයවර්ධනපුර

විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යය පීඨයේ පීඨාධිපති ආචාර්ය දුෂාන් ජයවික්‍රම විසින් මෙහෙයවන ලද "සැමට සමාන ප්‍රවේශයක් ලබා දීම සඳහා ආයෝජනය කිරීම" යන මැයෙන් වූ සැසිය සිතුවිලි ජනිත කරවන සුළු විය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විවිධත්වය සහ සැමට සමාන ප්‍රවේශයක් ලබා දීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් පාඨමාලාව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානය විසින් ඉටු කරන ලද කාර්යභාරය කෙරෙහි මෙම සැසිය අවධානය යොමු කළේය.

iii. "විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම" පාඨමාලා ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය ආරම්භ කිරීම.

iv. "ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය (NCPA) සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. පාසල් දරුවන් අතර ස්වේච්ඡා පදනමින් දැනුවත්භාවය ගොඩනැගීම සඳහා ස්වේච්ඡා සහභාගීත්වය ලබා දීම සඳහා උපාධි අපේක්ෂකයින් 2,000 කට අධික සංඛ්‍යාවක් මෙම වැඩසටහනට සම්බන්ධ වී ඇත.

v. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC), මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා මධ්‍යස්ථානය (CMIL) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම.

vi. විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයින්ට සදාචාරාත්මක ගෝලීය පුරවැසියන් වීමට හැකි වන පරිදි විවිධත්වය සහ ඇතුළත් කිරීම පිළිබඳ පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම - 2025 දී ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමුළුවක් සංවිධානය කිරීම.

vii. නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට/ඉන් ගලවා ගත් අයට සහාය වීම සඳහා වේගවත්ව ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් පිහිටුවීම සහ මෙවලම් කට්ටල සංවර්ධනය කිරීම. සාකච්ඡාව සහ අන්‍යෝන්‍ය දිරිගැන්වීම සඳහා ආරක්ෂිත අවකාශයක් සැපයීම සඳහා සම වයසේ මිතුරන් අතර සහයෝගිතා කණ්ඩායම් පිහිටුවීමට සැලසුම් කර ඇත - වින්දිතයින් සමඟ සාකච්ඡා කිරීමට, ඔවුන්ගේ අත්දැකීම් තේරුම් ගැනීමට, සහාය ලබා දීමට සහ නවක වදයෙන් ගලවා ගත් අයට සහාය වන පද්ධතියක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට 2024 ඔක්තෝබර් 19 සිට 22 දක්වා ත්‍රිකුණාමලය මණ්ඩපය/ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයට (EUSL) යන ලදී.

viii. නවක වදයෙන ගලවා ගත් අයට සහාය වන පද්ධතියක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී.

ix. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින්ට සහාය වීම සඳහා විශ්වවිද්‍යාලවලට සහාය වීම සඳහා මෙවලම් කට්ටල සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. මෙම කටයුත්තට අනුකූලව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානය විසින් 2024 දෙසැම්බර් 06 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේදී රැස්වීමක් සාර්ථකව සංවිධානය කරන ලදී. මෙම සැසියට ශිෂ්‍ය කටයුතු සහ ශිෂ්‍ය ආරක්ෂාව සඳහා වගකිව යුතු නියෝජ්‍ය උපකුලපතිවරුන් (DVCs), චිනය පාලකවරුන් සහ ශිෂ්‍ය චිනය පාලකවරුන් සහභාගී විය.





x. “විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය සඳහා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම” පිළිබඳ චක්‍රලේඛයේ සංශෝධනය - එහි අවසාන අනුවාදය, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයින් අතර ඔවුන්ගේ එකඟතාවය සඳහා බෙදා හරින ලදී.

xi. අයර්ලන්තයේ කාලෝ විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ස්ටෙෆ් හැන්ලොන් සහ එක්සත් රාජධානියේ නිව්කාසල් විශ්වවිද්‍යාලයේ විවේචනාත්මක පුරුෂාධිපත්‍ය අධ්‍යයනය පිළිබඳ පාඨක ආචාර්ය ක්‍රිස් හේවුඩ් සමඟ සාකච්ඡා පැවැත්වීය.

xii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබිඹු කිරීම සඳහා පැමිණිලි ද්වාරය ප්‍රතිව්‍යුහගත කරන ලදී.

- වත්මන් වෙබ් අඩවියට සංශෝධන සිදු කරමින් පවතී.
- Rage.lk සමඟ පවත්වන ලද රැස්වීම
- වැඩිදියුණු කළ විශ්වවිද්‍යාල ආරක්ෂණ ප්‍රොටෝකෝල සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය උපකුලපතිවරුන්, විනය පාලකවරුන් සහ ශිෂ්‍ය විනය පාලකවරුන් හමුවිය.
- සාර්ථකත්වය මැනීම සඳහා වන මිනුම් ඇතුළුව කෙටි කාලීන සහ දිගු කාලීන අරමුණු විස්තර කරන පුළුල් උපායමාර්ගික සැලැස්මක් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානය සඳහා සම්පූර්ණ කරන ලදී.

17. විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලබා දීම

17.1 2024 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් කළමනාකරණය කරන සහ පහසුකම් සපයන ශිෂ්‍යත්ව වැඩසටහන්වල වර්තමාන තත්ත්වය

- **ඩයලොග් තාක්ෂණ කුසලතා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.11.07 දින පැවති සිය 1134 වන සභා වාරයේ දී, අ.පොෂ.ස. උසස් පෙළ විභාගයේ සිට පිරිනමනු ලබන ඩයලොග් කුසලතා ශිෂ්‍යත්ව වැඩසටහනට අදාළ අවබෝධතා ගිවිසුම (MoU) අලුත් කිරීම අනුමත කළේය.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිත්‍යාගශීලී ශිෂ්‍යත්ව අරමුදල**

  කළමනාකරණ කමිටුවේ නිර්දේශය සහ කේ. ඉනමුර මහතා මිය ගොස් ඇති බැවින් කේ. ඉනමුර මහතා අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල පවත්වාගෙන යාමේ දුෂ්කරතාවය සලකා බැලූ කොමිෂන් සභාව, 2024.04.04 දින පැවති සිය 1122 වන සභා වාරයේ දී, එම ශිෂ්‍යත්ව අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිත්‍යාගශීලී ශිෂ්‍යත්ව අරමුදලට මාරු කිරීමට තීරණය කළේය.

17.2 වෙනත් ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2024.04.04 දින පැවති සිය 1122 වන සභාවාරයේ දී, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID)/ සමාජ සහජීවනය සහ සංහිඳියාව (SCORE) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමාජ සංහිඳියාව පිළිබඳ ස්ථාවර කමිටුව සමඟ ඒකාබද්ධ මූලපිරීමක් ලෙස මාස හයක් (06) ඇතුළත ක්‍රියාකාරකම් පහක් (05) ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලද අතර එහිදී සියලුම ප්‍රසම්පාදන සහ අරමුදල් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) විසින් සැපයීම සහ හැසිරවීම සිදු කරන ලදී. ඒ අනුව, පළමු ක්‍රියාකාරකම ලෙස 2024 ජූනි 13 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ USAID/SCORE අතර ගිවිසුමක් අත්සන් කරන ලදී.

තවද, ගිවිසුමට අනුව සිදු කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම්වල ප්‍රගතියේ සාරාංශය පහත පරිදි වේ:

අංකය	ක්‍රියාකාරකමේ නම	විස්තරය
01.	සමාජ සංහිඳියා මධ්‍යස්ථානයේ (SRC) අධ්‍යක්ෂවරුන්, විශ්වවිද්‍යාල / මණ්ඩප, උපකුලපතිවරුන් / ප්‍රධානීවරුන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා සමාජ සහජීවනය සහ සංහිඳියාව, ඉලක්ක සැකසීම සහ සමාජ සංහිඳියා මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම පිළිබඳ දෙදින සංවේදීකරණ වැඩමුළුව.	**ස්ථානය:** හබරණ විලේජ් බයි සිනමන්, හබරණ **දින:** 2024 ජූනි 30 සිට ජූලි 02 දක්වා **සහභාගීවූවන්**: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන්, උපකුලපතිවරුන්, සමාජ සංහිඳියා මධ්‍යස්ථානයේ

අංකය	ක්‍රියාකාරකමේ නම	විස්තරය
		(SRC) අධ්‍යක්ෂවරුන් **අරමුණු:** • **<u>සමාජ සහජීවනය සහ සංහිඳියාව:</u>** විශ්වවිද්‍යාල ප්‍රජාවන් තුළ තුළ සිටින විවිධ කණ්ඩායම් අතර සමාජ සහජීවනය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඒ පිළිබඳව ඇති අවබෝධය සහ කැපවීම වැඩි දියුණු කිරීම. • **<u>ඉලක්ක සැකසීම:</u>** ඵලදායී සමාජ සහජීවනය සහ සංහිඳියාව සඳහා පැහැදිලි සහ අත් කරගත හැකි ඉලක්ක වර්ධනය කිරීම සඳහා සමාජ සංහිඳියා මධ්‍යස්ථානයේ (SRC) අධ්‍යක්ෂවරුන් සහ විශ්වවිද්‍යාල/මණ්ඩල උපකුලපතිවරුන්/ප්‍රධානීන් කුසලතා වලින් සන්නද්ධ කිරීම. • **<u>ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම:</u>** වැඩමුළුවේදී සාකච්ඡා කරන ලද මෙවලම් සහ උපාය මාර්ග භාවිතා කරමින් එක් එක් සමාජ සංහිඳියා මධ්‍යස්ථාන සඳහා ක්‍රියාකාරී දළ සටහන් සංවර්ධනය කිරීම.
02.	සමාජ සහජීවනය, සංහිඳියාව සහ ප්‍රජා ක්‍රියාමාර්ග පිළිබඳව නියෝජිතයන් සඳහා තෙදින පුහුණු වැඩමුළුව	**ස්ථානය:** මියානි පුහුණු ආයතනය, මඩකලපුව දිනයන්: 2024 ජූලි 16 - ජූලි 19 දක්වා **සහභාගිවන්නන්:** සමාජ සංහිඳියා මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරුන් 18 දෙනෙකු සහ ජාතික විශ්වවිද්‍යාල/මණ්ඩප 18 ක විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් 90 දෙනෙක්

අංකය	ක්‍රියාකාරකමේ නම	විස්තරය
		ප්‍රතිඵල : • සමාජ සහජීවනය, සංහිඳියාව සහ ප්‍රජා ක්‍රියාමාර්ග පිළිබඳව නියෝජිතයන් 90 දෙනෙකු (පළමු සහ දෙවන වසර විශ්වවිද්‍යාල සිසුන්) සාර්ථකව පුහුණු කිරීම.
03.	ජාත්‍යන්තර තරුණ දිනය 2024: තරුණ සමුළුව	**ස්ථානය:** වව්නියාව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව **දිනයන්:** 2024 අගෝස්තු 12, 13 **සහභාගිවන්නන්:** තරුණයින් 180 ක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සමාජ සංහිඳියා මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරුන් 18 ක්, විශ්වවිද්‍යාල නිලධාරීන් **ප්‍රතිඵලය**: • මෙවලම්, දැනුම සහ ජාල සමඟ ශ්‍රී ලංකාවේ සමාජ සහජීවනය මෙහෙයවීම සඳහා වෙනසක් ඇති කළ හැකි නියෝජිතයන් ලෙස ඔවුන්ගේ භූමිකාව පිළිබඳව තරුණයින්ගේ අවබෝධය සහ දැනුවත්භාවය වැඩි කිරීම.
04.	ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යයනය සහ දැනුම් නිෂ්පාදන 18ක්	2024 ඔක්තෝබර් 02 වන දින කොළඹ මිරාජ් හෝටලයේදී පැවති දැනුම සැකෙවින් ඉදිරිපත් කිරීම.

වගුව : 17.2 වෙනත් ක්‍රියාකාරකම්

- **ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයි විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් සූර්ය ආයතන ව්‍යාපෘති, සෝයා බෝංචි නිෂ්පාදන සහ මානසික සෞඛ්‍ය වැඩසටහන**

ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයි විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ සූර්ය ආයතනයක් පිහිටුවීම, සෝයා බෝංචි වගාව ප්‍රවර්ධනය කිරීම සහ මානසික සෞඛ්‍ය වැඩසටහනක් සඳහා වන වැදගත් උත්සාහයන් සාකච්ඡා කිරීම සඳහා 2024.03.27 දින පැවති රැස්වීමකි.

i. සූර්ය බලශක්ති ආයතනයක් පිහිටුවීමේ හැකියාව

වර්තමානයේ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (OUSL) විසින් මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය සහ යුරෝපීය උසස් අධ්‍යාපන ආයතන තුනක් සමඟ එක්ව "චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්ති විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය" යන ව්‍යාපෘති යෝජනාව සඳහා උසස් අධ්‍යාපනයේ ධාරිතා ගොඩනැගීමේ - ඒකාබද්ධ ව්‍යාපෘති ක්‍රියාමාර්ගය යටතේ 2019 Erasmus+ වැඩසටහනෙන් අරමුදල් ලබාගෙන ඇත.

ii. සෝයා බෝංචි වගා කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට සෝයා බෝංචි නිෂ්පාදනය සහ ඒ ආශ්‍රිත ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන බුද්ධියෙන් යුත් සාකච්ඡාවල යෙදීමට, දැනුම බෙදා ගැනීමට සහ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීමට පාර්ශ්වකරුවන්ට, විශේෂඥයින්ට සහ උනන්දුවක් දක්වන අයට වේදිකාවක් තැනීමට.

iii. මානසික සෞඛ්‍ය වැඩසටහන

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මානසික සෞඛ්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීම.

- **ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනොයි විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් පවත්වන ලද වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ සම්මන්ත්‍රණය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරාධනයෙන්, චිකාගෝ හි ඉලිනොයි විශ්වවිද්‍යාලයේ විද්වතුන් කණ්ඩායමක් 2024 ඔක්තෝබර් 14 සිට 17 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. දශක හතරකට පමණ පෙර, චිකාගෝ හි ඉලිනොයිස් විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ අතර, මෙම සංචාරයේ අරමුණ වුයේ එම සහයෝගීතාවය අලුත් කිරීමයි.

මෙම නියෝජිත පිරිසට වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශයේ ප්‍රධානී සහ වෛද්‍ය විද්‍යාලයේ විධායක පීඨාධිපතිවරයා ඇතුළත් විය. වෛද්‍ය අධ්‍යාපනයේ මෑත කාලීන ප්‍රවණතා ගවේෂණය කිරීම සඳහා ඔක්තෝබර් 14 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේදී සම්මන්ත්‍රණයක් පැවැත්විණි. වෛද්‍ය පුහුණුව සඳහා AI ඒකාබද්ධ කිරීම, විෂයමාලා සංශෝධන කළමනාකරණය කිරීම, සායනික පුහුණුව වැඩි දියුණු කිරීම සහ නිපුණතා පාදක වෛද්‍ය පුහුණුව ලබා ගැනීම වැනි ප්‍රධාන මාතෘකා සාකච්ඡා කෙරේ.

18. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම

අධ්‍යයන කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම තරුණ විද්‍යාර්ථීන්ට දේශීය මෙන් ම විදේශීය උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ පද්ධතිය තවදුරටත් පෝෂණය කිරීම සහ ශක්තිමත් කිරීම යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තියට අනුකූලව යමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පර්යේෂණ හා අන්තර්ජාතික සහයෝගිතා අංශය මඟින් ඒ වෙනුවෙන් 2024 වසර තුළ දැඩි උත්සාහයක් දැරුවේය. කෙසේ වෙතත්, විදේශ අධ්‍යයන සහ පුහුණුවීම් සඳහා වූ මූල්‍යමය බැඳීම් සම්බන්ධයෙන් රජය විසින් නියම කරන ලද ඇතැම් රෙගුලාසි හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ සපුරා ගැනීමට අපේක්ෂා කළ ඉලක්කවලින් 100% ක් සපුරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නොහැකි විය. මෙම සීමාවන් තිබියදීත්, පහත දක්වා ඇති පරිදි පර්යේෂණ හා අන්තර්ජාතික සහයෝගිතා අංශයේ ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යාමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උපරිම උත්සාහයක් ගෙන ඇත.

18.1 උසස් අධ්‍යාපනය සඳහා ප්‍රදාන ලබා දීම

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය – 2024**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හැකියාව ශක්තිමත් කිරීම මගින් ආචාර්ය මණ්ඩලයේ ස්ථීර සාමාජිකයින්ට සිය වෘත්තීය දියුණුව සඳහා අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා මූල්‍යමය වශයෙන් සහයෝගය දැක්වීමයි.

  ප්‍රදාන ලබා දෙනු ලබන්නේ දේශීය/විදේශීය ආචාර්ය උපාධි සහ ආචාර්ය උපාධිය දක්වා වන දර්ශපති උපාධි හා ඊට සමාන අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණි.

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය මඟින් PhD/ආචාර්ය උපාධි අධ්‍යයන සඳහා උපරිම වශයෙන් වසර 03ක් සඳහා වන ප්‍රදාන සහ MPhil/ශාස්ත්‍රපති උපාධි සඳහා උපරිම වශයෙන් වසර 02ක් සඳහා වන ප්‍රදාන පමණක් සපයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයේ සමස්ත ප්‍රදාන සීමාව, ආයතනික සහ ජීවන වියදම් යන දෙකම ඇතුළුව එක් අපේක්ෂකයෙකුට වසරකට රුපියල් මිලියන 2 කි. විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන සිදු කරන අපේක්ෂකයෙකුට ජීවන වියදම් සඳහා ලැබෙන ප්‍රදානයේ උපරිම සීමාව වසරකට රුපියල් මිලියන 1.5 ක් වේ. ජීවන වියදම් යටතේ, තනි අපේක්ෂකයෙකුට අදාළ වන සීමාව ඉහත දක්වා ඇති උපරිම සීමාව තුළ රට අනුව වෙනස් වේ.

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පශ්චාත් උපාධි යෝජනා ක්‍රමය යටතේ 2024 දී ශිෂ්‍යත්ව ප්‍රදානය නොකළ නමුත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනට ප්‍රදාන ලබා දෙන ප්‍රදානලාභීන් සඳහා ඔවුන්ගේ

පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු කරගෙන යාමට මිලියන 9.5 ක් නිකුත් කර ඇත.

- **විදේශීය විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් සිදු කරන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම - 2024**

  i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව (GU) පූර්ණ / ඒකාබද්ධ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන

  ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (GU) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විද්වත් අන්තර්ක්‍රියා, සංස්කෘතික හුවමාරුව, සහභාගී පර්යේෂණ සහ වෙනත් ආකාරයේ ශාස්ත්‍රීය සහයෝගීතාවයෙන් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී.

  ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම යටතේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසර 03ක් දක්වා වූ කාලසීමාවක් සඳහා සම්පූර්ණ පන්ති ගාස්තුව ආවරණය කරනු ලබන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඕස්ට්‍රේලියාව සඳහා අනුමත කරන ලද සීමාවන් තුළ අපේක්ෂකයින්ට වසර 3 ක කාලයක් සඳහා ජීවන දීමනාවක් සහ විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණය (OSHC) ලබා දෙනු ඇත. ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය විසින් වසරකට ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව 12 ක් දක්වා ලබා දෙනු ඇත.

  ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

  සියලුම පාර්ශ්වයන්ගේ අවසාන අනුමැතියට යටත්ව පහත සඳහන් විශ්වවිද්‍යාල හතරින් සහ අනෙකුත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලින් ඕනෑම එකකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහාය දක්වන අපේක්ෂකයින් සඳහා ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් අධීක්ෂණ විධිවිධාන ද දිරිමත් කරනු ලැබේ:

  - කොළඹ විශ්වවිද්‍යාලය
  - කැලණිය විශ්වවිද්‍යාලය
  - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

  කෙසේ වෙතත්, 2023 මාර්තු 15 වැනි දින "රාජකාරී විදේශ ගමන් සඳහා විනිමය මුදා හැරීම හා ඒ ආශ්‍රිත වියදම්" නමින් ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලද ලිපිය මගින් නිකුත් කරන ලද වර්තමාන මූල්‍ය රෙගුලාසි සමඟ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමේ පරස්පරතා හේතුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කර නොමැත. ඉහත ලිපියට අනුව, විදේශීය අධ්‍යයන, පුහුණු, සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ සංචාර සඳහා විදේශීය පාර්ශවය විසින් පූර්ණ අරමුදල්/අනුග්‍රහයක් ලබා නොදෙන්නේ නම් රජයේ අරමුදල්

භාවිතා කළ නොහැක. ග්‍රිෆිත් විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ග්‍රිෆිත් විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අර්ධ වශයෙන් අරමුදල් සපයනු ලැබේ. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වර්තමාන තත්ත්වයට අනුකූල වන සංශෝධිත නියමයන් සමඟ අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. සංශෝධිත අවබෝධතා ගිවිසුම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (QUT) ඒකාබද්ධ / භින්න ආචාර්ය උපාධි වැඩසටහන

ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය උපාධි අපේක්ෂකයන් (වසර තුනක් දක්වා) සඳහා සම්පූර්ණ උපකාරක ගාස්තු අනුග්‍රහයක් (ආසන්න වශයෙන් AUD 100, 000 අගයක්) ලබා දෙනු ඇත.

වසරක් සඳහා ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සිදු කරන අතරතුර වියදම් පියවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සුදුසුකම් අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලාංකික විද්වතුන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය සහාය ලබා දෙනු ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව අවශ්‍ය පරිදි ජීවන දීමනාවක්, විදේශීය ශිෂ්‍ය සෞඛ්‍ය ආවරණයක් (OSHC) සහ ඒ ආශ්‍රිත ආනුෂංගික වියදම් මෙම ආධාරයට ඇතුළත් වේ. උපරිම දීමනා සීමාව වසර 03ක් සඳහා එක් අපේක්ෂකයෙකුට රු. මිලියන 3.5ක් වේ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විවිධ විෂයයන් සඳහා අපේක්ෂකයින් 10 - 12 ක් ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මණ්ඩපයන් හි අවම වශයෙන් මාස 12 ක ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදු කරන අතර ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය මඟින් ආචාර්ය අධීක්ෂණ සමූහ ආකෘතියකට සහාය දක්වනු ලබයි.

පහත දැක්වෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමවල ආකෘති දෙකකි;

i. ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය

- ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගිතා ආචාර්ය උපාධි වැඩසටහන්වලට කොළඹ විශ්වවිද්‍යාලය (CMB), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP) සමඟ එක්ව ආරම්භ කරන ලද ඒකාබද්ධ ආචාර්ය උපාධි ආකෘතිය ඇතුළත් වේ.

- ඒකාබද්ධ ආචාර්ය උපාධි සිසුන් ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු, කොළඹ, පේරාදෙණිය හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල එක් ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් සහ හැකි නම් අදාළ අපේක්ෂකයාගේ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් විසින් සම-අධීක්ෂණය සිදු කරනු ලැබේ.

ii. භින්න/ බාහිර ආචාර්ය උපාධි ආකෘතිය

භින්න ආචාර්ය උපාධි සිසුන්ට, ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධීක්ෂකවරුන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් ඕනෑම විශ්වවිද්‍යාලයක දේශීය අධීක්ෂකවරයෙකු සිටී.

2023 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම තවත් වසර 5ක කාලයක් සඳහා අලුත් කරන ලදී. කෙසේ වෙතත්, 2023 මාර්තු 15 දිනැතිව ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් විසින් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලද ලිපිය මගින් නිකුත් කරන ලද වත්මන් මූල්‍ය රෙගුලාසි හේතුවෙන් 2024 දී මේ යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානය කර නොමැත.

iii. ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය (IUJ) සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමට සම අනුග්‍රහය සහිත ශිෂ්‍යත්ව වැඩසටහනක් දියත් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් එකඟතා ලිපියට අනුව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය පන්ති ගාස්තුවෙන් 50% අරමුදල් සපයනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පන්ති ගාස්තුවෙන් ඉතිරි 50% (ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු ලැබේ) සහ ජපාන යෙන් 90,000ක මාසික ජීවන දීමනාවක් සඳහා අරමුදල් සපයනු ඇත. අධ්‍යයන නිවාඩු මත විදේශගත වන අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගුවන් ගමන් සඳහා ගෙවනු ලබන ප්‍රදාන ද හිමිවනු ඇත. කෙසේ වෙතත්, වර්තමාන මූල්‍ය රෙගුලාසි හේතුවෙන් 2024 දී මේ යටතේ කිසිදු ශිෂ්‍යත්වයක් ප්‍රදානය කර නොමැත.

vi. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය (RMIT විශ්වවිද්‍යාලය) අතර පර්යේෂණ පුහුණු සහයෝගීතාව (ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන) - 2024

ශ්‍රේණිගත කිරීම්වල ලෝකයේ 140 වැනි ස්ථානය හිමි (QS ලෝක ශ්‍රේණිගත කිරීම 2023) ඕස්ට්‍රේලියානු උසස් අධ්‍යාපන ආයතනයක් වන රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය (RMIT) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ හවුල් වී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කනිෂ්ඨ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහනක් හරහා පුහුණු කිරීමට කටයුතු කර ඇත.

රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය 2018 හි ආරම්භ කරන ලද අතර දැනට අධ්‍යයන කටයුතු සිදු කරන අපේක්ෂකයන් 32ක් සහ උපාධි සම්පූර්ණ කිරීම් 4ක් සමඟ ඉතා සාර්ථක ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් පිරිනමා ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යයන ආයතන හතරක් සමඟ ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් ස්ථාපිත කර ඇත:

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN)
- මොරටුව විශ්වවිද්‍යාලය (MRT)
- රුහුණු විශ්වවිද්‍යාලය (RUH)
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP)

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ආචාර්ය උපාධි සුදුසුකම් සහිත ආචාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම මගින් ශාස්ත්‍රාලිකයන්ගේ පර්යේෂණ ධාරිතාව ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හවුල්කාරිත්වය තුළින් රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනයේ ගෝලීය ව්‍යාප්තිය වැඩිදියුණු කරන අතර ශ්‍රී ලංකාවේ ආයතනවල පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කරනු ඇත. ඒ අනුව, ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2023 පෙබරවාරි 16 වැනි දින අවබෝධතා ගිවිසුමකට එළඹුණි.

ඒ අනුව, රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය විසින් PhD ශිෂ්‍යත්ව 10ක් දක්වා උපරිම වසර 3.5ක පන්ති ගාස්තු ශිෂ්‍යත්වයක් පිරිනමන අතර (ආසන්න වටිනාකම: AU $80,000) මෙල්බර්න් හි සිටින කාලය අතරතුර මාස 12ක් දක්වා RMIT දීමනාවක් (ජීවන වියදම් දීමනාවක්) (ආසන්න වටිනාකම: AU $35,000) පිරිනමනු ලැබේ. තවද, මෙල්බර්න් හි සිටින කාලය තුළ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය විසින් මාස 12 ක් දක්වා ජීවන දීමනාවක් ලබා දෙන බැවින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත මූල්‍යමය බැඳීමක් නොමැත.

2023 දී, රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබුවේ අපේක්ෂකයින් හය දෙනෙකු පමණක් වන අතර, ඉතිරි පුරප්පාඩු හතර 2024 දක්වා ඉදිරියට ගෙන යන ලදී. ඒ අනුව,

2024 සඳහා ශිෂ්‍යත්ව 14 ක් ලබා ගත හැකි විය. 2024 සැප්තැම්බර් මාසයේදී, ශිෂ්‍යත්වය සඳහා අයදුම්පත් කැඳවන ලද අතර, අපේක්ෂකයින් 14 දෙනෙකු තෝරා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ 2024 නොවැම්බර් මාසයේ දී අවසන් කරන ලදී.

18.2 විදේශ හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU) / එකඟතා

i. විදේශීය හවුල්කරුවන් සමඟ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් (MoU)/ එකඟතා අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම - රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අවබෝධතා ගිවිසුම් (MoU)/ එකඟතා අත්සන් කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා තත්‍ය කාලීන ඩිජිටල් පුවරුව (Real - time digital dashboard) යොදා ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එහි 1121 වන සභා වාරයේ දී, ආචාර්ය සුරේන් රාඝවන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට යවන ලද ලිපිය (2024.03.15 දිනැති) සමාලෝචනය කරන ලදී. පවතින රජයේ චක්‍රලේඛවලට අනුව, සියලුම අමාත්‍යාංශ සහ ආයතන විදේශීය රාජ්‍යයන්, ණය දෙන ආයතන, සංවිධාන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සම්බන්ධ වීමෙන් වැළකී සිටිය යුතු බව එහි සඳහන් විය. ඒ වෙනුවට, සියලුම මූල්‍ය සහ ද්‍රව්‍යමය ඉල්ලීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා යා යුතු අතර, පිටපතක් විදේශ කටයුතු අමාත්‍යාංශයට යා යුතු වේ.

රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් අත්සන් කරන ලද බොහෝ අවබෝධතා ගිවිසුම්/එකඟතා රටට ප්‍රතිලාභ ලබා දෙන අතර, ශිෂ්‍යත්ව, පර්යේෂණ ප්‍රදාන සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඉගැන්වීමේ අවස්ථා ලබා දීම මඟින් විදේශ අරමුදල් සපයයි. බොහෝ විශ්වවිද්‍යාල දැනුම, ධාරිතා වර්ධනය සහ විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වැඩි දියුණු කරමින් කීර්තිමත් ආයතන සමඟ ජාත්‍යන්තර සහයෝගීතාවන් ඇති කර ගෙන ඇත. කෙසේ වෙතත්, දීර්ඝ අනුමත කිරීමේ ක්‍රියා පටිපාටි දිගුකාලීන පර්යේෂණ හවුල්කාරිත්වයන්ට බාධා ඇති කරයි. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයට දන්වා ඇත්තේ අනුමැතිය ප්‍රමාද වීම බොහෝ විට විදේශ අරමුදල් අවස්ථා අහිමි වීමට හේතු වන බවයි.

එබැවින්, 2024.03.07 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමේ දී එකඟ වූ පරිදි, රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා අවබෝධතා ගිවිසුම්/එකඟතා අනුමත කිරීම් කඩිනම් කිරීම සඳහා ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා විසින් කමිටුවක් පත් කරන ලද බව කොමිෂන් සභාව සඳහන් කරන ලදී.

අවබෝධතා ගිවිසුම් / එකඟතා සමාලෝචනය කිරීම සහ නිෂ්කාශනය/ අනුමැතිය සඳහා ඒවා ලැබිය යුත්තේ කුමන රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ද යන්න තීරණය කිරීම කමිටුවට පැවරී තිබුණි. ඊට අමතරව, නිර්දේශ සහ ප්‍රතිචාර ලබා දීම සඳහා පාර්ශ්වකරුවන් සඳහා වෙබ් ද්වාරයක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම එහි වගකීම විය.

මේ සඳහා පහසුකම් සැලසීම සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තත්‍ය කාලීන ඩිජිටල් පුවරුවක් සංවර්ධනය කර 2024.09.18 දින නිල වශයෙන් දියත් කරන ලදී. මෙම වේදිකාව විශ්වවිද්‍යාල නිලධාරීන්ට සහ පාර්ශවකරුවන්ට අවබෝධතා ගිවිසුම් තත්ත්වයන් නිරීක්ෂණය කිරීමට, අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කිරීමට සහ ප්‍රතිචාර කාර්යක්ෂමව සැපයීමට හැකියාව ලබා දෙයි.

ඩිජිටල් පුවරු කොටස්කරුවන්:

- **විශ්වවිද්‍යාල:** අවබෝධතා ගිවිසුම්/එකඟතා ඉදිරිපත් කිරීම.
- **A කමිටුව:** මූලික සමාලෝචනය සඳහා වගකිව යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළත් වේ.
- **B කමිටුව:** අධ්‍යාපන අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය වැනි විවිධ අමාත්‍යාංශ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තුවල නියෝජිතයින් අවසාන සමාලෝචන සිදු කරයි.

ක්‍රියාවලි දළ විශ්ලේෂණය:

A කමිටුව:

1. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුම්/එකඟතා සමාලෝචනය කරයි.
2. ඒවා B කමිටුවට යොමු කිරීම හෝ සංශෝධන සඳහා විශ්වවිද්‍යාල වෙත ආපසු යැවීම.
3. අවශ්‍ය නම් අමතර තොරතුරු ඉල්ලා සිටීම.

B කමිටුව:

1. අවසාන සමාලෝචනය සිදු කර නිර්දේශ ලබා දෙයි.
2. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද අවබෝධතා ගිවිසුම් අවසාන අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරයි.
3. පැහැදිලි කිරීම් අවශ්‍ය නම්, අවබෝධතා ගිවිසුම ප්‍රතිපෝෂණ සහිතව විශ්වවිද්‍යාලයට ආපසු එවනු ලැබේ.

සියලුම විශ්වවිද්‍යාල සහ කමිටු සාමාජිකයින්ට මෙම ඩිජිටල් පුවරුව සඳහා පිවිසීමේ අවසරය ලැබී ඇත.

මෙම ඩිජිටල් පුවරුවේ මූලික අරමුණ වන්නේ අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම, ප්‍රමාදයන් අවම කිරීම සහ එක් එක් අවබෝධතා ගිවිසුමේ හෝ එකඟතාවයේ තත්ත්වය පිළිබඳ තත්‍ය කාලීන යාවත්කාලීන කිරීම් සැපයීමයි.

තවද, ඩිජිටල් පුවරුවේ ප්‍රතිලාභ සහ ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීම සඳහා B කමිටුව සමඟ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී. එය ඉදිරිපත් කිරීමේ

ක්‍රියා පටිපාටි සහ තත්‍ය කාලීන අනුමත කිරීම් නිරීක්ෂණය කිරීම ආවරණය කරයි.





ඊට අමතරව, පූර්ව අනුමැතිය සඳහා පාර්ශවකරුවන්ට පද්ධතිය පහසුවෙන් හැසිරවීමට උපකාර කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුළුල් මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. එය අවබෝධතා ගිවිසුම් සහ එකඟතා අත්සන් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව විධිමත් කරයි.

19. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල


අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්ථාපිත කර ඇත. ඒ අනුව 1999 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන් සඳහා දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ලෙස විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ පාලනය, සාමාන්‍යයෙන් භාවිතා කරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රාමුවට අමතරව ආයෝජන කමිටුව, අධීක්ෂණ මණ්ඩලය සහ කොමිෂන් සභාව මගින් ශක්තිමත් කර ඇත.


අවුරුදු 20ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සහ අනිවාර්ය විශ්‍රාම යන වයස දක්වා සේවය කළ සේවකයින්, ජීවිත කාලය පුරාම මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි. විශ්‍රාමිකයෙකු මිය ගිය විට විශ්‍රාම වැටුපෙන් 50% වැන්දඹුව/වැන්දඹු පුරුෂයා වෙත ගෙවනු ලබන අතර අනෙක් 50% සමානව බෙදා දරුවන්ට වයස අවුරුදු 18 වන තෙක් ගෙවනු ලැබේ. වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ නොකළ සේවකයකුගේ, විශ්‍රාම මුදල හා පොලිය ඔහු/ඇය විශ්‍රාම යන අවස්ථාවේදී ආපසු ගෙවනු ලැබේ.


19.1 ප්‍රධාන මූල්‍ය තොරතුරු


		2020	2021	2022	2023	2024
1	සාමාජිකයන්					
	ක්‍රියාකාරී සාමාජිකයන්	15,211	16,602	16,191	15,553	15,183
	අක්‍රිය සාමාජිකයන්	2,203	2,139	2,420	2,764	3,037
	මුළු සාමාජිකයන් ගණන	17,234	18,201	18,611	18,317	18,220
2	මුළු සාමාජිකත්වය	21,951	23,449	24,467	25,118	25,598
3	විශ්‍රාම වැටුප් ලබන සාමාජිකයන් ගණන	351	402	449	531	581
4	එකවර මුදල් ආපසු ගෙවන සාමාජිකයන් ගණන	1,186	1,287	1,469	1,854	2,130
3	අරමුදලේ ශේෂය (රු.මි)					
	දායකයින්ගේ අරමුදල	13,473	16,238	19,559	23,874	28,742
	විශ්‍රාමිකයන්ගේ අරමුදල සහ සංචිත	855	914	1,189	1,445	1,740
	මුළු අරමුදල (රු. මිලියන)	14,328	17,152	20,748	25,320	30,482
	අරමුදලේ වර්ධනය %	22%	19.71%	21%	22 %	20%
4	මුළු ආයෝජනය (රු.මි)	13,347	15,967	19,059	24,074	27,528
5	මුළු ආයෝජන ආදායම (රු.මි)	1,333	1,444	2,300	3,726	4,067
6	ආදායම් බදු (රු.මි)	190	206	320	511	555
7	ආයෝජන මත ප්‍රතිලාභ (%)	9.98%	9.05%	12.07%	15.48%	14.77%
8	සාමාජිකයන්ට ප්‍රකාශිත පොලිය	9.6%	8.4%	10%	15%	13%
9	විශ්‍රාම වැටුප් ගෙවීම් (රු.මි)	93	107	145	166	200
10	විශ්‍රාම වැටුප් ගෙවීමේ වර්ධනය	23%	15%	36%	14%	21 %

වගුව 19.1 විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රධාන මූල්‍ය තොරතුරු


විශ්‍රාම වැටුප් ගෙවීම්
210
180
150
120
90
60
30
-
රු. මිලියන
2020
2021
2022
2023
2024
වර්ෂය


අරමුදලේ වර්ධනය
32,000
28,000
24,000
20,000
16,000
12,000
8,000
4,000
0
රු. මිලියන
2020
2021
2022
2023
2024
වර්ෂය



2024.12.31 දිනට මුළු ආයෝජනය
භාණ්ඩාගාර බැඳුම්කර 47.68%
අරමුදල් කළමනාකරණ ගිණුම 0.02%
කෙටි කාලීන 0.00%
රාත්‍රී කාලීන 0.08%
භාණ්ඩාගාර බිල්පත් 0.89%
ස්ථාවර තැන්පතු 32.88%
ණයකර 18.45%



19.2 2024.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

කාණ්ඩය	2023/12/31		2024/12/31	
	කල්පිරීමේදී අගය (රු.මි)	කොටස (%)	කල්පිරීමේදී අගය (රු.මි)	කොටස (%)
භාණ්ඩාගාර බැඳුම්කර / භාණ්ඩාගාර බිල්පත්	11,428.99	46.54	13,926.10	49.59
ස්ථාවර තැන්පතු	7,950.00	32.38	9,050.00	32.22
ණයකර	4,780.00	19.47	5,080.00	18.09
කෙටි කාලීන හා රාත්‍රී කාලීන	396.00	1.61	28.43	0.10
එකතුව	**24,554.99**	**100.00**	**28,084.53**	**100.00**

වගුව 19.2 **2024.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල**


2024 දෙසැම්බර් 31 දිනට ආයෝජනවල සංයුතිය
0.10% කෙටි කාලීන හා රාත්‍රී
18.09% ණයකර
49.59% භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්
32.22% ස්ථාවර තැම්පතු


20. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල


1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ "විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල" පිහිටුවනු ලැබූ අතර එක් එක් විශ්වවිද්‍යාල තම සේවකයන් සඳහා වෙන් වෙන් වශයෙන් අර්ථසාධක අරමුදල පවත්වාගෙන ගියේය. 1972 දී 1972 අංක 01 දරන ලංකා විශ්වවිද්‍යාල පනත මගින් "විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල" මධ්‍යගත කරන ලදී. ඒ අනුව, සනාතන සභාව ඒකාබද්ධ කරන ලද "අර්ථසාධක අරමුදල" පවත්වාගෙන යන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1978 දී පිහිටුවන ලද අතර ඒ අනුව "විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල" පිහිටුවන ලදී.


20.1 මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය– විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල


	දින වන විට	2020	2021	2022	2023	2024
1. **සාමාජිකයන්**						
ක්‍රියාකාරී සාමාජික ගිණුම්	දෙසැ. 31	22,318	23,046	23,349	22,447	21,874
අක්‍රිය සාමාජික ගිණුම්	දෙසැ. 31	22,980	24,498	24,784	25,996	28,236
2. **මුදල් ආපසු ගෙවීම්**						
ආපසු ගෙවීම් කළ ගණන	දෙසැ. 31	2,717	2,872	3,771	4,415	2,519
සිදුකළ ආපසු ගෙවීම්වල වටිනාකම (රු.මි)	දෙසැ. 31	2,712	3,293	3,746	5,203	3,905
3. අරමුදල් ශේෂය (රු.මි)	දෙසැ. 31	56,059	63,026	71,096	81,010	93,243
4. ණය ශේෂය (රු.මි)	දෙසැ. 31	7,432	7,715	10,825	13,190	14,253
5. සාමාන්‍ය සංචිතය (රු.මි)	දෙසැ. 31	65	145	695	325	331
7. වර්ෂය තුළ දී ලබා දුන් ණය (රු.මි)	දෙසැ. 31	1,471	1,678	4,505	4,581	3,240
8. මුළු ආයෝජනය (රු.මි)	දෙසැ. 31	45,585	51,991	56,441	64,724	71,958
9. ආයෝජන ආදායම (රු.මි)	දෙසැ. 31	4,741	4,932	7,004	9,884	10,357
10. ආදායම් බදු (රු.මි)	දෙසැ. 31	674	703	983	1,377	1,437
11. ආයෝජන මත ප්‍රතිලාභ (බදුවලට පෙර)	දෙසැ. 31	10.40%	9.49%	12.41%	15.27%	14.39%
12. ප්‍රකාශිත පොළිය - ආරම්භක ශේෂය සඳහා	ජන. 01	9.60%	8.40%	10.00%	15.00%	13.00%

වගුව 20.1 මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය– විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල


විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වර්ධනය
(2020 - 2024)
රු. බිලියන
100.0
80.0
60.0
40.0
20.0
0.0
56.1
63.0
71.1
81.0
93
2020
2021
2022
2023
2024
අරමුදල් වටිනාකම


විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සම්පූර්ණ වාර්ෂික ආයෝජන ආදායම
(2020-2024)
රු.මිලියන
12,000
10,000
8,000
6,000
4,000
2,000
-
2020
2021
2022
2023
2024
මුළු ආයෝජන ආදායම



විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මුදල් ආපසු ගෙවීම (2020-2024)
5,000
4,000
3,000
2,000
1,000
-
6,000
5,000
4,000
3,000
2,000
1,000
-
2,712
3,293
3,746
5,203
3,905
2020
2021
2022
2023
2024
ආපසු ගෙවූ මුදල්වල වටිනාකම (රු.මි.)
ආපසු ගෙවීම් ගණන




20.2 2024.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

	31/12/2023		31/12/2024	
	කල්පිරීමේදී අගය (රු.මි)	කොටස (%)	කල්පිරීමේදී අගය (රු.මි)	කොටස (%)
භාණ්ඩාගාර බැඳුම්කර	27,451.12	41.98	34,251.12	46.96
ස්ථාවර තැන්පතු	17,660.00	27.01	21,910.00	30.04
ණයකර	19,870.00	30.38	16,570.00	22.72
කෙටි කාලීන හා රාත්‍රී කාලීන	413.54	0.63	199.54	0.27
එකතුව	**65,394.66**	**100.00**	**72,930.66**	**100.00**

වගුව 20.2 2024.12.31 දිනට ආයෝජනවල සාරාංශය – විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල





21. 2024 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි

සංශෝධිත 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතට පැවරී ඇති බලතල, යුතුකම් සහ කාර්යයන් ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අදාළ රජයේ ආයතන විසින් කරන ලද නියෝග සමඟ සමාලෝචිත කාල සීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම සඳහා 2024 වර්ෂය තුළ පහත දැක්වෙන කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී.

(අ) කොමිෂන් සභා චක්‍රලේඛ

අංකය	කොමිෂන් සභා චක්‍රලේඛ අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
01	01/2024	ආයතනයක අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම	01.01.2024
02	02/2024	පවතින උපාධි/පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහනක් සඳහා කලින් ඉවත්වීමේ (Early Exit) හෝ අධ්‍යයනය අවසන් කිරීමේ (Fall-back Qualifications) සුදුසුකම් හඳුන්වාදීම.	03.01.2024
03	03/2024	අධ්‍යයන දීමනාව සංශෝධනය කිරීම	16.01.2024
04	04/2024	ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණ සඳහා ලකුණු ලබා දීමේ පරිපාටි - ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී /අභ්‍යන්තර විගණක තනතුරට බඳවා ගැනීම	17.01.2024
05	05/2024	ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණ සඳහා ලකුණු ලබා දීමේ පරිපාටි - ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී /අභ්‍යන්තර විගණක තනතුරට බඳවා ගැනීම	27.02.2024
06	06/2024	කොවිඩ් -19 වසංගතය සමඟ ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් බැඳුම්කර සහ ගිවිසුම්වල සඳහන් අධ්‍යයන පාඨමාලා කාලසීමාව දීර්ඝ කිරීම	27.02.2024
07	07/2024	විශ්වවිද්‍යාල පද්ධතියේ සේවිකාවන් සඳහා ප්‍රසූත නිවාඩු සහ මව්කිරිදීමේ සහන කාලසීමාව	01.03.2024
08	08/2024	සහකාර මහාචාර්ය, මහාචාර්ය සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යන පදවි නාම භාවිතා කිරීම ක්‍රියාත්මක වන කාල සීමාව	25.03.2024
09	09/2024	අධ්‍යයන දීමනාව සංශෝධනය කිරීම	03.04.2024
10	10/2024	විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන පරිපාලන නොවන තනතුරු සඳහා බාහිර බඳවා ගැනීම්	09.04.2024
11	11/2024	රාජ්‍යතාන්ත්‍රික (DPL) ප්‍රජාව සමඟ ගනුදෙනු කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රොටෝකෝලය සහ ක්‍රියා පරිපාටි	24.04.2024

අංකය	කොමිෂන් සභා චක්‍රලේඛ අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
12	12/2024	තාක්ෂණ විෂය ධාරාව යටතේ පිරිනමනු ලබන උපාධි වැඩසටහන් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයට අදාළ මාර්ගෝපදේශය	11.10.2024
13	13/2024	දේශීය වෛද්‍ය පීඨවලට අදාළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ - (වෛද්‍ය/දන්ත වෛද්‍ය නොවන) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිවලට සංශෝධන	12.11.2024
14	14/2024	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව ප්‍රාථමික මට්ටමේ (නූපූහුණු), ප්‍රාථමික මට්ටමේ (අර්ධ පුහුණු) සහ ප්‍රාථමික මට්ටමේ (පුහුණු) ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ පරිපාටි	23.12.2024

වගුව 21(අ) කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි

(ආ) ආයතන චක්‍රලේඛ ලිපි

අංකය	ආයතන චක්‍රලේඛ ලිපි අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
01	01/2024	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/2023 අන්තර්ග්‍රහණය කර ගැනීම - රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2024 වසර	10.01.2024
02	02/2024	76 වන නිදහස් දින සැමරුම් උත්සවය - 2024	01.02.2024
03	03/2024	රාමලාන්(රාමසාන්) සමයේ විශේෂ නිවාඩු ලබා දීම- 2024	06.02.2024
04	04/2024	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අන්තර්ග්‍රහණය කර ගැනීම - ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19.5 උපවගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය	30.04.2024
05	05/2024	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/මහාචාර්ය/ සහකාර මහාචාර්ය හෝ පුස්තකාලයාධිපති/නියෝජ්‍ය පුස්තකාලයාධිපති යන තනතුරු හැර ආචාර්ය තනතුර (Post of Teacher) සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය.	01.10.2024
06	06/2024	විශ්වවිද්‍යාල පද්ධතියේ ගුරුවරුන් හැර අනෙකුත් සේවකයන්ගේ විශ්‍රාම යන වයස	26.11.2024
07	07/2024	'Marshal' තනතුර සඳහා භාවිතා කරන සිංහල යෙදුම් වෙනස් කිරීම	26.11.2024
08	08/2024	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2024 අන්තර්ග්‍රහණය කර ගැනීම - රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2025 වර්ෂය	30.12.2024

අංකය	ආයතන චක්‍රලේඛ ලිපි අංක	විෂය	චක්‍රලේඛයේ දිනය
09	09/2024	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/2024 අන්තර්ග්‍රහණය කර ගැනීම - “ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka)” ජාතික වැඩසටහන සමඟ 2025 වසරේ රාජකාරී කටයුතු ඇරඹීම	31.12.2024

වගුව 21(ආ) ආයතන චක්‍රලේඛ ලිපි

22. යටිතල පහසුකම් සංවර්ධනය

2024 වසරේ දී, නව ඉදිකිරීම් හා අඛණ්ඩව සිදු කෙරෙන ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සහ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 7,500 ක මුදලක් වෙන් කරන ලදී. 2024 වසර අවසන් වන විට රු.මිලියන 6744ක මුළු මුදලක් භාණ්ඩාගාරය විසින් නිර්දේශ කර නිකුත් කරන ලදී.

වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 05 ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, 2024 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම කිසිදු ව්‍යාපෘතියක් අනුමත කරන නොලදී. 2024 වර්ෂයේ දී භෞතික වශයෙන් ව්‍යාපෘති 01ක කටයුතු ආරම්භ කර ඇති අතර වර්ෂය අවසන් වන විට, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වටිනාකම රු. මිලියන 18,074 ක් වන වැඩ ආරම්භ කර සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 39 ක් පැවති අතර එම කාල සීමාව තුළ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ගණන 02 කි. විස්තර පහත දැක් වේ.

	2022		2023		2024	
	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)	ව්‍යාපෘති සංඛ්‍යාව	මුළු වටිනාකම (රු.මි)
වි.ප්‍ර.කොං. වෙත ලැබුණු ව්‍යාපෘති යෝජනා ගණන	10	14,733.95	9	9,673.15	5	9,472.51
වි.ප්‍ර.කොං. මගින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	8	2,200.65	-	-	-	-
ජාතික ක්‍රමසම්පාදන දෙ. වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	8	2,200.65	-	-	-	-
ජාතික ක්‍රමසම්පාදන දෙ . විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	-	-	-	-	-	-
අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	-	-	-	-	-	-
වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන	-	-	-	-	1	170.9
දැනට සිදුකරගෙන යන ව්‍යාපෘති ගණන (සිදු කෙරෙමින් පවතින)	56	28,748	-	-	39	18,074
අවසන් කර ඇති ව්‍යාපෘති ගණන	1	99.1	-	-	2	519.1

වගුව 22 නිම කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දුන් ව්‍යාපෘති

23. ශිෂ්‍ය කටයුතු සහ සුභසාධන අංශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2022.11.17 දින පැවති සිය 1090 වැනි සභා වාරයේ දී ශිෂ්‍ය කටයුතු/ දුක්ගැනවිලි හැසිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙනම අංශයක් පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගනිමින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට "ශිෂ්‍ය කටයුතු සහ සුබසාධන අංශය" නමින් නව අංශයක් නිර්මාණය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2024 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත විවිධ මැදිහත්වීම් සඳහා සිසුන්ගෙන් ඉල්ලීම් 125 ක් ලැබුණු අතර, ඒ සියල්ලටම කඩිනමින් විසඳුම් ලබා දෙන ලදී. විශ්වවිද්‍යාල අනුව වර්ගීකරණය කරන ලද මෙම ඉල්ලීම්වල සාරාංශය පහත දැක්වේ.

අංකය	විශ්වවිද්‍යාලය	මුළු ඉල්ලීම්
01	කොළඹ විශ්වවිද්‍යාලය	08
02	නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව	07
03	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	05
04	කැලණිය විශ්වවිද්‍යාලය	11
05	මොරටුව විශ්වවිද්‍යාලය	02
06	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	10
07	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	06
08	රුහුණු විශ්වවිද්‍යාලය	12
09	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	05
10	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	11
11	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	09
12	සබරගමුව විශ්වවිද්‍යාලය	13
13	ත්‍රිකුණාමලය මණ්ඩපය	03
14	යාපනය විශ්වවිද්‍යාලය	09
15	වව්නියාව විශ්වවිද්‍යාලය	05
16	සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	01
17	ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	05
18	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	03
	එකතුව	125

වගුව 23 විශ්වවිද්‍යාලය අනුව වර්ගීකරණය කරන ලද ඉල්ලීම්වල සාරාංශය

24. පර්යේෂණ සහ සංවර්ධන අංශය

කොමිෂන් සභාව 2022.11.17 දින පැවති සිය 1090 වැනි සභා වාරයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ "පර්යේෂණ සහ සංවර්ධන අංශය" නමින් නව අංශයක් ඇති කිරීමට තීරණය කරන ලදී.

25. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2024

2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2024	2023
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	04	234,908,199	226,411,917
ලැබිය යුතු ගිණුම්	05	39,359,232	51,698,313
තොග		5,113,214	9,760,325
ඉදිරියට කළ ගෙවීම්/තැන්පතු	06	8,284,499	9,290,151
මුළු ජංගම වත්කම්		**287,665,144**	**297,160,705**
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ	07	65,283,147	98,600,580
ඉඩම් සහ ගොඩනැඟිලි	07	559,980,241	570,649,772
අස්පෘශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග	08	2,201,166	4,375,228
සිදු කරමින් පවතින වැඩ - පරිගණක මෘදුකාංග	09	1,148,000	1,148,000
ආයෝජන	10	27,398,816	27,147,972
ආයෝජනය - පාරිතෝෂිකය	11	29,901,711	30,467,291
පරිත්‍යාග / ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන	12	40,722,417	40,722,417
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	05	24,802,663	24,935,015
මුළු ජංගම නොවන වත්කම්		**751,438,161**	**798,046,275**
මුළු වත්කම්		**1,039,103,304**	**1,095,206,981**
ස්කන්ධය හා වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු	13	70,233,249	290,490,667
ඉදිරියට ලද ගෙවීම්/තැන්පතු	14	32,738,130	25,686,556
වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - විශ්වවිද්‍යාල	15	48,267,005	17,982,819
මුළු ජංගම වගකීම්		**151,238,384**	**334,160,041**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම්	16	102,035,096	91,305,682
පරිත්‍යාග අරමුදල	17	56,664,592	52,446,002
මුළු ජංගම නොවන වගකීම්		**158,699,688**	**143,751,684**
මුළු වගකීම්		**309,938,072**	**477,911,725**
ශුද්ධ වත්කම්		**729,165,233**	**617,295,255**

2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2024 රු	2023 රු
විශ්වවිද්‍යාල අරමුදල සහ සංචිත			
විශේෂ අරමුදල්	**18**	2,673,632	2,426,017
විශේෂ අරමුදල්	**15**	40,823,818	36,347,763
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල		27,108,386	25,233,454
UGC සංවර්ධන අරමුදල		26,370,779	26,370,779
ප්‍රත්‍යාගනනය අතිරික්තිය - ඉඩම් සහ ගොඩනැගිලි		509,313,767	509,313,767
ප්‍රත්‍යාගනනය අතිරික්තිය - මෝටර් වාහන		44,903,164	44,903,164
සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය)		77,971,686	(27,299,689)
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**729,165,233**	**617,295,255**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයින් වගකීමෙන් බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයින් විසින් අනුමත කොට අත්සන් කරන ලදී;

ආර්.ඒ.යූ.රණවීර
ගණකාධිකාරී

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න
සභාපති

මහාචාර්ය හේමමාලි ගුණතිලක
කොමිෂන් සභා සාමාජික

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
අතිරික්තය/(ඌනතාවය)	121,481,084	(49,886,915)
ගැලපීම්		
ක්ෂයවීම්/ක්‍රමක්ෂය	49,306,122	54,585,278
මාරු කිරීම්/ සමුච්චිත ක්ෂයවීම් කපා හැරීම්- පරිගණක	(132,300)	-
සංවර්ධන අරමුදලට මාරු කිරීම	(16,209,708)	(11,552,864)
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	18,643,959	6,755,811
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**173,089,156**	**(98,689)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
තොග (වැඩි වීම)/අඩුවීම	4,647,111	4,464,730
ගෙවිය යුතු මුදල් වැඩි වීම /අඩු වීම	(182,921,657)	(144,591,078)
පාරිතෝෂිකය සඳහා පොලිය	3,568,817	3,569,617
පෙරගෙවුම්/තැන්පතු (වැඩි වීම)/අඩු වීම	1,005,651	(1,662,581)
ලැබිය යුතු (වැඩි වීම)/අඩු වීම	12,471,433	4,301,203
පාරිතෝෂික ගෙවීම	(10,917,782)	(14,650,942)
මෙහෙයුම් කටයුතු වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහ	**942,730**	**(148,667,739)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ උපකරණ අත් කර ගැනීම	(3,174,796)	(2,929,097)
දේපළ, පිරියත සහ උපකරණ මාරු කිරීම් /කපා හැරීම්	162,000	-
ස්ථාවර තැන්පතු/භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම	(250,843)	(1,459,690)
සිදු කෙරෙමින් පවතින වැඩ (වැඩි වීම)/අඩු වීම	-	265,500
ආයෝජන කටයුතු සඳහා භාවිතා කරන ශුද්ධ මුදල්	**(3,263,640)**	**(4,123,287)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
නිශ්චිත ක්‍රියාකාරකම් සඳහා ලැබුණු අරමුදල්	247,615	423,173
ලැබුණු සහ වියදම් නොකළ රජයේ ප්‍රදාන	4,476,055	23,618,904
ශිෂ්‍යත්ව අරමුදලෙන් ලැබුණු මුදල්/ගෙවීම්	4,218,590	10,656,983
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලෙන් ලැබීම්/ගෙවීම්	1,874,932	-
මූල්‍ය කටයුතු සඳහා භාවිතා කරන ශුද්ධ මුදල්	**10,817,192**	**34,699,060**
මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	8,496,283	(118,091,966)
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	226,411,917	344,503,883
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**234,908,199**	**226,411,917**
සටහන - 2024/12/31 දිනට බැංකු ශේෂයන්		
UGC A/C 2323284 - ලංකා බැංකුව	(12,681,988)	(71,253,201)
ලංකා බැංකුව -විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල	18,121,437	14,655,300
රාත්‍රී කාලීන තැන්පතු	218,000,000	273,000,000
අරමුදල් කළමනාකරණ ගිණුම	9,501,850	9,231,917
මහජන බැංකුව-එකතු කිරීමේ ගිණුම	1,966,900	777,900
එකතුව	**234,908,199**	**226,411,917**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

විස්තරය	රඳවා ගත් අතිරික්තය/ (ඌනතාවය)	UGC සංවර්ධන අරමුදල	නැවත තක්සේරු අතිරික්තය	නැවත තක්සේරු කිරීම අතිරික්තය - මෝටර් වාහන	කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානය - UGC	මුළු ශුද්ධ වත්කම් ස්කන්ධය
2023 ජනවාරි 1 වන දිනට ශේෂය	**24,356,493**	**36,154,376**	**509,313,767**	**44,903,164**	**25,233,454**	**12,728,859**	**652,690,113**
ලැබී ඇති රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන UGC	-	-	-	-	-	26,000,000	**26,000,000**
වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	(49,886,915)	-	-	-	-	-	**(49,886,915)**
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල්වලට අදාළ වියදම්	-	-	-	-	(17,494,893)	-	**(17,494,893)**
ආයෝජන පොලිය	-	-	-	-	5,942,029	-	**5,942,029**
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලට අරමුදල් මාරු කිරීම	(11,552,864)	-	-	-	11,552,864	-	**-**
වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම	-	-	-	-	-	(2,381,096)	**(2,381,096)**
පුනරාවර්තන ප්‍රදාන හිඟය මූල්‍යයට අරමුදල් මාරු කිරීම	9,783,597	(9,783,597)					**-**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(27,299,689)**	**26,370,779**	**509,313,767**	**44,903,164**	**25,233,454**	**36,347,763**	**614,869,239**
වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	121,481,084	-	-	-	-	-	**121,481,084**
ලැබී ඇති රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන UGC						9,000,000	**9,000,000**
ආයෝජන පොලිය					1,874,932		**1,874,932**
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලින් කරනලද වියදම්					(16,209,708)		**(16,209,708)**
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලට අරමුදල් මාරු කිරීම	(16,209,708)				16,209,708		**-**
වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම						(4,523,945)	**(4,523,945)**
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**77,971,686**	**26,370,779**	**509,313,767**	**44,903,164**	**27,108,386**	**40,823,818**	**726,491,601**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2024	2023
		රු.	රු.
ආදායම			
විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම - ජංගම			
රජයේ ප්‍රදාන-පුනරාවර්තන	19	3,278,206,000	2,900,253,224
		3,278,206,000	2,900,253,224
විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම් -ජංගම			
වෙනත් ආදායම්	20	60,408,367	74,328,891
		60,408,367	74,328,891
මුළු ආදායම ජංගම		**3,338,614,367**	**2,974,582,115**
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම් - ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන ප්‍රදාන	21	612,239,759	951,955,037
මුළු ආදායම් ප්‍රාග්ධනය		**612,239,759**	**951,955,037**
මුළු ආදායම		**3,950,854,127**	**3,926,537,152**
මෙහෙයුම් වියදම් - ජංගම			
පුද්ගල පඩිනඩි	22	345,207,762	313,543,013
භාවිතා කළ සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	23	171,612,176	164,618,191
ප්‍රදාන සහ වෙනත් මාරු කිරීම්	24	2,607,709,400	2,427,804,433
අනෙකුත් පුනරාවර්තන වියදම්	25	46,472,620	66,847,210
		3,171,001,958	**2,972,812,848**
මෙහෙයුම් නොවන වියදම් - ප්‍රාග්ධනය			
මානව ප්‍රාග්ධන සංවර්ධනය	26.1	42,715,814	119,805,777
අයවැය යෝජනා	26.2	565,000,000	825,000,000
පුනරුත්ථාපන වියදම්	26.3	1,349,149	4,220,164
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	26.4	49,306,122	54,585,278
		658,371,085	**1,003,611,219**
මුළු වියදම්		**3,829,373,043**	**3,976,424,067**
කාල සීමාව සඳහා මුළු අතිරික්තය/(ඌනතාවය)		**121,481,084**	**(49,886,915)**

කාල සීමාව සඳහා මුළු අතිරික්තය / (ඌනතාවය), පහත පරිදි කාල සීමාව සඳහා ජංගම සහ ප්‍රාග්ධන අතිරික්තයෙන් / (ඌනතාවය) සමන්විත වේ,

කාල සීමාව සඳහා ජංගම අතිරික්තය / (ඌනතාවය)	167,612,409	1,769,267
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය / (ඌනතාවය)	(46,131,326)	(51,656,182)
	121,481,084	**(49,886,915)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } HED/A/UGC/FA/24 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2025 ජූනි ෂ0 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.පොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් :-

01. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම් - මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් හා සංචාරක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UGC/FA/2024 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 ජූනි 30 දින

සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 12(4) හා 8 වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අතුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සෑකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි

මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තිය සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයෙහි 07 වන වගන්තිය හා 2018 දෙසැම්බර් 17 දිනැති අංක 2/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උසස් අධ්‍යාපන ආයතන 19 ක අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ බැඳුම්කර කඩකල නිලධාරීන් 587 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 2,840 ක් හා 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 18 ක් අයකර ගැනීමට කිසිදු සාධනීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු රැස්කිරීම සඳහා වන මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය සඳහා 2019 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත රු.1,148,000 ක් ගෙවා තිබුණු අතර අදාල පද්ධතිය 2023 වසරේ සිට පරීක්ෂණ අවධියේ පවතින බව විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2025 ජූනි වන විට වසර 06ක් ගතවී තිබුණද, එම මෘදුකාංගය භාවිතයට ගත හැකි තත්ත්වයට සංවර්ධනය කිරීමට අපොහොසත් වී තිබීම හේතුවෙන් ගෙවූ මුදල අනාර්ථික වියදමක් වී තිබූ අතර කාලය ඉකුත් වීම නිසා එය වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලද යන්න විගණනයේ දී සැඟීමකට පත්විය නොහැකි විය.

(ආ) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයට ලද පැමිණිලි සඳහා කාලීනව නිසි පියවර ගෙන අවසන් කල යුතු වුවත් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සඳහා උක්ත කේන්ද්‍රය වෙත ලද පැමිණිලි 366 කින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැමිණිලි 201 කට විසඳුම් ලබා දීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) නවක වදය/ලිංගික හිරිහැර කිරීම්වලදී සිසුන්ට/ කාර්ය මණ්ඩලයට වහාම උපකාර ඉල්ලා සිටිය හැකි ජංගම යෙදුමක් සංවර්ධනය කිරීම වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ ගිවිසුමකට එළඹ, එය සැකසීම වෙනුවෙන් රු.715,360 ක පිරිවැයක් දරා තිබුණද වර්ෂාවසානය දක්වාම එකී යෙදවුම සංවර්ධනය කිරීමට කිසිදු සාධනීය පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී මාසික කුලිය රු.350,000 කට ලබා ගෙන තිබුණු වර්ග අඩි 3,337කින් යුත් ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර අංක 24 A, වෝඩ් පෙදෙස, කොළඹ 07 ලිපිනයෙහි පිහිටි වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ල රු.950,000ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 නොවැම්බර් 09 දින ලැබී තිබුණි. නමුත් එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු.350,000ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් දක්වා තවදුරටත් එම ගොඩනැගිල්ල වෙනුවෙන් එකතුව රු.16,800,000ක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණි.

ජී.ඒ.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
1. මූල්‍ය ප්‍රකාශන **1.1 මතය**	කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.	සටහන් කරන ලදී.
1.2 මතය සඳහා පදනම		
1.3 කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු	----	----
1.4මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරනයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්	----	----
1.5මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම	----	----
2.වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව		
2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.	----	----

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තිය සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.	----	----
2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.	----	----
2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.	----	----
2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.	----	----
2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ	----	----

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.		
2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.	**නීතිරීති/විධානයට යොමුව** — (ආ) උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයෙහි 07 වන වගන්තිය හා 2018 දෙසැම්බර් 17 දිනැති අංක 2/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය **අනුකූල නොවීම** — සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උසස් අධ්‍යාපන ආයතන 19ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බැඳුම්කර කඩකල නිලධාරීන් 587 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 2,840 ක් හා 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 18ක් අයකර ගැනීමට කිසිදු සාධනීය වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් සාමාජිකයන් 626 (අධ්‍යයන 605 හා අනධ්‍යයන 21) දෙනෙක් 2024.12.31 වන විට බැඳුම්කර කඩකර ඇති බවට හඳුනාගෙන ඇත. ඒ අතුරින් 441 දෙනෙකු සම්බන්ධයෙන් අදාල මුදල් අයකර ගැනීමට අවශ්‍ය වන පියවර ගෙන ඇති අතර එයින් 44 දෙනෙකු මේ වන විට සම්පූර්ණයෙන්ම ගෙවීම් කර ඇත. එහෙත් කාර්ය මණ්ඩල සාමාජිකයන් 185 දෙනෙකුගේ මුදල් අයකර ගැනීම පවතින නීති රීති යටතේ (1978 විශ්වවිද්‍යාල පනත හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය) කටයුතු කල නොහැකි බැවින් ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එම නිර්දේශ අනුව නීතිපති මතය විමසන ලදී. ඒ අනුව බැඳුම්කර කඩකළ සාමාජිකයින්ගේ එකඟතාවයකින් තොරව මුදල් අය කර ගත නොහැකි බව නීතිපතිතුමා විසින් දැනුම් දී ඇත. එහෙත් තව දුරටත් මෙම මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බවට විශ්වවිද්‍යාල වලට දැනුම් දී ඇත. 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පශ්චාත් උපාධි ප්‍රදාන ලබා ගත් විශ්වවිද්‍යාල ආචාර්යවරු 8 දෙනෙකුගෙන් නැවත අයකර ගැනීමට තිබූ රුපියල් මිලියන 18 න් ආචාර්යවරු දෙදෙනෙකුගෙන් මුදල් සම්පූර්ණයෙන් ම අයකරගෙන ඇති අතර ආචාර්යවරු දෙදෙනෙකු සම්බන්ධයෙන් මේ වනවිට අදාල මුදල අය කරගැනීමට නීතිමය වශයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය පියවර සිදු කර ගෙන යනු ලබන අතර ඉතිරි ආචාර්යවරු 4 දෙනාගෙන් අදාල මුදල අය කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. ඒ අනුව ඉතිරි රු. මිලියන 13 අය කර ගැනීමට අවශ්‍ය පියවර සිදු කරගෙන යනු ඇත. පවතින රාජ්‍ය මුදල් නීති රෙගුලාසි වලට අනුව 2022, 2023 සහ 2024 යන වර්ෂ වලදී පශ්චාත් උපාධි ප්‍රදාන ලබා දීම සිදු නොවුණි. නමුත් දැනට

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
		ලබා දී ඇති ප්‍රදානයන් සම්බන්ධව සමීපව නිරීක්ෂණය කෙරුණු අතර එහිදී ප්‍රදානලාභීන්ගේ සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. ඒ අනුව මේ වන විටත් ඉහත ප්‍රදානලාභීන්ගේ අධ්‍යයන කටයුතුවල වර්තමාන කාර්ය සාධනය පිලිබඳ දැන ගැනීම සඳහා සහ තනතුරු හැරගිය සහ උපාධි නියමිත කාලයේදී සම්පූර්ණ නොකරන ලද ප්‍රදානලාභීන්ගෙන් අය කර ගැනීමට ඇති මුදල් සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා ලිපියක් සියලුම විශ්වවිද්‍යාල වෙත යොමු කර ඇති අතර ඒ සඳහා පිළිතුරු ලිපි මේ වන විට ලැබෙමින් පවතී.
2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	----	----
2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාල සීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.	----	----
2.3 වෙනත් කරුණු	(අ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමණාකරන තොරතුරු රැස් කිරීම සඳහා වන මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය සඳහා 2019 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත රු.1,148,000 ක් ගෙවා තිබුණු අතර අදාල	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමණාකරන තොරතුරු රැස් කිරීම සඳහා වන මෘදුකාංග පද්ධතිය සංවර්ධනය සඳහා 2019 වර්ෂයේදී M/s. Science Land Information Technology (Pvt) Ltd ආයතනය තෝරා ගනු ලැබූ අතර, එහිදී ගිවිසුම් පරිදි සම්පූර්ණ කර තිබූ යම් යම් අදියර සඳහා රු.1,148,000.00 ක මුදලක් අදාල ආයතනය වෙත ගෙවා

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
	පද්ධතිය 2023 වසරේ සිට පරීක්ෂණ අවධියේ පවතින බව විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2025 ජුනි වන විට වසර 06ක් ගත වී තිබුණ ද, එම මෘදුකාංගය භාවිතයට ගත හැකි තත්ත්වයට සංවර්ධනය කිරීමට අපොහොසත් වී තිබීම හේතුවෙන් ගෙවූ මුදල අනාර්ථික වියදමක් වී තිබූ අතර කාලය ඉකුත් වීම නිසා එය වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූල ද යන්න විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය.	ඇත. 2020, 2021 වසර වලදී ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුවෙන් අදාල මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු ප්‍රමාද විය. එසේ වුවද 2023 වසර අවසාන වන විට අදාල මෘදුකාංගයේ සංවර්ධන අදියර අවසන් කර පරීක්ෂණ සහ වාර්තා නිරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට සමත් විය. තවදුරටත් දෙපාර්ශවයේම සහාය ඇතිව දත්ත ඇතුළත් කර වාර්තා නිරීක්ෂණය කරමින් නිවැරදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමින් පවති. අදාල වාර්තා නිරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම අදාල මෘදුකාංගය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු සිදු කරන අතර, තවදුරටත් ගිවිසුම අනුව වසරක වගකීම් කාලයක් යටතේ මෘදුකාංගය පරීක්ෂා කර බලා ඉතිරි ගෙවීම් සිදු කිරීමටත්, මෘදුකාංගයේ පිරිවැය ප්‍රාග්ධනිත කිරීමටත් කටයුතු කරනු ලැබේ.
	(ආ)ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයට ලද පැමිණිලි සඳහා කාලීනව නිසි පියවර ගෙන අවසන් කළ යුතු වුවත් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා උක්ත කේන්ද්‍රය වෙත ලද පැමිණිලි 366 කින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැමිණිලි 201 කට විසඳුම් ලබා දීමට අපොහොසත් වී තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රයේ පද්ධති විශ්ලේෂක තුමියගේ වාර්තා අනුව 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කේන්ද්‍රය වෙත පැමිණිලි 365 ක් ලැබී ඇති අතර (එක් පැමිණිල්ලක් ද්විත්ව වාර්තාගත වීම නිසා අත්හිටුවා ඇත) එම සියලුම පැමිණිලි අදාල විශ්වවිද්‍යාල වෙත යොමු කර ඇත. ඒ අනුව ලද පැමිණිලි අදාල විශ්වවිද්‍යාල වෙතින් විමසීමේ ක්‍රියාවලියේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රගතිය 100% කි. තවද මෙම පැමිණිලි 365න් පැමිණිලි 193ක් සඳහා ක්‍රියාමාර්ග ගෙන එම පැමිණිලි විසඳා ඇති අතර විශ්වවිද්‍යාල විසින් අවසන් කල පැමිණිලි සංඛ්‍යාව 165 සිට 193 දක්වා සාධනීය ලෙස වර්ධනයක් පෙන්නුම් කරයි. (ඇමුණුම අංක - 01). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රය (Centre for Gender Equity/Equality – CGEE) වෙත මෙතෙක් ලැබී ඇති සියලුම පැමිණිලි අදාල විශ්වවිද්‍යාල වෙත යොමුකර ඇත. පැමිණිලි විසඳීමේ ක්‍රියා මාර්ග ගත යුතු වන්නේ අදාල විශ්වවිද්‍යාල බලධාරීන් විසින්ය. මෙම ක්‍රියාවලිය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
		සහ ලේකම්තුමාගේ අත්සනින් යුතුව දින 14 ක් ඇතුළත විමර්ශනය කර වාර්තා කරන මෙන් අදාල පැමිණිලි ඒ ඒ උපකුලපතිතුමා/ තුමිය වෙත මෙන්ම ඒ ඒ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව කටයුතු කරන අධ්‍යක්ෂක/ සම්බන්ධීකාරක වෙතද යොමු කරනු ලැබේ. එමනිසා කේන්ද්‍රය විසින් සිදු කරනු ලබන්නේ අදාල පැමිණිලි ඒ ඒ විශ්වවිද්‍යාල වෙත යොමුකර ඒවායේ ප්‍රගතිය පිළිබඳ ප්‍රතිපෝෂණ ලබා ගැනීමයි. ඒ ඒ විශ්වවිද්‍යාල තුළ අදාල ගැටලු නිරාකරණය කර යුක්තිය සහ සාධාරණත්වය ස්ථාපිත කරන තෙක් කේන්ද්‍රය විසින් ඒ පිළිබඳ අවධානය යොමු කරමින් පසු විපරම් කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රගතිය සෑම ස්ථාවර කමිටු වාරයකදී ම සාකච්ඡා කරනු ලැබේ. එසේ වුව ද අවසාන වශයෙන් සිසුන් හා කාර්ය මණ්ඩලය පිළිබඳ පැමිණිලි සම්බන්ධව විමර්ශනය කර විනය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව අවසාන බලධාරියා අදාල විශ්වවිද්‍යාලවල පාලක මණ්ඩලය බැවින් ඒ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය සීමා වී ඇත. නවකවදය, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය සහ හිංසන පිළිබඳ පැමිණිලි ද්වාරයෙහි ව්‍යුහය වෙනස් කර ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂිකා විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග එම ද්වාරයෙහි පිළිබිඹු වේ. තවදුරටත් විමර්ශනය කළ නොහැකි පැරණි පැමිණිලි අවසන් කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂිකා කටයුතු කර ඇත. පවතින පැමිණිලි පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස උපකුලපතිවරුන්ට දන්වා ඇත. කෙසේ වෙතත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂිකා විසින් පැමිණිලි විසඳීමේ විශ්වවිද්‍යාල යාන්ත්‍රණය විධිමත් කර බලගැන්වීම සඳහා “Strengthening Institutional Capacity for Gender Equity/Equality in Universities and Higher Educational Institutions” නමැති වක්‍රලේඛය සකස් කර ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ කේන්ද්‍රයේ ස්ථාවර කමිටුව වෙත යෝජනා ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
	(ඇ)නවකවදය/ ලිංගික හිරිහැර කිරීම්වල දී සිසුන්ට කාර්ය මණ්ඩලයට වහාම උපකාර ඉල්ලා සිටිය හැකි ජංගම යෙදුමක් සංවර්ධනය කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ ගිවිසුමකට එළඹ, එය සැකසීම වෙනුවෙන් රු.715,360 ක පිරිවැයක් දරා තිබුණ ද වර්ෂාවසානය දක්වාම එකී යෙදවුම සංවර්ධනය කිරීමට කිසිදු සාධනීය පියවරක් ගෙන නොතිබුණි.	විශ්වවිද්‍යාලයන්හි නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ නියාමන කටයුතු සම්බන්ධ ශිෂ්‍යයින් හා කාර්යය මණ්ඩලය අතර දැනුවත්භාවය ඇති කිරීමේ උපායමාර්ග යටතේ විශ්වවිද්‍යාල 14 ක් තුළ හදිසි ආරක්ෂණ Mobile App එකක් හඳුන්වා දීම තුළින් පැමිණිලි සම්බන්ධ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කර තිබුණි. එම ගිවිසුමෙහි 4.2 වගන්තිය ප්‍රකාරව මෙම හදිසි ආරක්ෂණ Mobile App එකේ පළමුවන හා දෙවන නඩත්තු ගාස්තු නිර්දේශ කර ගෙවීම් කටයුතු සිදු කර ඇත. අදාල වගන්තිය: *4.2 The UGC shall finance the support and maintenance costs of the implemented solution after 06 months from the date of agreement signing , which has been estimated as Rs. 357,680.00.* තුන්වන වාරිකය ගෙවීමට පෙර හදිසි ආරක්ෂණ Mobile App එකේ සියලු දත්ත පරීක්ෂා කල අතර එම හදිසි ආරක්ෂණ Mobile App එක නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. මෙම යෙදවුම ඵලදායී අයුරින් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණත් ගිවිසුම ප්‍රකාරව ICTA (Information and Communication Technology Agency) ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2022.01.13 වන දින පැවති 1070 වන රැස්වීමේ තීන්දුව ප්‍රකාරව තුන්වන වාරිකය ගෙවීමට නොහැකි බව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත දන්වා ඇත (ඇමුණුම අංක - 02)
	(ඈ)කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී මාසික කුලිය රු.350,000 කට ලබා ගෙන තිබූ වර්ග අඩි 3,337කින් යුත් ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර අංක 24 A, වෝඩ්	ජාතික අවශ්‍යතාවයක් ලෙස ඉතා වැදගත් කර්තව්‍යක් වූ විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධ මහජන විමසීම් විසඳීම සඳහා තොරතුරු මධ්‍යස්ථානය නමින් නව අංශයක් පිහිටුවා අලුතෙන් කුලියට ගත් පරිශ්‍රයේ එය පවත්වාගෙන යන ලදී. තවද දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීමට අදාලව මහජනතාව සමඟ කටයුතු කරන අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව එම පරිශ්‍රයේම ස්ථානගත කරන ලදී.

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
	පෙදෙස, කොළඹ 07 ලිපිනයෙහි පිහිටි වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ල රු.950,000 ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 නොවැම්බර් 09 දින ලැබී තිබුණි. නමුත් එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු.350,000 ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් දක්වා තව දුරටත් එම ගොඩනැගිල්ල වෙනුවෙන් එකතුව රු.16,800,000ක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණි.	මේ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම හා ක්‍රියාමාර්ග අනුව යමින් කාලෝචිත අවශ්‍යතාවයන් සේ සලකා 2022 වසර තුළ ශිෂ්‍ය කටයුතු සහ සුභසාධන අංශය හා පර්යේෂණ සහ සංවර්ධන අංශය නමින් නව අංශ 02 ක් ආරම්භ කළ අතර ආයතනය තුළ දැඩිව පවතින සීමිත ඉඩ කඩ තත්ත්වය හමුවේ අදාල නව අංශයන් දෙකද කුලී පදනම මත ලබාගත් නව ගොඩනැගිල්ල තුළ ස්ථාපනය කරන ලදී. එමෙන්ම කුලී පදනම මත ලබාගත් වර්ග අඩි 3337 කින් යුත් 94/10, ආනන්ද රාජකරුණා මාවතේ කොළඹ 08 පිහිටි ගොඩනැගිල්ලට අදාල කුලී ගිවිසුම අහෝසි කර එහි පිහිටි අංශ කුලී පදනම මත ලබාගත් 24/A, වෝඩ් පෙදෙස, කොළඹ 07 නව ගොඩනැගිල්ලට ගෙන ඒමට නොහැකි වූ හේතු 2023.01.26 දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1094 වන රැස්වීමට වාර්තා කළ අතර එහි දී නිර්දේශ වූයේ අදාල හේතු පැහැදිලි කරමින් රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ඉදිරිපත් කිරීමයි. ඒ සඳහා අදාල ලිපිය 2023.03.14 දින රේඛීය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. නමුත් ඒ සම්බන්ධයෙන් සාධනීය පිළිතුරක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් නොලැබීම නිසා නැවත 2023.10.19 දින පැවැති 1112 වන කොමිෂන් සභා වාරයේදී ගත් තීරණයක් අනුව කුලී පදනම මත ලබාගත් 94/10, ආනන්ද රාජකරුණා මාවතේ කොළඹ 08 ගොඩනැගිල්ල පිළිබඳව නැවත සලකා බලා අනුමැතිය ලබාදෙන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත 2024.01.03 දින ලිපියක් යොමු කර ඇත. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2024.01.30 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවන ලද ලිපියට අනුව කොළඹ 08, ආනන්ද රාජකරුණා මාවත පිහිටි ගොඩනැගිල්ල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය අසලින් කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිල්ල වෙත ගෙන ඒමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලෙස දන්වා ඇත. ඒ අනුව නැවතත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පැරණි කුලියට ගත් ගොඩනැගිල්ලේ පිහිටුවා තිබූ අංශ 03 නව ගොඩනැගිල්ලට ගෙන ඒමේ ඇති හැකියාව පිළිබඳව සොයා බැලූ අතර ඒ සඳහා සාධනීය

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
		හැකියාවක් නොමැති වූ බැවින් පැරණි මිලට ගත් ගොඩනැගිල්ලේ ගිවිසුම ද පවත්වා ගෙන යාමට අනුමැතිය ලබා දෙන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කිහිපවරක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් 2024.03.18 දිනැති ලිපියෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. කෙසේ නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2024.08.27 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත්තේ ගොඩනැගිලි දෙකම කුලියට ගැනීමට අවස්ථාවක් නොමැති බවයි. කොමිෂන් සභාවේ නිර්දේශ මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතුව පවතින ඉඩකඩ උපයෝජනය සම්බන්ධව ශක්‍යතා අධ්‍යනයක් සිදුකර එහි නිර්දේශය ද ලබා ගන්නා ලදී. කෙසේ වෙතත් ආයතනය සතුව පවතින උග්‍ර සීමිත ඉඩකඩ ගැටළුව හමුවේ තවදුරටත් කුලී පදනම මත පරිශ්‍රයක් ලබා ගැනීම අත්‍යවශ්‍යම වන අතර ඉහත දැක්වූ පරිදි ජාතික අයවැය අධ්‍යක්ෂ ජෙනරාල් අනුමැතිය මත ගොඩනැගිලි දෙකක්ම කුලී පදනම මත පවත්වා ගැනීමට ඇති බාධාවත් නිසා කොමිෂන් සභාව විසින් නො.24/A, පරිශ්‍රයට අදාල කුලී ගිවිසුම තවදුරටත් දීර්ඝ නොකිරීමට අංක 1134 දරණ 2024.11.07 දිනැති කොමිෂන් සභා වාරයේ දී තීරණය කරන ලදී. තවදුරටත් කුලී පදනම මත ලබාගත් පරිශ්‍රයෙහි ඇති අංශ සියල්ලම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා ඒ ආශ්‍රිතව කුලී පදනම මත ලබා ගන්නා පරිශ්‍රයක ස්ථානගත කිරීමට හැකි වන අයුරින් සුදුසු පරිශ්‍රයක් සෙවීමේ කටයුතු කිරීමටද කොමිෂන් සභාව විසින් 2024.12.18 දින රැස්වූ 1137 වන රැස්වීම් වාරයේදී තීරණය කර ඇත. අදාල ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර ඒ කටයුතු අවසන් වූ වහාම කුලී පදනම මත ලබාගත් පරිශ්‍රයන් දෙකම සතුව පවතින ගිවිසුම් අවසන් කිරීමට නියමිතය.

Status of the Complaints Received to the Portal – Centre for Gender Equity/ Equality – University Grants Commission

Report Date: 17th July 2025

Year	Total Number of Complaints	Initial	Action Taken by Director/CGEE	Processing	Progress Received from the University	Closed Complaints			Anonymous Complaints
						Closed	No Information	Out dated / Old records	
2020	119	0	0	17	48	44	0	10	0
2021	17	0	0	11	2	2	0	0	2

Year	Total Complaints	New	Action taken by Director/CGEE	Initial	Processing	Anonymous Complaint - Processing	Closed Complaints	Other Complaints - Closed		
								Anonymous Complaint	Out dated / Old Records	No Information
2022	71	0	11	0	8	5	35	8	2	2
2023	75	0	13	0	11	4	32	5	9	1
2024	83	0	21	9	12	0	27	11	1	2

Note :

This report is based on the prevailing data recorded in the system.

Bamka
Complaint Portal Developer
[Programmer cum System Analyst]
2025/07/17

ද්වාරයට ලැබුණු පැමිණිලිවල තත්ත්වය - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය/සාධාරණත්වය සඳහා වන මධ්‍යස්ථානය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

වාර්තා දිනය: 17.07.2025

වර්ෂය	මුළු පැමිණිලි සංඛ්‍යාව	මූලික සැකසීම	CGEE අධ්‍යක්ෂ විසින් ගත් ක්‍රියාමාර්ග	ක්‍රියාත්මක වෙමින් පවති	විශ්වවිද්‍යාල විසින් ලැබුනු ප්‍රගතිය පැමිණිලි	අවසන් කරන ලද පැමිණිලි			නිර්නාමික පැමිණිලි
						අවසන්	දත්ත නොමැති වාර්තා	පැරණි දිනැති වාර්තා	
2020	119	0	0	17	48	44	0	10	0
2021	17	0	0	11	2	2	0	0	2

වර්ෂය	මුළු පැමිණිලි සංඛ්‍යාව	නව පැමිණිලි	CGEE අධ්‍යක්ෂ විසින් ගත් ක්‍රියාමාර්ග	මූලික සැකසීම	ක්‍රියාත්මක වෙමින් පවති	නිර්නාමික පැමිණිලි - ක්‍රියාත්මක වෙමින් පවති	අවසන් කරන ලදී	අවසන් කරන ලද පැමිණිලි		
								නිර්නාමික පැමිණිලි	පැරණි දිනැති වාර්තා	තොරතුරු නොමැත
2022	71	0	11	0	8	5	35	8	2	2
2023	75	0	13	0	11	4	32	5	9	1
2024	83	0	21	9	12	0	27	11	1	2

සටහන: මෙම වාර්තාව පද්ධතියේ සටහන් කර ඇති පවතින දත්ත මත පදනම් වේ

ඇමුණුම් අංකය 02

674

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය
எனது இலக்கம்
My Number } UGC/CGEE/SAFETY-APP

තැපැල් පෙට්ටිය
அஞ்சல் பெட்டி
Post Office Box } 1406

මගේ අංකය
உமது இலக்கம்
Your Number }

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
20, வார்ட் இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.

06th June 2022

Chairman
Information & Communication Technology Agency of Sri Lanka

Dear Mr. Jayantha De Silva,

Payment of Support and Maintenance Fee to ICTA on "Emergency Safety Mobile Application" of the UGC: - Year 3

This has reference to the letter sent to you by the Chairman, UGC dated 17.02.2022 and further reference to your reply dated 24.05.2022.

The pilot run was taken place at Uva Wellassa University of Sri Lanka (UWU) from September 2018 to December 2018 which is reported to be unsuccessful. However, as per the records available ICTA officials have agreed to work on the additional features and to make the final version of the Application be available by October 2019 and to extend this Application to other 14 universities existed at that time. As such, first and second support and maintenance payments appear to be made based on the referred discussion.

At the point of receipt of the request for 3rd year support and maintenance fee, the Centre for Gender Equity/Equality (CGEE) with the assistance of IT staff/ UGC found that the Emergency Safety Mobile Application was not functioning and the developments agreed were not attended even though the UGC makes an annual support and maintenance fee to ICTA. UGC/IT staff could not find any student/ staff user credentials by the access given. After installation of the mobile application, even up–to-date the UWU is not available at the drop down list and registration is not possible as a student/ staff member (kindly refer the Annexure 1).

Prior and subsequent to the migration, the said mobile application and the backend module did not function. In such circumstance, UGC has no intention of switching the DNS to the said migrated environment. As such, I hereby kindly request you to further investigate on this as the UGC has already made two installments of support and maintenance fee for maintaining a product which appears to be erroneous/ incomplete.

Thank you

Senior Professor Chandana P. Udawatte
Vice Chairman
for Chairman

2022.06.06

සභාපති
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

මහත්මයාණෙනි

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හදිසි ආරක්ෂණ ජංගම යෙදුම" සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වෙත සහාය සහ නඩත්තු ගාස්තු ගෙවීම: - 3 වන වසර

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් 2022.02.17 දින ඔබට එවන ලද ලිපියට සහ 2022.05.24 දිනැති ඔබගේ පිළිතුරට අදාළවේ.

ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ (UWU) නියමු ක්‍රියාත්මක කිරීම 2018 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් දක්වා සිදු වූ අතර එය අසාර්ථක බව වාර්තා විය. කෙසේ වෙතත්, පවතින වාර්තා අනුව ICTA නිලධාරීන් අතිරේක අංග පිළිබඳව කටයුතු කිරීමට සහ යෙදුමේ අවසන් අනුවාදය 2019 ඔක්තෝබර් වන විට ලබා දීමට සහ එම අවස්ථාවේ පැවති අනෙකුත් විශ්වවිද්‍යාල 14 වෙත මෙම යෙදුම ව්‍යාප්ත කිරීමට එකඟ වී ඇත. ඒ අනුව, පළමු සහ දෙවන සහාය සහ නඩත්තු ගෙවීම් උක්ත සාකච්ඡාව මත පදනම්ව සිදු කර ඇති බව පෙනී යයි.

3 වන වසර සඳහා වන සහාය සහ නඩත්තු ගාස්තු ඉල්ලීම ලැබුණු අවස්ථාවේදී, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය/ සාධාරණත්වය සඳහා වන මධ්‍යස්ථානය (CGEE) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට (ICTA) වාර්ෂික සහාය සහ නඩත්තු ගාස්තුවක් ගෙවුවද, හදිසි ආරක්ෂණ ජංගම යෙදුම් ක්‍රියාත්මක නොවන බවත්, එකඟ වූ සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කර නොතිබූ බවත් නිරීක්ෂණය කරන ලදි. ලබා දී ඇති ප්‍රවේශය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයට කිසිදු ශිෂ්‍ය, කාර්ය මණ්ඩල පරිශීලක අක්තපත්‍ර (user credentials) සොයා ගැනීමට නොහැකි විය. ජංගම යෙදුම ස්ථාපනය කිරීමෙන් පසුව, අද වන තෙක් ද උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය (UWU) ලැයිස්තුවේ නොමැති අතර ශිෂ්‍යයෙකු/ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි වීම කළ නොහැක (කරුණාකර ඇමුණුම 1 බලන්න).

ස්ථාපනයට පෙර සහ පසු, ජංගම යෙදුම සහ පසු-අන්ත මොඩියුලය (backend module) ක්‍රියාත්මක නොවීය. එවැනි තත්ත්වයක් යටතේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සඳහන් කළ ස්ථාපිත පරිසරයට DNS ප්‍රතිස්ථාපනය කිරීමට කිසිදු අදහසක් නොමැත.

එබැවින්, දෝෂ සහිත අසම්පූර්ණ නිෂ්පාදනයක් නඩත්තු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) දැනටමත් සහාය සහ නඩත්තු ගාස්තු වශයෙන් වාරික දෙකක් ගෙවා ඇති හෙයින්, මේ පිළිබඳව තවදුරටත් විමර්ශනය කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්දන පී. උඩවත්ත
උප සභාපති

26. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024

2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

			ප්‍රතිප්‍රකාෂිත
දෙසැම්බර් 31 වන දින වන විට	සටහන් අංකය	2024 රු.	2023 රු
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන වත්කම්	06	199,543,426	413,541,835
ලැබිය යුතු පොලී ආදායම	07	2,104,800,804	1,670,293,562
ලැබිය යුතු දායක මුදල්	08	276,411,232	229,665,151
ලැබිය යුතු ණය වාරික	09	61,776,392	47,506,318
ආයෝජන	13	6,200,000,000	6,500,000,000
ලැබිය යුතු අර්ථසාධක ණය	14	2,074,923,779	1,564,525,821
අනෙකුත් අත්තිකාරම් සහ පෙරගෙවුම්	10	363,838	354,613
තොග		55,347	135,051
මුළු ජංගම වත්කම්		**10,917,874,818**	**10,426,022,350**
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු පොලී ආදායම	07	6,413,023,561	2,532,803,014
දේපළ, පිරියත සහ උපකරණ	11	3,181,326	4,292,658
අස්පෘශ්‍ය වත්කම්	12	229,600	287,000
ආයෝජන	13	65,757,841,185	58,223,949,786
ණය	14	12,178,160,196	11,625,411,903
ජංගම නොවන මුළු වත්කම්		84,352,435,869	72,386,744,360
මුළු වත්කම්		**95,270,310,687**	**82,812,766,710**
වගකීම්			
ජංගම වගකීම්			
මුදල් හා මුදල් සමාන දෑ	06	179,306,237	236,438,055
ගෙවිය යුතු අනෙකුත්	15	2,647,149	2,589,885
ගෙවිය යුතු ජීවන වියදම් දීමනා		43,182,641	43,182,641
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ	16	62,146,404	59,021,247
ගෙවිය යුතු බදු	17	1,394,135,773	1,121,364,765
මුළු ජංගම වගකීම්		1,681,418,204	1,462,596,594
මුළු ශුද්ධ වත්කම්		**93,588,892,483**	**81,350,170,116**

2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 වන දින වන විට	සටහන් අංකය	2024 රු.	ප්‍රතිප්‍රකාශිත 2023 රු
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
සාමාජික ගිණුම් ශේෂය - ක්‍රියාකාරී	18	93,204,603,208	80,971,985,050
සාමාජික ගිණුම් ශේෂය - අක්‍රීය	19	38,060,891	38,091,457
අක්‍රිය ගිණුම් සඳහා වෙන් කිරීම්		8,000,000	8,000,000
ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත		6,997,078	6,997,078
ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය		331,231,306	325,096,532
මුළු ශුද්ධ වත්කම්		**93,588,892,483**	**81,350,170,116**

පිටු අංක 06 සිට 09 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 10 සිට 25 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතුය. 2025 පෙබරවාරි 28 වන දින පැවති විශේෂ සභා වාරයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

උභයකුල රණවීර
ගණකාධිකාරී

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න
සභාපති

මහාචාර්ය හේමමාලි ගුණතිලක
කොමිෂන් සභා සාමාජික

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	2024 රු.	ප්‍රතිප්‍රකාශිත 2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහය		
බදු සහ වියදම්වලට පසුව ශුද්ධ ලාභය	8,914,772,572	8,499,969,385
ගැලපීම්		
මුදල් නොවන ගනුදෙනු		
එකතු කළ/(අඩු කළ): භාණ්ඩාගාර බැදුම්කර අව මිල/අධි මිල	(90,263,199)	(48,097,749)
ක්ෂයවීම්	1,111,332	1,115,199
කපා හැරීම්	57,400	235,311
ආදායම් බදු	1,437,445,250	1,377,045,912
මෙහෙයුම් අතිරික්තය	10,263,123,355	9,830,268,058
තොග (වැඩිවීම)/ අඩුවීම	79,704	303,224
ලැබිය යුතු ආයෝජන ආදායමේ (වැඩි වීම)/ අඩුවීම	(4,314,727,790)	1,171,066,058
අත්තිකාරම් සහ පෙරගෙවුම් (වැඩි වීම)/ අඩුවීම	(9,225)	(85,900)
ලැබිය යුතු ණය වාරික (වැඩි වීම)/ අඩුවීම	(14,270,074)	(12,281,357)
විවිධ ණයහිමියන්ගේ වැඩිවීම/ (අඩුවීම)	57,264	(898,356)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද මුදල්	5,934,253,233	10,988,371,727
අඩු කළ: ගෙවන ලද ආදායම් බදු	(1,164,674,242)	(1,260,033,982)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**4,769,578,991**	**9,728,337,745**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ / (භාවිතා කරන ලද)		
දේපළ පිරියත සහ උපකරණ මිලට ගැනීම	-	(287,000)
ස්ථාවර තැන්පතු කල්පිරීම්	-	10,720,000,000
ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම	(4,250,000,000)	(17,660,000,000)
භාණ්ඩාගාර බැදුම්කරවල කල්පිරීම	-	908,317,437
ණයකර කල්පිරිම	6,500,000,000	1,000,000,000
ණයකර මිලදී ගැනීම	(3,200,000,000)	(2,400,000,000)
භාණ්ඩාගාර බැදුම්කර මිලදී ගැනීම	(6,193,628,200)	(1,424,455,387)
භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම	-	(511,033,600)
භාණ්ඩාගාර බිල්පත් කල් පිරීම	-	1,132,690,800
අර්ථසාධක ණය ලබා දීම් හා පියවීම්	(1,063,146,252)	(2,551,052,613)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(8,206,774,452)**	**(10,785,820,363)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්		
සාමාජික මුදල් ලැබීම්	7,181,831,950	6,230,919,803
සාමාජික මුදල් ගෙවීම්	(3,901,503,080)	(5,194,881,075)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,280,328,870**	**1,036,038,728**
මුදල් සහ මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	**(156,866,590)**	**(21,443,889)**
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන වත්කම්	177,103,780	198,547,669
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන වත්කම්	**20,237,189**	**177,103,780**
මුදල් සහ මුදල් සමාන දෑ: **මුදල් සහ බැංකු ශේෂ (සටහන් අංකය: 06)**	**20,237,189**	**177,103,780**

2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(රු.)

	සාමාජික ශේෂය ක්‍රියාකාරී	සාමාජික ශේෂය අක්‍රීය	අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන් කිරීම්	හිමිකම් නොගත් ප්‍රතිලාභ සංචිතය	රඳවා ගත් ලාභය	මුළු ශුද්ධ වත්කම් කොටස්
2023 ජනවාරි 1 වන දිනට ශේෂය	71,057,499,025	38,094,733	8,000,000	6,997,078	694,671,959	71,805,262,795
වර්ෂයට අදාළ සාමාජික මුදල්	6,281,038,709	-	-	-	-	6,281,038,709
සාමාජික පොළී	8,919,171,535	-	-	-	(8,919,171,535)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	189,426	-	(189,426)	-
සාමාජික මුදල් නැවත ගෙවීම්	(5,203,169,417)	-	-	-	-	(5,203,169,417)
සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම්	(32,931,356)	-	-	-	-	(32,931,356)
ගැළපිලි	(49,623,447)	(3,276)	(189,426)	-	49,816,149	-
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ආදායම (ප්‍රතිප්‍රකාශිත)	-	-	-	-	8,499,969,385	8,499,969,385
2024 ජනවාරි 1 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාෂිත)	**80,971,985,050**	**38,091,457**	**8,000,000**	**6,997,078**	**325,096,532**	**81,350,170,116**
වර්ෂයට අදාළ සාමාජික මුදල්	7,240,610,965	-	-	-	-	7,240,610,965
සාමාජික පොළී	8,980,454,616	-	-	-	(8,980,454,616)	-
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී	-	-	2,036,795	-	(2,036,795)	-
සාමාජික මුදල් නැවත ගෙවීම්	(3,904,628,237)	-	-	-	-	(3,904,628,237)
සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම්	(12,032,934)	-	-	-	-	(12,032,934)
ගැළපිලි	(71,786,251)	(30,566)	(2,036,795)	-	73,853,612	-
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ආදායම	-	-	-	-	8,914,772,572	8,914,772,572
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**93,204,603,208**	**38,060,891**	**8,000,000**	**6,997,078**	**331,231,306**	**93,588,892,483**

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	2024 රු.	ප්‍රතිප්‍රකාශිත 2023 රු.
ආදායම			
ආයෝජන ආදායම	20	10,357,729,268	9,884,139,977
අඩු කළා :- මෙහෙයුම් වියදම්	21	(5,511,447)	(7,124,680)
බදු වලට පෙර ශුද්ධ ආදායම		**10,352,217,822**	**9,877,015,297**
අඩු කළා :- ආදායම් බද්ද	17	(1,437,445,250)	(1,377,045,912)
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ආදායම		**8,914,772,572**	**8,499,969,385**
ආදායමට ගැලපීම්		73,853,612	49,816,149
පසුගිය වසරේ රඳවා ගත් ලාභය		325,096,532	694,671,959
බෙදා හැරීම සඳහා ශුද්ධ ලාභය		**9,313,722,716**	**9,244,457,493**
සාමාජික ගිණුම් සඳහා පොලිය		(8,980,454,616)	(8,919,171,535)
අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළිය		(2,036,795)	(189,426)
ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය		**331,231,306**	**325,096,532**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. HED/A/UPF/FA/2024

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 06 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ ෆොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2. ලේකම් - මූල්,ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/A/UPF/FA/2024 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 මැයි 06 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව		විස්තරය
විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය	(i)	දායක ගිණුම් අවසන් කර මාස 03 ක් තුළ අර්ථසාධක අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු නමුත් දායකයන් 50 දෙනෙකු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයන්හි ප්‍රමාදයන් හේතුවෙන් දින 37 සිට දින 267 දක්වා ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රමාදයන් හෙතුවෙන් දින 21 සිට දින 144 දක්වා ද දායක මුදල් ගෙවීම ප්‍රමාද වී තිබුණි. එකී ප්‍රමාදයන් හේතුවෙන් උක්ත දායක ගිණුම් සඳහා රු.1,509,350ක අතිරේක පොළියක් ගෙවීමට සිදු වී තිබුණි.
	(ii)	දායකයාගේ වරදක් හේතුවෙන් දායක ගිණුමේ ශේෂය ගෙවීම මාස 03කට වඩා ප්‍රමාද වුවහොත් අතිරේක පොළියක් නොගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව දායකයන් 11 දෙනෙකුගේ ශේෂය වෙනුවෙන් රු.893,916 ක අතිරේක පොළියක් ගෙවා තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
1. මූල්‍ය ප්‍රකාශන 1.1 මතය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නනා වූ මතය වේ. 1.2 මතය සඳහා පදනම 1.3 මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම	අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නනා වූ මතය වේ.	අදාළ නොවේ (1.1 සිට 1.4)
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව		අදාළ නොවේ (2.1 සිට 2.1.3)

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ		
2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ		
2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.		

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
3. මෙහෙයුම් සමාලෝචනය **3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම** **<u>නීතිරීති/ විධානයට යොමුව</u>** **විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය**	i) දායක ගිණුම් අවසන් කර මාස 03 ක් තුළ අර්ථසාධක අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු නමුත් 50 දෙනෙකු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයන්හි ප්‍රමාදයන් හේතුවෙන් දින 37 සිට 267 දක්වාද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රමාදයන් හේතුවෙන් දින 21 සිට දින 144 දක්වාද දායක මුදල් ගෙවීම ප්‍රමාද වී තිබුණි. එකී ප්‍රමාදයන් හේතුවෙන් උක්ත දායක ගිණුම් සඳහා රු.1,509,350ක අතිරේක පොලියක් ගෙවීමට සිදු වී තිබුණි.	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ගිණුම් වල බැරට ඇති ශේෂය මත පොලී ගණනය කිරීම හා ගෙවීම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය අනුව කර ඇත. **අ)** අර්ථසාධක අරමුදලේ දායකයකුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුගේ ගිණුම අවසන් කරනු ලැබූ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත ඔහුට නොගෙවා ඇති අවස්ථාවක, පනතේ විධිවිධාන කුමක් වුව ද එමෙන් ම වෙනයම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව ද ඔහුගේ බැරට ඇති මුදලට 92(3) වන වගන්තියේ කාර්යය සඳහා නිශ්චය කරනු ලැබූ අනුපාතය අනුව මිශ්‍ර පොලිය, ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුට ගෙවනු ලබන මාසයට ඉහතින් වූ මාසයේ අන්තිම දිනය දක්වා, එකතු වන්නේය. එසේ වුවද ඒ මුදල ඒ දායකයාට ගෙවීම දායකයාගේ වරදක් නිසා ප්‍රමාද වූ අවස්ථාවල එකී පොලිය නොගෙවිය යුතුය. ඒ අනුව විශ්වවිද්‍යාල පනතේ 95වගන්තිය මඟින් වැඩිදුරටත් පැහැදිලි කරනුයේ, දායකයෙකු සේවය අවසන් කල දින සිට මාස 03ක් ඇතුලත ඔහුගේ බැරට ඇති මුදල මිශ්‍ර **පොළිය සමඟ ගෙවිය යුතු බව නොව අරමුදල නිදහස් කිරීමේදී මිශ්‍ර පොළිය ගණනය කළ යුතු ආකාරය පිළිබඳවයි .** **ආ)** ඒ අනුව ; දායකයෙකු සේවය අවසන් කර මාස 03ක් ඇතුළත ඔහුගේ අර්ථසාධක අරමුදල් ශේෂය නිදහස් කරන්නේ නම් ඔහු සේවය අවසන් කළ දින දක්වා පොළිය ගෙවිය යුතු වන අතර එසේ නොවන්නේ නම් ඔහුගේ ශේෂය අර්ථසාධක අරමුදල් නිදහස් කරන මාසයට පෙර මාසයේ අවසන් දිනය දක්වා පොළිය ගෙවිය යුතු වේ . කෙසේ වෙතත් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම දායකයාගේ වරදක් නිසා ප්‍රමාද වූ අවස්ථා වල එකී පොළිය නොගෙවනු ලබයි.

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
		ඔබ විසින් පෙන්වා දී ඇති ප්‍රමාදයන් සඳහා පහත හේතු බලපා ඇත. 1. සාමාජිකයන් විසින් සහ විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් නිවැරදිව සම්පූර්ණ කරන ලද අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ අයදුම්පත් අර්ථසාධක අරමුදල් අංශයට ලැබීමෙන් පසු ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කරන අතර, කෙටුම්පත් වාර්ථාවේ දක්වා ඇති අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ අයදුම්පත් 50 ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී ඇත්තේ, අර්ථසාධක අරමුදලේ අවසාන ගිණුම් පිළියෙල කර, ඉදිරි වර්ෂය සඳහා පොළී අනුපාත නිශ්චය කරන කාලය අතරතුර(2023 දෙසැම්බර් සිට 2024 මාර්තු දක්වා කාලය තුල) වන බව හඳුනාගෙන ඇත. මෙය වාර්ෂිකව සිදුවන ක්‍රියාවලියක් වන අතර, එම කාලය තුල දී අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමක් සිදු නොකරන අතර එය සාමාජිකයන්ගේ වරදක් නොවන බැවින්, එම කාලය සඳහා ද සාමාජිකයන් වගකීමකට යටත් නොකර පොළී ගණනය කර ගෙවීමට අර්ථසාධක අරමුදල කටයුතු කරනු ලබයි. 2. 2024 මැයි 02 දින සිට 2024 ජුලි 16 වන දින දක්වා විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක වැඩ වර්ජනය පැවැත් වූ නිසා 2024 මැයි මාසයේ ගෙවීමට පිළියෙල කළ වවුවර්පත් නැවත 2024 ජුලි 31 දින තෙක් පොළී මුදල් සමඟ ගෙවීමට සිදුවිය. ඒ අනුව විගණන වාර්තාවේ පෙන්වා දී ඇති දායකයින්

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
		සඳහා 2024වර්ෂයේ පොළී අනුපාත අනුමත වූ පසු අදාළ පොළිය ගණනය කර සාමාජිකයන් වෙත ගෙවනු ලැබූ රු.1,509,350 ක පොළී ප්‍රමාණය විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය සහ කොමිෂන් සභා වක්‍රලේඛ 03/2022 ට අනුකූල වන අතර එය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රමාදයක් නිසා සිදු වුවක් නොවේ.
	ii) දායකයාගේ වරදක් හේතුවෙන් දායක ගිණුමේ ශේෂය ගෙවීම මාස 3කට වැඩ ප්‍රමාද වුවහොත් අතිරේක පොලියක් නොගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව දායකයන් 11 දෙනෙකුගේ ශේෂය වෙනුවෙන් රු.893,916ක අතිරේක පොළියක් ගෙවා තිබුණි.	විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ අයදුම්පත්‍ර නිසි පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අර්ථසාධක අරමුදල් අංශය වෙත එවීම සඳහා, සාමාජිකයකු සේවයෙන් ඉවත් වන හෝ විශ්‍රාම ලබන අවස්ථාවේදී, ඔහුගේ අර්ථසාධක අයදුම්පත ඒ ඒ විශ්වවිද්‍යාලය විසින් අප වෙත ඉදිරිපත් කරනු ලැබේ. එහිදී විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ අයදුම්පත් නියමිත කාලය තුළ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවකදී එම ප්‍රමාදය සිදුවී ඇත්තේ අදාළ සාමාජිකයාගෙන්ද නැතහොත් අදාළ විශ්ව විද්‍යාලයෙන් ද යන්න හඳුනා ගැනීමෙන් අනතුරුව අදාළ විශ්ව විද්‍යාලය හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් එම පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ. එහිදී අදාළ විශ්ව විද්‍යාල බලධාරීන් විසින් ගනු ලැබූ තීරණ අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අර්ථ සාධක අරමුදල් අංශය විසින් අදාළ සාමාජිකයන් වෙත ඔවුන්ගේ අර්ථ සාධක අරමුදල් නිදහස් කිරීමට අදාල කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව ආයතනයේ ප්‍රමාද වීම් සම්බන්ධයෙන් දායකයින් වගකීමට යටත් නොකරන ලද කෙටුම්පත් වාර්තාවේ දක්වා ඇති අවස්ථා 11සඳහා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගින් අර්ථසාධක

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
		අරමුදල් අයදුම්පත ගෙවීම සඳහා ඉදිරිපත් කිරීම දායකයාගේ වරදක් නිසා සිදු වී නැත. ඒ අනුව පනතේ 95 වගන්තියට අනුකූලව පමණක් දායකයාට හිමි පොලිය අර්ථසාධක අරමුදල මඟින් ගෙවා ඇත.

27. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2024 රු.	ප්‍රතිප්‍රකාශිත 2023 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	5	30,451,167	399,672,599
ලැබිය යුතු ආයෝජන ආදායම	6.1	756,412,428	625,124,713
ලැබිය යුතු දායකත්ව මුදල්	7	71,990,524	62,456,862
ආයෝජන	8.1	2,894,260,000	800,000,000
		3,753,114,119	1,887,254,174
ජංගම නොවන වත්කම්			
ආයෝජන	8.2	24,605,003,651	22,878,221,590
ලැබිය යුතු ආයෝජන ආදායම	6.2	2,680,474,000	1,030,262,466
		27,285,477,651	23,908,484,056
මුළු වත්කම්		31,038,591,769	25,795,738,230
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ ණයහිමියන්	9	1,128,279	935,496
සාමාජිකයින්ට ගෙවිය යුතු ගෙවීම්	10	40,146	51,738,774
විශ්වවිද්‍යාල/විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල වෙත ගෙවිය යුතු ගෙවීම්	11	7,266,692	747,157
ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව	12	29,705	29,705
ගෙවිය යුතු ආදායම් බදු	13	547,763,154	423,151,345
		556,227,976	476,602,477
මුළු ශුද්ධ වත්කම්		**30,482,363,794**	**25,319,135,753**
සාමාජික අරමුදල සහ සංචිත			
දායකයන්ගේ අරමුදල		28,742,162,510	23,874,391,478
විශ්‍රාමිකයින්ගේ අරමුදල		729,915,144	629,841,162
රඳවාගත් ඉපැයුම්		1,010,286,141	814,903,114
මුළු ශුද්ධ වත්කම්		**30,482,363,794**	**25,319,135,753**

පිටු අංක 05 සිට 07 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 07 සිට 19 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතුය. 2025 පෙබරවාරි 28 වන දින පැවති විශේෂ රැස්වීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.




උභයකුල රණවීර
ගණකාධිකාරී



ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න
සභාපති



මහාචාර්ය හේමමාලි ගුණතිලක
කොමිෂන් සභා සාමාජික

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		ප්‍රතිප්‍රකාශිත
	2024	2023
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබෙන මුදල් ප්‍රවාහය		
බදු සහ වියදම් වලින් පසු ශුද්ධ ආදායම	**3,470,453,982**	**3,182,236,075**
මුදල් නොවන කටයුතු		
භාණ්ඩාගාර බැඳුම්කරවල වට්ටම්/(වාරික)	(99,073,951)	(76,171,041)
විශ්‍රාමිකයන්ගේ අරමුදල් ගැලපීම	38,933,605	30,905,042
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන	555,469,725	511,411,896
	3,965,783,361	3,648,381,972
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
ලැබිය යුතු ආයෝජන ආදායම (වැඩි වීම)/අඩු වීම	(1,781,499,249)	327,859,514
විවිධ ණයහිමියන්ගේ වැඩිවීම/(අඩුවීම)	192,783	(41,137)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්	**2,184,476,895**	**3,976,200,349**
අඩු කළා: ආදායම් බදු ගෙවීම්	(430,857,917)	(426,411,495)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,753,618,979**	**3,549,788,854**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු කල්පිරීම්	-	3,830,000,000
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(1,100,000,000)	(7,950,000,000)
ණයකර කල්පිරීම්	800,000,000	-
ණයකර මිලදී ගැනීම්	(1,100,000,000)	(550,000,000)
භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම්	-	566,953,511
භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම්	(2,077,708,110)	(997,647,050)
භාණ්ඩාගාර බිල්පත් කල් පිරීම්	-	709,014,100
භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම්	(244,260,000)	(185,830,400)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(3,721,968,110)**	**(4,577,509,840)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්		
දායක මුදල් ලැබීම්	2,117,670,706	1,885,136,436
දායක මුදල් ආපසු ගෙවීම්	(318,208,739)	(328,895,205)
විශ්‍රාම වැටුප් ගෙවීම්	(200,334,268)	(165,737,405)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**1,599,127,698**	**1,390,503,825**
මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම	**(369,221,433)**	**362,782,840**
කාල සීමාව ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	399,672,599	36,889,759
කාල සීමාව අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	**30,451,166**	**399,672,599**
බැංකු ශේෂය		
ලංකා බැංකුව	19,843	1,798,579
මහජන බැංකුව	2,000,000	2,000,000
එකතු කළා - **අරමුදල් කළමනාකරණ ගිණුම්**		
රාත්‍රී කාලීන තැන්පතු	23,000,000	35,000,000
අරමුදල් කළමනාකරණ ගිණුම් ලංකා බැංකුව	2,955,092	8,313,240
අරමුදල් කළමනාකරණ ගිණුම් මහජන බැංකුව	2,476,233	72,560,780
රාත්‍රී කාලීන තත්‍ය කාලීන දළ පියවීම් (RTGS)	-	280,000,000
	30,451,166	**399,672,599**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

	දායක අරමුදල	විශ්‍රාමික අරමුදල	ප්‍රතිස්ථාපිත රඳවා ගත් ලාභය	එකතුව
	රු.	රු.	රු.	රු.
2023 ජනවාරි 1 වන දිනට ශේෂය	19,559,253,506	464,256,596	724,712,937	20,748,223,039
2023 වසර සඳහා අතිරික්තය	-	-	3,181,730,931	3,181,730,931
සාමාජික පොළී රඳවා ගැනීම්	(8,697,612)	-	8,697,612	-
වැරදි දායක මුදල් නිවැරදි කිරීම	(1,505,891)	-	-	(1,505,891)
හිඟ/නොලැබූ දායක මුදල්	15,265,919	-	-	15,265,919
වත්මන් වර්ෂයේ ආදායමෙන් මාරු කිරීම	-	30,905,042	-	30,905,042
වත්මන් වර්ෂයේ දායකත්වය	1,870,901,255	-	-	1,870,901,255
සම්පූර්ණ දායක මුදල් ආපසු ගෙවීම්	(332,870,397)	-	-	(332,870,397)
විශ්‍රාමිකයින්ගේ අරමුදලට මාරු කළ	(233,494,266)	233,494,266	-	-
අර්ථ සාධක අරමුදලට මාරු කිරීම්	(27,776,739)	-	-	(27,776,739)
2023 වසර තුළ විශ්‍රාම වැටුප් ගෙවීම	-	(165,737,405)	-	(165,737,405)
දායකයාගේ අරමුදල/විශ්‍රාමිකයන්ගේ අරමුදල් පොලිය	3,033,315,703	66,922,664	(3,100,238,367)	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	23,874,391,478	629,841,163	814,903,113	25,319,135,754
2024 වසර සඳහා අතිරික්තය	-	-	3,470,453,982	3,470,453,982
සාමාජික පොළී රඳවා ගැනීම්	(11,142,245)	-	11,142,245	-
වැරදි දායක මුදල් නිවැරදි කිරීම	(193,428)	-	-	(193,428)
හිඟ/නොලැබූ දායක මුදල්	2,738,339	-	-	2,738,339
වත්මන් වර්ෂයේ ආදායමෙන් මාරු කිරීම	-	38,933,605	-	38,933,605
වත්මන් වසරේ දායකත්වය	2,124,659,457	-	-	2,124,659,457
එකවර මුදල් ආපසු ගෙවීම්	(242,348,144)	-	-	(242,348,144)
විශ්‍රාමිකයන්ගේ අරමුදලට මාරු කළ	(188,628,332)	188,628,332	-	-
විශ්වවිද්‍යාල විශ්‍රාමික අරමුදල් ගිණුමට මාරු කිරීම	(30,681,501)	-	-	(30,681,501)
2024 වසර තුළ විශ්‍රාම වැටුප් ගෙවීම	-	(200,334,268)	-	(200,334,268)
දායකයාගේ අරමුදල/විශ්‍රාමිකයන්ගේ අරමුදල් පොලී	3,213,366,887	72,846,312	(3,286,213,199)	-
	4,867,771,032	100,073,981	195,383,028	5,163,228,040
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,742,162,510**	**729,915,144**	**1,010,286,141**	**30,482,363,795**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2024 රු.	ප්‍රතිප්‍රකාශිත 2023 රු.
ආදායම			
ආයෝජන ආදායම	14	4,066,712,654	3,725,724,702
අඩු කළා: ආදායම් බදු වියදම		(555,469,725)	(511,411,896)
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ආදායම		**3,511,242,929**	**3,214,312,806**
අඩු කළා: **වියදම්**			
විශ්‍රාමික අරමුදල් ගැලපීම්	15	38,933,605	30,905,042
මෙහෙයුම් වියදම්	16	1,855,342	1,676,833
		40,788,946	**32,581,875**
වියදම් අඩු කළ පසු ශුද්ධ ආදායම		**3,470,453,982**	**3,181,730,931**
එකතු කළා: ආදායමට ගැලපීම්		11,142,245	8,697,612
ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය		814,903,114	724,712,937
බෙදිය හැකි ශුද්ධ ආදායම		**4,296,499,340**	**3,915,141,480**
අඩු කළා: සාමාජිකයන්ගේ පොලිය			
දායකයින්ගේ අරමුදල		3,213,366,887	3,033,315,703
විශ්‍රාමික අරමුදල		72,846,312	66,922,664
		3,286,213,199	**3,100,238,367**
ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය		**1,010,286,141**	**814,903,114**

ජාතික විගණන් කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } HED/A/PNF/FA/2024

ඔබේ අංකය / உமது இல. / Your Nd. }

දිනය / திகதி / Date } 2025 මැයි 06 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාමවැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ මොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්,ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } HED/A/PNF/FA/2024 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 06 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන්

සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
2022 පෙබරවාරි 07 දිනැති අංක 03/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	දායකයා විශ්‍රාම ගොස් මාස 3ක් තුල විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු බව දක්වා ඇතත්, විශ්වවිද්‍යාලය මගින් අයදුම්පත් යොමු කිරීමේදී ඇතිවන ප්‍රමාදය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගෙවීම් ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් දායකයින් 21 දෙනෙකු වෙනුවෙන් රු.2,186,386 ක අතිරේක පොලියක් ගෙවීමට සිදු වී තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
1. මූල්‍ය ප්‍රකාශන 1.1 මතය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. 1.2 මතය සඳහා පදනම 1.3මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම් 1.4මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම	අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. ------ ------	අදාල නොවේ (1.1 – 1.4)

විගණන නිරීක්ෂණය	නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව		අදාල නොවේ (2.1 – 2.1.3)
2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.	------	
2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.	------	
2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.	------	

විගණන නිරීක්ෂණය		නිරීක්ෂණ	කළමණාකරනය විසින් ගනු ලබන විගණන නිරීක්ෂණ හා අනෙකුත් පියවර
3. මෙහෙයුම් සමාලෝචනය 3.1 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම			
නීතිරීති / විධානයට යොමුව 2022 පෙබරවාරි 07 දිනැති අංක 03/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	විස්තරය දායකයා විශ්‍රාම ගොස් මාස 3ක් තුල විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවිය යුතු බව දක්වා ඇතත්, විශ්වවිද්‍යාලය මගින් අයදුම්පත් යොමු කිරීමේදී ඇති වන ප්‍රමාදය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගෙවීම් ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් දායකයින් 21 දෙනෙකු වෙනුවෙන් රු. 2,186,386 ක අතිරේක පොලියක් ගෙවීමට සිදු වී තිබුණි.	1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය අනුව දායකයකුගේ සේවය අවසන් කළ පසු මාස 03ක් ඇතුලත විශ්‍රාම වැටුප් අරමුදල් නිදහස් කර ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් නොවන අවස්ථා වලදී පොළිය ගණනය කළ යුතු ආකාරය පිළිබඳව පනතේ ඉහත වගන්තිය අනුව පැහැදිලි කර ඇත. ඒ අනුව විශ්‍රාම වැටුප් අරමුදල විසින් සේවය අවසන් කරන දායකයන් වෙත අමතර පොළී මුදලක් ගෙවා නැති අතර පොළී ගණනය කිරීම විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා එකඟ වේ. විගණන විමසුමෙහි සඳහන් කරන ලද දායකයන් 21 දෙනා වෙනුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් අංශයට ලැබුණු පසු මසකටත් අඩු කාලයකදී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අදාල දායකයා වෙත ගෙවා ඇත. ඒ අනුව විශ්‍රාම අරමුදල විසින් කිසිම විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමක් ප්‍රමාදවී ගෙවා නැත.	1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය අනුව දායකයකුගේ සේවය අවසන් කළ පසු මාස 03ක් ඇතුලත විශ්‍රාම වැටුප් අරමුදල් නිදහස් කර ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් නොවන අවස්ථා වලදී පොළිය ගණනය කළ යුතු ආකාරය පිළිබඳව පනතේ ඉහත වගන්තිය අනුව පැහැදිලි කර ඇත. ඒ අනුව විශ්‍රාම වැටුප් අරමුදල විසින් සේවය අවසන් කරන දායකයන් වෙත අමතර පොළී මුදලක් ගෙවා නැති අතර පොළී ගණනය කිරීම විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය හා එකඟ වේ. විගණන විමසුමෙහි සඳහන් කරන ලද දායකයන් 21 දෙනා වෙනුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් අංශයට ලැබුණු පසු මසකටත් අඩු කාලයකදී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අදාල දායකයා වෙත ගෙවා ඇත. ඒ අනුව විශ්‍රාම අරමුදල විසින් කිසිම විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමක් ප්‍රමාදවී ගෙවා නැත.

කිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව

2024

28. තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව 2024

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2017 අවශ්‍ය මාර්ගෝපදේශ හා මඟ පෙන්වීම් සපයනු ලබයි.

අයවැය ක්‍රියාවලිය සඳහා හඳුන්වාදෙන මධ්‍ය කාලීන ඉදිරි දැක්ම තුළින් වඩාත් උපායමාර්ගිකව රජයේ ප්‍රමුඛතාවලට ප්‍රතිචාර දැක්විය හැකි බව ද එහි සඳහන් වේ. ඒ අනුව, අයවැය ක්‍රියාවලිය මඟින් ඇස්තමේන්තුගත සම්පත් ලබා ගැනීම; මධ්‍ය කාලීන සැලසුම, සාර්ව මූල්‍ය රාමුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතා මාවත ඔස්සේ සම්බන්ධ කළ හැකි අතර මෙයින් අයවැය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සමඟ අයවැය ප්‍රතිපාදන යථා තත්ත්වයට පත් කිරීම සිදු කළ හැකිය.

මේ අතර, අයවැය සැකසීමේ පුළුල් ඉදිරිදැක්මට ඇතුළත් වන්නේ, 2015 දී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක ලැයිස්තුවට අදාළ, 2030 වන විට සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු ආකාරයයි.

තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇති අතර, එයින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වඩාත්ම අදාළ ඉලක්කය වන්නේ අංක 4 - ගුණාත්මක අධ්‍යාපනයයි. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තිරසාර සංවර්ධන ඉලක්ක අංක 4 ට අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 දක්වා දීර්ඝ කරන ලද 2019-2023 උපායමාර්ගික සැලැස්මේ හඳුනාගත් ඉලක්ක පෙළගස්වා ඇති අතර ප්‍රධාන අංශ පහක් යටතේ වෙනස්කම් සිදු කළ යුතු බවට ද හඳුනාගෙන ඇත;

- රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.
- 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.
- ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.
- ආරක්ෂිත, ස්ථාවර පද්ධති සහ අන්‍යෝන්‍ය ඵලදායී පාර්ශ්වකරුවන්ගේ සබඳතා තුළින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

ඒ අනුව, රටේ අපේක්ෂාවන් හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කරගත් ආර්ථිකයක් තුළ මානව අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත ආයතනික අරමුණු මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 01:** රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා වැඩි කිරීම.	1. 2024 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල බඳවාගැනීම් තුළ 15%ක සමුච්චිත වර්ධන වේගයක් (CGR) ලබා ගැනීම.	පවතින අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම 10,000 කින් වැඩි කිරීම. ශ්‍රම වෙළඳපොළේ ඉල්ලීම් මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම	- රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන් (පවත්නා සහ නව යන දෙකම) සඳහා උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රතිශතය වැඩි වීම.
		2. උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස දෙකකින් අඩු කිරීම.	උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ උසස් අධ්‍යාපන ආයතනවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය අඩු කිරීම.	- උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කිරීම සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර කාල පරතරය මාස 2ක් වැනි අඩු කාල පරාසයක් පවත්වා ගැනීම.
		3. දැනට පවතින අඩු ඉල්ලුමක් සහිත උපාධි (UG) පාඨමාලා, විභවය සහිත සිසුන් අතර ප්‍රවර්ධනය කිරීම.	උසස් අධ්‍යාපන ආයතනවල පුරප්පාඩු ගණන අඩු කිරීම.	- සෑම වසරකම අඩුම ඉල්ලුමක් සහිත යුනිකෝඩ් සඳහා ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩි කිරීම. - අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.
		4. ඉදිරි වසර 5 තුළ දැනට පවතින උපාධි අධ්‍යයන පාඨමාලා වල පුරප්පාඩු සංඛ්‍යාව 25% කින් අඩු කිරීම.		- අවම ඉල්ලුමක් ඇති පාඨමාලා ඇතුළුව විශ්වවිද්‍යාලවල පවතින අධ්‍යයන පාඨමාලාවල පුරප්පාඩු ප්‍රතිශතය අඩු කිරීම.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		5. 2024 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් සහිතව ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව 8% කින් වැඩි කිරීම.	අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට අදාළ විය හැකි නව දේවල් ඉගෙන ගැනීමට සහ හවුල්කාරිත්වයන් ගොඩනැගීම සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ සබඳතා ශක්තිමත් කිරීම.	- පවතින ඉල්ලුම සමඟ උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා විදේශීය සුදුසුකම් ලත් සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම. - ලොව පුරා සිටින හැකියාවන් සහිත අපේක්ෂකයින් අතර විදේශීය බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීමට ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. - පූර්ව ඉල්ලුමක් නොමැති එහෙත් විදේශීය අයදුම්පත් ලැබුණු උපාධි පාඨමාලා සංඛ්‍යාව.
			ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ අධ්‍යයන වැඩසටහන් විදේශ රටවල් තුළ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යයන පාඨමාලා සඳහා විදේශීය සුදුසුකම් ඇති සිසුන් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම.	
			විදේශීය බඳවා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම	
		6. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සුදුසුකම් ලත් සිසුන්ට පහසුකම් සැලසෙන විශේෂිත කර්මාන්ත ඉලක්ක කරගත් සහ තත්ත්ව නියාමනය කරන ලද බාහිර උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම.	බාහිර උපාධි සම්බන්ධයෙන් වූ තත්ත්ව ආරක්ෂණ අත්පොත පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලය ඇතුළු සියලුම විශ්වවිද්‍යාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	- රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන අය වෙනුවෙන් විශේෂයෙන් නිර්මාණය කරන ලද බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ ප්‍රතිශතය.
			UGC නියෝගවලට අනුකූලව සියලුම විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල බාහිර උපාධි වැඩසටහන් සහ ව්‍යාප්ති පාඨමාලාවල ප්‍රමිතීන් සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට එම ආයතන මෙහෙය වීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			බාහිර උපාධි ස්ථාවර කමිටුව හරහා UGC නියෝග සමඟ විවෘත සහ දුරස්ථ ඉගෙනීම් ක්‍රමවේදය හරහා සියලුම විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන බාහිර අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව සමාලෝචනය කිරීම.	
			බාහිර විභාග අංශ තුළ පාලන සහ කළමනාකරණ ක්‍රියා පටිපාටි අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට සියලුම විශ්වවිද්‍යාල මෙහෙය වීම.	
			කණ්ඩායම් වැඩ, රැස්වීම් සහ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන සිසුන් සඳහා, රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන සහ UGC පිළිගත් ආයතන හරහා ලබා දෙන UGC අනුමත උපාධි පාඨමාලා හරහා 2024 වන විට තවත් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.	අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 18ක් පීඨ ලෙස උසස් කිරීමට සහ ඊට අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පහසුකම් සැලසීම.	- විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන UGC අනුමත උපාධි වැඩසටහන් ලබා දීම සඳහා UGC පිළිගත් ආයතන පිහිටුවීම.
			උසස් අධ්‍යාපන ආයතනවලට යටිතල පහසුකම් සහ මානව සම්පත් සපයමින් සිසුන් ඇතුළත් කිරීම වැඩි කිරීම.	
			සමුද්‍ර සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට පුද්ගලික ආයතන ප්‍රතිනතය කිරීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			පෞද්ගලික ආයතනවලට ගුවන් සේවා ක්ෂේත්‍රයේ උපාධි පිරිනැමීමට ප්‍රතිඥනය කිරීමට සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීමට පහසුකම් සැලසීම.	
			ඩිප්ලෝමා පාඨමාලා ප්‍රදානය කිරීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතන 10ක් පිහිටුවීම.	
			හෙද විද්‍යාල උපාධි පිරිනැමීමේ මට්ටමට උසස් කිරීමට පහසුකම් සැලසීම.	
			ජනමාධ්‍ය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට පහසුකම් සැලසීම සහ අවශ්‍ය නම් පනත සංශෝධනය කිරීම.	
			උපදේශන කමිටුවක් හරහා විශ්වවිද්‍යාල ව්‍යාප්තති යෝජනාව පිළිබඳ අවසන් තීරණයක් ගැනීම.	
			අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බළකාය විසින් නිර්දේශ කරන පරිදි හෙද විද්‍යාල උපාධි පිරිනමන ආයතන දක්වා උසස් කිරීමට අදාළ ක්‍රියාකාරකම්.	
			අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කර ඇති පරිදි, ක්‍රීඩා අධ්‍යාපනය සඳහා කැප වූ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අදාළ ක්‍රියාකාරකම්.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		8. 2023 වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලාවලට බඳවා ගැනීමේදී 30% ක සමුච්චිත වර්ධන වේගයක් සඳහා පහසුකම් සැලසීම.	ශ්‍රම වෙලඳපොල නිරීක්ෂණයන් තුළින් ලැබෙන ප්‍රක්ෂේපන මත පදනම්ව, නැගී එන වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ නව පශ්චාත් උපාධි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.	- වසරකට අනුමත කරන නව සහ අදාළ පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව.
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 02:** 21 වන සියවසේ පුරවැසිභාවය සඳහා අවශ්‍ය සිසුන්ගේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම මඟින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවලට පහසුකම් සැපයීම.	1. අවශ්‍ය අරමුදල් වෙන් කිරීම තුළින් 2024 වන විට එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලවල විනෝදාත්මක හා සංස්කෘතික පහසුකම් සහ සෞන්දර්යාත්මක පරිසරය වැඩිදියුණු කිරීම.	UGC හි ප්‍රධාන රැස්වීම් කාමරයේ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පද්ධතිය නැවත සකස් කිරීම.	- එකතු කරන ලද / වැඩිදියුණු කළ විනෝදාත්මක / සංස්කෘතික පහසුකම් සහ / හෝ වඩා හොඳ සෞන්දර්යාත්මක පරිසරයක් සහිත රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව
			UGC පරිශ්‍රයේ නව දුරකතන පද්ධතියක් (PABX) සැපයීම සහ ස්ථාපනය කිරීම.	
			UGC හි LAN පද්ධතියේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.	
			විශ්වවිද්‍යාල 15 හි සම්පත් භාවිතය සහ පවතින සම්පත් පිළිබඳ සමීක්ෂණය.	
			රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම.	
			රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ ලැප්ටොප් පරිගණක සැපයීම.	
		2. විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ ඉගෙනුම් පරිසරය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම	ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය සහ සමාලෝචනය	- රාජ්‍ය උසස් අධ්‍යයන ආයතන සඳහා වාර්ෂික අයවැයේ ප්‍රතිශතය වැඩිවීම.
			යටිතල පහසුකම් අවශ්‍යතා සමාලෝචනය කර විශ්ලේෂණය කිරීම	
		3. සියලුම විශ්වවිද්‍යාල සිසුන් සඳහා සාධාරණ සම්පත් ප්‍රවේශයක් ලබාදීම සඳහා වන මූලික පියවර හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාලයන් හි සම්පත් භාවිතය සහ සම්පත් ලබා ගැනීම පිළිබඳ සමීක්ෂණය	- විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සම්පත් සැලැස්මේ ඉම් ලකුණු සලකුණු කිරීම.
			රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කිරීම	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		4. උසස් අධ්‍යාපන ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් කාලෝචිත අරමුදල් ගලායාම වැඩිදියුණු කිරීම.	වාර්ෂික අයවැය සඳහා අනුමැතිය UGC සඳහා මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීම	- වසරකට පවත්වනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව. - වසරකට උසස් අධ්‍යාපන ආයතන වෙත සිදු කරන ක්ෂේත්‍ර චාරිකා ගණන. - වසරක් තුළ භාණ්ඩාගාරය / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය / කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව - වසරක් තුළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විශ්වවිද්‍යාල මූල්‍යකරණය පිළිබඳ ප්‍රගති වාර්තා සංඛ්‍යාව
ගුණාත්මක අධ්‍යාපනය	**ඉලක්ක අංක 03:** ගෝලීය පරිසරයක් තුළ සිසුන්ට ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් වීමට හැකි වන පරිදි වැඩසටහන්, පර්යේෂණ සහ නව්‍යකරණයන් තුළින් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.	1. වැඩසටහන්වල අදාලත්වය සහතික කිරීම සහ වෙළඳපොළ ඉල්ලුමට ගැලපෙන පරිදි නව අධ්‍යයන පාඨමාලා සංවර්ධනය කිරීම සහ දැනට පවතින පාඨමාලාවල විෂයමාලාවන් සංශෝධනය කිරීම.	ශ්‍රම වෙළෙඳපොළ නිරීක්ෂණ අනුව දැනට පවතින අධ්‍යයන පාඨමාලා සංශෝධනය කිරීම. ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම මත පදනම්ව නව අධ්‍යයන පාඨමාලා සැලසුම් කිරීම සහ හඳුන්වා දීම. නව සහ පවතින උපාධි පාඨමාලා සඳහා වන යෝජනාවල ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාව.	- වෙළඳපොළ ඉල්ලුම් ප්‍රවණතා සපුරාලීමට අනුමත කරන ලද, නව වෙනස්කම් කරන ලද උපාධි පාඨමාලා ප්‍රතිශතය. - ඉල්ලුම වැඩි දියුණු කිරීම සහ වෙළඳපල අදාළත්වය සහතික කිරීම සඳහා දැනට පවතින සංශෝධනය කර ඇති අධ්‍යයන පාඨමාලා සංඛ්‍යාව.

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			නව උපාධි වැඩසටහන්, අධ්‍යයනාංශ සහ පීඨ අනුමත කිරීම සඳහා UGC හි මාර්ගගත ක්‍රමය අනුගමනය කිරීමට පහසුකම් සැලසීම.	
		2. උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	උපාධි පාඨමාලා බෙදාහැරීමේ ක්‍රමවලට අදාළ උසස් අධ්‍යාපන ආයතනයන් හි වර්තමාන තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පාර්ශ්වීය ප්‍රවේශ / ඉගෙනුම් අධ්‍යයන සම්භාර පැවරුම් ප්‍රතිපාදන අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා ගණන - වැඩි උපාධිධාරීන් සංඛ්‍යාවක් බිහි කිරීම - විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට සමාන අධ්‍යාපන අවස්ථා ලබා දීම.
			පාර්ශ්වීය ප්‍රවේශ (lateral entry) සහ පෙර ඉගෙනුම් අධ්‍යයන සම්භාර හුවමාරුව හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ.	
			උසස් අධ්‍යාපනයට ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උපාධි වැඩසටහන් බෙදා හැරීමේ ක්‍රම දෙක හඳුන්වා දීම.	
		3. උපාධි අපේක්ෂක සිසුන්ගේ පුද්ගලික සහ අවශ්‍ය කුසලතා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක (CGU) හරහා ව්‍යුහගත සැලසුම් ක්‍රියාත්මක කිරීම.	විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ ඒකකවල කාර්ය සාධනය බැලීමට ලකුණු කාඩ්පත් පද්ධතිය සකස් කිරීම.	- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලවල පීඨ වෘත්තීය මාර්ගෝපදේශ ඒකක හරහා උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලද පුද්ගලික හා මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන් ගණන. - විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක හි උපදේශකයින් / කාර්ය මණ්ඩලය සඳහා UGC විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සහ/හෝ වැඩමුළු ගණන. - වාර්ෂිකව ශිෂ්‍ය උපදේශකයින් / උපදේශකයින් ලෙස පත් කෙරෙන
			කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුහුණු අවස්ථා සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකක වෙත පුහුණුව ලබා දීම.	
			UTEL පරීක්ෂණ සේවාව ස්ථාපිත කිරීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
				අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - උපාධි අපේක්ෂකයන්හට ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා කර්මාන්තයෙන් ලැබෙන අදාළ අත්දැකීම් සමඟින් වැඩි අවස්ථාවන් ලබා දීම. - ඵලදායී ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා දියුණුවන තාක්ෂණයන් සමඟ අනුගත වීම. - ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) පවත්වන කුටි සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවීම. - සමස්ත විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක ශිෂ්‍ය ජනගහනයෙන් වසරකට UTEL පරීක්ෂණවලට පෙනී සිටින සිසුන්ගේ ප්‍රතිශතය.
		4. කියවීමේ පුරුද්දේ වැදගත්කම වැඩි දියුණු කිරීම සහ විශ්ව විද්‍යාල තුළ පවතින විද්‍යුත් පුස්තකාල පද්ධති සහ අනෙකුත් පහසුකම් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම.	විද්‍යුත් පුස්තකාලවලට අදාළව උසස් අධ්‍යාපන ආයතනයන් හි වත්මන් තත්ත්වය හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.	- පර්යේෂණ දත්ත සමුදායන්, රචනා සොරකම් (plagiarism) පිලිබඳ මෘදුකාංග සහ විද්‍යුත් පොත්වල ශිෂ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
			විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා රචනා හිමිකම සොරකම් විරෝධී මෘදුකාංග (Anti-plagiarism Software) සැපයීම.	
		5. කොමිෂන් සභා චක්‍රලේඛ 933 හි සඳහන් පරිදි ශිෂ්‍ය ආධාර සේවා ශක්තිමත් කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිසුන්ගේ	ශිෂ්‍ය සහාය පද්ධතිවල පවතින තත්ත්වය හඳුනාගෙන ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීම.	- ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 933 කොමිෂන් සභා චක්‍රලේඛය ක්‍රියාත්මක

තිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		ඉගෙනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම	තත්ත්ව ආරක්ෂණ කටයුතු සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.	කිරීම.
			විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව	- උසස් අධ්‍යාපන ඉගෙනුම් පරිසරය තුළ ආබාධිත සිසුන් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම
			පූර්ව විශ්වවිද්‍යාල මාර්ගගත / විද්‍යුත් ඉගෙනුම් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ වැඩසටහන	- පූර්ව විශ්වවිද්‍යාල සිසුන්ගේ ප්‍රමාණවත් ඉංග්‍රීසි මූලික කුසලතා (කියවීම/ ලිවීම/ සවන්දීම/කථා කිරීම) වැඩි දියුණු කිරීම
			ජාතික අසාත්මිකතා සහ ප්‍රතිශක්ති විද්‍යා ආයතනය පිහිටුවීම	- අසාත්මිකතා සහ ප්‍රතිශක්තිකරණ ක්ෂේත්‍ර වල විශේෂිත පුහුණුව සහ පර්යේෂණ සඳහා සමාජයේ අවශ්‍යතාවය සපුරාලීම.
			කෘතිම බුද්ධිය, දේශගුණික විපර්යාස, තිරසාර සංවර්ධනය සහ අනෙකුත් නැගී එන ගෝලීය ප්‍රමුඛතා පිළිබඳ නැගී එන ප්‍රවණතාවයට අනුකූලව සුදුසු උපාධි වැඩසටහන් හඳුන්වා දීම.	- කෘතිම බුද්ධිය, දේශගුණික විපර්යාස, තිරසාර සංවර්ධනය සහ අනෙකුත් නැගී එන ගෝලීය වෙනස්කම් පිළිබඳ දැනුම සියලුම සිසුන්ට ලබා දීම.
		6. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ක්‍රියාත්මක කිරීම තුළින් ඵලදායි විශ්වවිද්‍යාල-කාර්මික හවුල්කාරිත්වයක් ඇති කිරීම, ගෝලීය සහ ජාතික අවශ්‍යතා ඇති ක්ෂේත්‍රවල පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් හා සිසුන් සවිබල ගැන්වීම.	උපාධිධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා තිරසාර ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට සහ කුසලතා නොගැලපීම අඩු කිරීමට දායක වීමට UGC හි ස්ථාවර කමිටු වෙත පුද්ගලික අංශයේ නියෝජිතයන් ඇතුළත් කිරීම.	- පර්යේෂණ සහ නවෝත්පාදනයන් සඳහා පහසුකම් සැලසීමට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පිහිටුවා ඇති ක්‍රියාකාරී විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා ඒකක සංඛ්‍යාව
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටි ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.	- රාජ්‍ය/පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එක්ව සංවිධානය කරන ලද විශ්වවිද්‍යාල

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
			පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට විද්වතුන්ට ආරාධනා කිරීම.	ප්‍රතිපාදන කොමිෂන් සභාව පහසුකම් සපයන මහජන දැනුවත් කිරීමේ සැසි සංඛ්‍යාව
			පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රදාන ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසිද්ධ විදේශීය විශ්වවිද්‍යාල හඳුනා ගැනීම.	
			තරුණ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීමට අවස්ථා ලබා දීම සහ දිරිගැන්වීම.	
			කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදනවලින් විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සඳහා පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.	
		7. රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් සපයනු ලබන උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය ඉහළ නැංවීම.	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට/ සිසුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.	- 2024 වන විට විශ්වවිද්‍යාල සේවාවන්හි අභ්‍යන්තර පාර්ශවකරුවන්ගේ තක්සේරුවේදී අවම වශයෙන් 80% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම. - 2024 වන විට විශ්වවිද්‍යාල ප්‍රතිදානයේ බාහිර පාර්ශ්වකරුවන්ගේ තක්සේරුවෙහි අවම වශයෙන් 75% තෘප්තිමත් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම.
			විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා හරහා උසස් අධ්‍යාපන ආයතන සමඟ සබඳතා ඇති කර ගැනීමට බාහිර පාර්ශ්වකරුවන්ට අවස්ථා ලබා දීම.	
		8. UGC යටතේ පවතින උසස් අධ්‍යාපන	විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම.	- කාර්ය සාධන ලකුණු කාඩ්පත සඳහා

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		ආයතන සහ ඔවුන් විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් ගෝලීයව සහ දේශීයව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල බව අඛණ්ඩව පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ සංවර්ධනය තුළින් සහතික කිරීම.	පවතින විෂය ඉම් ලකුණු ප්‍රකාශ යාවත්කාලීන කිරීම සහ අදාළ අවස්ථාවලදී නව ප්‍රකාශයන් සංවර්ධනය කිරීම.	75%කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගත් UGC යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක (IQAU) ප්‍රතිශතය.
			ආයතනික සමාලෝචන පැවැත්වීම.	- වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි ආයතනික සමාලෝචන වාර්තා ගණන.
			වැඩසටහන් සමාලෝචන පැවැත්වීම.	
			ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) අනුව දැනට පවතින සියලුම අධ්‍යයන පාඨමාලා සංශෝධනය කර නැවත නම් කිරීම සහ ඒ අනුව අත්පොත යාවත්කාලීන කිරීම.	- වර්ෂය තුළ නිකුත් කරන ලද උසස් අධ්‍යාපන ආයතනයන් හි වැඩසටහන් සමාලෝචන වාර්තා ගණන.
			SLQF 2015 අනුව විශ්වවිද්‍යාල සුදුසුකම් සිතියම්ගත කිරීමේදී විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			මනා ලෙස පාලනය කරන ලද සමකාලික අධ්‍යයන දින දර්ශනයක් පවත්වා ගැනීමට විශ්වවිද්‍යාලවලට සහාය වීම.	
			උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ජාතික අධ්‍යයන සමුළුවක් ආරම්භ කිරීම.	
			UGC යටතේ සුදුසුකම් නහවුරු කිරීම සඳහා ජාතික පිළිගැනීම් සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.	
			සාගර විශ්වවිද්‍යාලය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර ප්‍රමිතියට ඉහල නැංවීමට සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.	

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
ගුණාත්මක අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානතාව	**ඉලක්ක අංක 04:** කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතු මානව සම්පත්, විශිෂ්ට පහසුකම් සහ තිරසාර / හරිත සංකල්ප වලින් සමන්විත වැඩිදියුණු කළ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සහතික කිරීම.	1. ඉදිරි වසර 5 තුළ විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සෑම තරාතිරමකම හැකි උපරිම දක්ෂතා ඇති විවිධ ශ්‍රම බලකායන් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම සහතික කිරීම.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි මානව ප්‍රාග්ධනයේ නිපුණතා සහ විශේෂඥතාව වර්ධනය කිරීම. කාර්ය මණ්ඩල කාණ්ඩ බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සංශෝධනය කිරීම. පවතින පශ්චාත් උපාධි පර්යේෂණ යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමට අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ආරාධනා කිරීම.	- සුදුසුකම් තහවුරු කිරීමේ පළමු උත්සාහයේදීම සේවයේ ස්ථිර කරන ලද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය
		2. පුහුණුව හා සංවර්ධනය තුළින් දැනට සිටින විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය තුළ ඇති විභව දක්ෂතා හඳුනාගැනීමට හා ඒවා පෝෂණය කිරීම සඳහා ක්‍රියා කිරීම ආරම්භ කිරීම.	පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට පරිපාලන නිලධාරීන්ට පහසුකම් සැලසීම.	- දේශීය රැකියා ආශ්‍රිත පුහුණුව සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය - විදේශ රැකියා ආශ්‍රිත පුහුණුවක් සහිත පරිපාලන නිලධාරීන්ගේ සංචිත ප්‍රතිශතය. - UGC හරහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පරිපාලන කාර්ය මණ්ඩලයට UGC හරහා ලබා දෙන ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව ප්‍රතිශතය. - පශ්චාත් උපාධි සහ/හෝ වෘත්තීය සුදුසුකම් ඇති පරිපාලන නිලධාරීන්ගේ ප්‍රතිශතය.

කිරසාර සංවර්ධන ඉලක්ක	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉලක්ක	පරමාර්ථය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශක
		3. අඩු කාර්ය සාධනයක් සහිත කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව වැඩි කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාකාරී ලෙස වැඩිදියුණු කිරීම.	විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තරාතිරමකම සේවක සුභසාධනය ක්‍රියාශීලීව ඉහළ නැංවීමට සහ ඌන කාර්ය සාධන කාර්ය මණ්ඩලය අඩු කිරීමට පද්ධතිය සමාලෝචනය කිරීම.	- ආචර්තිතා කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්වල මුළු ලකුණු 5 ක් වූ මිනුමෙන්, අවම වශයෙන් ලකුණු 3ක් ලබා ගන්නා කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය. - සේවක සුභසාධනය සහ තෘප්තිය පිළිබඳ සමීක්ෂණයකදී > 75% ක ලකුණු ලබා ගන්නා විශ්වවිද්‍යාල සංඛ්‍යාව. - UGC හි නීති අංශය විසින් මෙහෙයවනු ලබන සේවකයන් සම්බන්ධ නීති/උසාවි නඩු ගණන.
